රණවිරු සේවා අධිකාරිය

ரணவிரு சேவா அதிகாரபை

Ranaviru Seva Authority

2024

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

වාර්ෂික වාර්තාව

2024



රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක අමාත්‍යාංශය

රණවිරු සේවා අධිකාරිය

මව්බිමේ ඒකීයභාවය සඳහා කැපවුණු රණවිරු ප්‍රජාව වෙනුවෙන් අවශ්‍ය මැදිහත්වීම සිදුකර ඔවුන්ගේ අවශ්‍යතා කළමණාකරණය කිරීමේ වගකීම භිමිව ඇත්තේ රණවිරු සේවා අධිකාරියට වේ. 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපිත කරන ලද රණවිරු සේවා අධිකාරිය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. කළමණාකරන මණ්ඩලයකින් සමන්විතව පත් කරන ලද සභාපති, උප සභාපති හා අධ්‍යක්ෂක තනතුර ඇතුළු ස්ථිර කාර්ය මණ්ඩලයකින් හා ත්‍රිවිධ හමුදා අනුයුක්ත කාර්ය මණ්ඩලයක් මඟින් මෙහි සේවා ක්‍රියාත්මක කරනු ලැබේ. ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ ළඟම ඥාතීන් රණවිරු සේවා අධිකාරී පනත යටතේ ප්‍රතිලාභ ලබාගන්නා පාර්ශවයන් වේ.

ක්‍රියාන්විතයේ දී ජීවිත පූජා කළ රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන් හා රණාක්ෂිතයට පත් රණවිරුවන් ඇතුළු ඔවුන්ගේ ළඟම ඥාතීන් උදෙසා සුභසාධන සේවා සලසන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වශයෙන් රණවිරු සේවා අධිකාරිය වසර 24 ක් පුරා විශාල කාර්යයක් ඉටු කර ඇත. දීප ව්‍යාප්ත රණවිරු සංසද ජාලය මඟින් රණවිරු ප්‍රජාව ඒකරාශී කර ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර දීම හා ඔවුන් රැකබලා ගැනීමෙහි ලා රණවිරු සේවා අධිකාරිය විශිෂ්ට සේවාවක් සපයයි.

රණවිරු සේවා අධිකාරිය පනත මඟින් පවරා දී ඇති කාර්ය භාරය මැනවින් හඳුනා ගනිමින් රණවිරු සුභසාධනය උදෙසා ව්‍යාපෘති හා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරයි. ප්‍රජාව වෙනුවෙන් වෛද්‍ය පහසුකම් සැපයීම, රණවිරු දරුවන්ගේ අධ්‍යාපනයට සහය වීම, නිවාස සැපයීම හා එහි ලා සහය වීම, ඵලදායී සේවා නියුක්තිකයක් සුරක්ෂිත කිරීමෙහි ලා සහය වීම සහ රණවිරුවන්ගේ පසු උවටැන් හා පුනරුත්ථාපන කාර්යයන් උදෙසා මෙම ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක වේ.

රණවිරු සේවා අධිකාරිය මූල්‍යනය වන්නේ මධ්‍යම රජයේ අරමුදල් හා පරිත්‍යාගවලින් වන අතර, ප්‍රධාන මූල්‍යන මූලාශ්‍රයක් ලෙස ජාතික ලොතරැයි මණ්ඩල අරමුදල් පෙන්වාදිය හැක. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි ලා භාණ්ඩාගාර ප්‍රතිපාදන හා ආයතනික අරමුදල් තැන්පත්කර ලැබෙන පොලී ආදායම මඟින් ප්‍රතිපාදන ලබාගන්නා අතර, 2024 වර්ෂය තුළ බොහෝ ව්‍යාපෘති සඳහා උපයෝගි කර ගන්නා ලද්දේ ආයතනික තැන්පත් ආදායම් හා පරිත්‍යාගශීලී ආධාර වේ.

රණවිරු ප්‍රජාවෙහි පුනරුත්ථාපන කාර්යය ඉටුකිරීමේ වගකීම සෘජුවම රණවිරු සේවා අධිකාරියට පනතින් පවරා ඇති බැවින් පසුඋවටැන හා පුනරුත්ථාපන ක්‍රියාවලිය සඳහා විශේෂිත අවධානයක් යොමු කළ යුතුව ඇත. ආබාධිත තත්වයටපත් රණවිරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය දිනෙන් දින පිරිහීමක් වන අතර වයෝවෘධතාවය හේතුවෙන් ආබාධිත තත්ත්වයේ නොයෙක් සංකූලතා මතුවීම යන කරුණ නිසා රණවිරු සේවා අධිකාරිය රණවිරුවන් පුනරුජ්ථාපනය කිරීමේ වගකීම සඳහා සෘජුවම මුහුණ දිය යුතුව ඇත.

යුද ව්‍යවසනය නිමා වී වසර ගණනක් ගත වුවද වීරෝදාර රණවිරුවන් කළ කැපවීම ශ්‍රී ලාංකිකයන් වශයෙන් අය අමතක කළ යුතු නොවේ. රණවිරු නාමයට කෘතගුණ දැක්වීම තම දැක්ම කර ගනිමින් රණවිරු ප්‍රජාව වෙනුවෙන් ගෞරවාන්විත සේවාවන් සපයන රණවිරු සේවා අධිකාරිය වෘත්තීයමය මෙන් ම විධිමත් ආයතනයක් වශයෙන් තවත් වසර ගණනාවක් රණවිරු නාමය වෙනුවෙන් සේවය සැලසීමට අපේක්ෂා කරනු ලබයි.

1999 අංක 54 දරන පනත යටතේ රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

දැක්ම

“රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම”

මෙහෙවර

“ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සුරක්ෂිත කරනු පිණිස
ජීවිත පුද කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත වූ
රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල
සාමාජිකයන්ගේ මානසික හා සාමාජයීය
ස්ථාවරභාවයක් ඇති කිරීම මෙන් ම සේවයේ
නියුතු රණවිරුවන් සහ එම පවුල්වල මානසික
ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම. ”

රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන්ගේ පණිවුඩය



අනාගත පරපුරට නිදහස් නිවහල් සාමකාමී රටක් උරුම කර දීම සඳහා ජීවිත පරිත්‍යාග සිදු කළ විරෝධාර රණවිරුවන්ගේ ගෞරවය සුරක්ෂිත කිරීම, රණවිරුවන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ මෙන්ම සටනේදී ශරීරාංග පරිත්‍යාග කළ විරෝධාර රණවිරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීම අප සැමගේ පරම වගකීමක් හා යුතුකමක් වේ. ජාතියක් ලෙස 2000 වර්ෂයේ සිට මේ දක්වා රණවිරු සේවා අධිකාරිය විසින් ඒ සඳහා කැපවූ රජයේ ප්‍රමුඛතම ආයතනය ලෙස වගකීම් ඉටු කරමින් ඇත. දශක තුනකට ආසන්න කාලයක් රට තුළ පැවති යුධමය තත්ත්වය හේතු කොටගෙන ආබාධිත තත්ත්වයට පත් ත්‍රිවිධ හමුදා සහ පොලිසියේ රණවිරුවන්, ජීවිත පරිත්‍යාග කළ රණවිරුවන්ගේ යැපෙන්නන් පුනරුත්ථාපනය කොට රැකබලා ගැනීම හා ඔවුන්ගේ සුභ සාධන කටයුතු පවත්වාගෙන යාම තුලින් හා ඔවුන්ගේ සැගවුනු හැකියාවන් ඔප්නැංවීම තුලින් ගෞරවණීය පුරවැසියන් ලෙස සමාජගත කිරීම ඉටුකරලනු ලබන ව්‍යවස්ථාපිත ආයතන ලෙස 1999 අංක 54 දරන රණවිරු සේවා අධිකාරී පනතින් බලාත්මකව 2000 වර්ෂයේදී "රණවිරු සේවා අධිකාරිය" ස්ථාපිත කර ඇත. ආයතනය ආරම්භයේ සිට රණවිරු ප්‍රජාවගේ මනෝ සාමාජීය සුභසාධනය උදෙසා විශාල කාර්යභාරයක් ඉටුකොට ඇත.

කෝවිඩ් වසංගත තත්වයත්, ඊට පසුව රට තුළ ඇතිවූ ආර්ථික අර්බුදකාරී තත්ත්වයත් හේතු කොටගෙන දිවයින පුරා විසිරි පදිංචිව සිටින රණවිරු ප්‍රජාව වෙනුවෙන් ක්ෂේත්‍ර මට්ටමින් ආයතනය පවත්වාගෙන ආ වැඩසටහන් සීමාවීමක් වර්ෂ 2020 -2023 කාලය තුල නිරීක්ෂණය කල හැකිය. එම ගතික පාරිසරික තත්ත්වය රණවිරු ප්‍රජාව හා රණවිරු සේවා අධිකාරිය අතර පැවැති සබඳතාවයන් යම් මට්ටමකින් බිඳ වැටීමද හේතුවී ඇත.

2024 වර්ෂය අවසන් වන විට රණවිරු ප්‍රජාව සමඟ පැවති සබඳතාවයන් නැවත පෙර පැවති තත්වයට පත් කරගැනීමට රණවිරු සේවා අධිකාරියට හැකියාව ලැබීම ආයතනය ලබාගන්නා ලද ජයග්‍රහණයකි. එහිදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත් සංචරණ අපහසුතා සහිත රණවිරුවන් 50 දෙනෙකුට විද්‍යුත් ආරෝපිත යතුරු පැදි ලබාදීමට ආයතනය කටයුතු කර තිබීම විශේෂ කොට දැක්විය හැකිය. මීට අමතරව රණවිරු සේවා අධිකාරිය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් රණවිරු ප්‍රජාව වෙත සුවිශේෂී සේවාවක් ඉටු කිරීමට කටයුතු කොට ඇත. ඒ යටතේ නව තාක්ෂණය භාවිතා කරමින් රණවිරු සබඳතා කළමනාකරණ තොරතුරු පද්ධතිය (VRM) මෑතකදී හඳුන්වාදෙන ලදී.

මෙකී වගකීම් ඉටු කිරීමේදී මෙතෙක් රණවිරු සේවා අධිකාරියේ වගකීම් දැරූ සභාපතිවරුන් කළමනාකරණ මණ්ඩල සාමාජික සාමාජිකාවන් සහ සියළු කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන්ද ඉටු කරනු ලැබූ සේවය අගයකල යුතු වන්නේය ,නාස්තිය දූෂණය සහ අවභාවිතාවන් පිටුදකිමින් කළමනාකරණය සහ අරපිරිමැස්ම තුල සේවාලාභී සෑම රණවිරුවෙකුටම සහ රණවිරු ළඟම ඥාතීන් වෙත රණවිරු නාමය සමාජයේ පිළිගැනීමට ලක්වන ධනාත්මක හා කඩිනම් සේවාවන් ලබා දෙමින් හා රණවිරු හැකියාවන්ට නිසි තැන ලබා දෙමින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කරමින් දේශීය ආර්ථිකයේ කොටස්කරුවන් ලෙස රණවිරුවන් බලාත්මක කරමින් ඉදිරි ගමනක යෙදීම රණවිරු සේවා අධිකාරියෙහි ඉදිරි බලාපොරොත්තුව වේ.

බ්‍රිගේඩියර් එස්.බී. කොහොන
සභාපති
රණවිරු සේවා අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩලය

බ්‍රිගේඩියර් එස්බී කොහොන (විශ්‍රාමික)	සභාපති, රණවිරු සේවා අධිකාරිය
එයාර් වයිස් මාර්ෂල් කේජීඩිඑන් ජයසිංහ	උප සභාපති, රණවිරු සේවා අධිකාරිය
ජයන්ත එදිරිසිංහ මහතා	අතිරේක ලේකම් (ආරක්ෂක සේවා) ආරක්ෂක අමාත්‍යාංශය
ආර් කොළඹගේ මහත්මිය	ප්‍රධාන මුල්‍ය නිලධාරිනි, මුදල්මසම්පාදන සහ ක්‍ර, ආර්ථික සංවර්ධනඅමාත්‍යාංශය
මේජර් ජෙනරල් ඩබ්ලිඑඩීඩබ් නානායක්කාර	මාණ්ඩලික ප්‍රධානි, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
රියර් අද්මිරාල් බීඒකේඑස්පී බානගොඩ	මාණ්ඩලික ප්‍රධානි, ශ්‍රී ලංකා නාවික හමුදාව
එයාර් වයිස් මාර්ෂල් ආර්එස් වික්‍රමරත්න	මාණ්ඩලික ප්‍රධානි,ශ්‍රී ලංකා ගුවන් හමුදාව
ඩබ්.ජේ.පද්මිණි මහත්මිය	සුභසාධන හා වෛද්‍ය සේවා දිසාව, ශ්‍රී ලංකා පොලීසිය
කොමදෝරු එච්.ඩී. ගමගේ (විශ්‍රාමික)	කළමණාකරන මණ්ඩල සාමාජික
වෛද්‍ය ප්‍රියංගනී නිරෝෂා අමරබන්දු මහත්මිය	කළමණාකරන මණ්ඩල සාමාජික
අසේල ඉද්දවෙල මහතා	කළමණාකරන මණ්ඩල සාමාජික

පටුන

1. ව්‍යාපෘති අංශය

1.1. රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා ආබාධිත සහායක උපකරණ ලබා දීමේ ව්‍යාපෘතිය

1.1.1. ව්‍යාපෘතිය හැඳින්වීම

1.1.2. 2024 වසර තුළ කාර්ය සාධනය

1.1.3. ආබාධිත සහායක උපකරණ ලබා දීම.

1.1.3.1. රෝද පුටු ලබාදීම

1.1.3.2. අත්වාරු ලබාදීම

1.1.3.3. කිහිලිකරු ලබාදීම

1.1.3.4. බස්තම් ලබාදීම

1.1.3.5. කොමඩ් පුටු

1.1.3.6. විද්‍යුත් ආරෝපිත යතුරුපැදි

1.1.3.7. වායු මෙට්ට

1.1.3.8. ඇස් කණ්ණාඩි ලබාදීම

1.2. වෛද්‍ය ආධාර ලබාදීම

1.2.1. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

1.3. වෛද්‍ය ණය ව්‍යාපෘතිය

1.3.1. වෛද්‍ය ණය ලබාදීම

1.4. හදිසි ආපදා ආධාර

1.4.1. ව්‍යාපෘතිය හැඳින්වීම

1.4.2. ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

1.4.3. 2024 වසර තුළ කාර්යය සාධනය

1.4.4. හදිසි ආපදා ආධාර ලබා දීම (ස්වභාවික ආපදා) – 2024

1.4.5. හදිසි ආපදා ආධාර ලබා දීම (මියගිය රණවිරුවන් සදහා) – 2024

1.5. ජාතික රණවිරු අනුස්මරණ දිනය

1.5.1. ව්‍යාපෘතිය හැඳින්වීම

1.5.2. 2024 වසර තුළ කාර්යය සාධනය

1.5.3. රණවිරු කොඩි බෙදා හැරීම -2024

1.5.4. රණවිරු කොඩි ආදායම - 2024

1.6. රණවිරු දිරිය ණය

1.6.1. ව්‍යාපෘතිය හැඳින්වීම

1.6.2. ව්‍යාපෘතිය හැඳින්වීම

1.6.3. 2024දිස්ත්‍රික්කක අනුව දිරිය ණය ලබා දීම

1.7. රණවිරු ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

1.8. ප්‍රාදේශීය රණවිරු ස්මාරක නඩත්තුව හා පවත්වාගෙන යෑම

1.9. මයිලපිටිය රණවිරු අනුස්මරණ ස්මාරකය සහ උද්‍යානය නඩත්තුව හා සංවර්ධනය

1.10. ක්‍රීඩා ව්‍යාපෘතිය

1.10.1. ව්‍යාපෘතිය හැඳින්වීම

1.10.2. වසර තුළ කාර්යය සාධනය 2024

1.10.3. 2024වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

1.10.3.1. තරගාවළි වෙත යොමු කරවීම.

1.10.3.2. ක්‍රීඩකයන්ට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම

1.10.3.3. ශක්තිජනක පාන වර්ග සහ පෝෂණ අතිරේක ලබා දීම
1.10.3.4. රණවිරු දු දරුවන් වෙත අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම.
1.10.3.5. රණවිරු සංසද සාමාජිකයින් වෙනුවෙන් තරගාවළි සංවිධානය කිරීම.
1.10.3.6. වෙනත්
1.10.4. 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්
1.11. ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය
1.11.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.11.2. වසර තුළ කාර්යය සාධනය 2024
1.11.3. දිස්ත්‍රික් වශයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
1.11.4. 2024වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන් පිලිබඳ සංක්ෂිප්ත විස්තරය
1.11.4.1. කාබනික පොහොර භාවිතයපැළ බෙදා දීම සහ /උපකරණ ,ගෙවතු වගාව , සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම
1.11.4.2. කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව, උපකරණපැළ බෙදා දීම සහ / සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම
1.11.4.3. කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව, උපකරණපැළ බෙදා දීම සහ / .සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම
1.11.4.4. කෘෂි මෙවලම් කට්ටලය බැගින් බෙදා දීම
1.11.4.5. කාබනික ගෙවතු වගාව සහ බහුවාර්ෂික භෝග වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන සහ නයි මිරිස් පැළ බෙදා දීම
1.11.4.6. පැළ තවාන් පාලනය සහ බද්ධ කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන
1.11.4.7. කාබනික ගෙවතු වගාව සහ බහුවාර්ෂික භෝග වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන
1.11.4.8. වයඹ පළාත් රණක්ෂිතයට පත් රණවිරුවන් වෙත TJC අඹ පැල බෙදා දීමේ වැඩසටහන
1.12. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය
1.12.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.12.2. වර්ෂය තුල කාර්ය සාධනය 2024
1.12.3. ගෙවීම ධාරවර්ෂයේදී ශිෂ්‍යා 2024
1.12.4. ශිෂ්‍යාධාර ලබා දීම 2024 -
1.12.5. ව්‍යාපෘතිය යටතේ ඇති මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය
1.13. මා පිය රැකවරණ ව්‍යාපෘතිය
1.13.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.13.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය
1.13.3. වසර තුළ කාර්යය සාධනය
1.13.4. තිලාඟින් ගණනවසර සඳහා මුදල් ගෙවූ ප්‍ර 2024
1.13.5. වසර සඳහා බැර වූ මුදල 2024
1.14. ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය
1.14.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.14.2. ව්‍යාපෘතිය මගින් ලබා දෙනු ලබන ශිෂ්‍යාධාර
1.14.2.1. 6 – ධාරවසර දක්වා ශිෂ්‍යා 11
1.14.3. දිස්ත්‍රික්ක හා පළාත් අනුව ත්ව බෙදී යාමණිය දක්වා ශිෂ්‍යශ්‍රේ 11-6
1.14.3.1. අපොස උසස් පෙළ ශිෂ්‍යාධාර
1.14.4. දිස්ත්‍රික්ක හා පළාත් අනුව අපොස උසස් පෙළ ශිෂ්‍යත්ව බෙදී යාම
1.14.4.1. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

1.14.5. දිස්ත්‍රික්ක හා පළාත් අනුව උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර බෙදී යාම
1.15. කුසලතා ප්‍රවර්ධන ණය
1.15.1. දිස්ත්‍රික්ක හා පළාත් අනුව කුසලතා ප්‍රවර්ධන ණය බෙදී යාම
1.15.2. පෘතියේ කාර්යසාධනයවසර තුල ව්‍යා 2024
1.16. ඉඩම් අංශය
1.16.1. හැඳින්වීම
1.16.2. ඉඩම් ලබා දීම
1.16.2.1. අධිකාරිය වෙත සෘජුවම පරිත්‍යාග කර ඇති ඉඩම් තාවකාලික බලපත්‍රයක් හා ඔප්පුවක් මඟින් රණවිරුවන් වෙත ලබාදීම.
1.16.2.1.1. බලංගොඩ ඉඩම්ලාභී රණවිරු මව වෙත තෑගි ඔප්පු පිරිනැමීම
1.16.2.2. රණවිරුවන් වෙත වෙන්කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලමහවැලි , ව මැදිහත් ලේඛයට අනුචක්‍ර 01/2024 අධිකාරිය සතු රජයේ ඉඩම් ලබා දීම සඳහා .වීම
1.16.2.3. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් රණවිරුවන් වෙත ලබා දීම සඳහා මැදිහත් වීම.
1.16.2.4. රණවිරුවන් විසින් හඳුනා ගන්නා ලද ඉඩම් ලබා ගැනීම සඳහා අප අධිකාරියේ මැදිහත් වීම මත ඉඩම අයත් ආයතනය සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය නිර්දේශය ලබා දීම.
1.16.2.5. ඔප්පුලබා දීමට අදාළ නිර්දේ බලපත්‍ර/ශ ලබා දීම
1.16.2.6. රණවිරුවන් පදිංචි ඉඩම්වල පවතින ඉඩම් ගැටළුඉඩම් ආරවුල් විසඳීම සඳහා , අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය සහය වීම.
1.16.3. වසර තුළ කාර්යසාධනය
1.16.3.1. හඳුනාගත් ඉඩම් සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ඉඩම් නොමැති රණවිරුවන්ගේ නාම ලේඛන යොමු කිරීම
1.16.3.2. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් පවත්වන ලද ඉඩම් කව්චේරි සඳහා සම්බන්ධ වීම.
1.16.4. අංශයට අදාල ප්‍රගතිය
1.17. “විරු සහන” නිවාස ණය ව්‍යාපෘතිය
1.17.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.17.2. වසර තුල කාර්යය සාධනය 2024
1.17.3. විරු සහන නිවාස ණය ලබා දීමක්ක අනුවදිස්ත්‍රි) 2024-)
1.17.4. ආබාධිත රණවිරුවන් සහ දිවිපිදූ රණවිරු ළඟම ඥාතීන් වෙත විරු සහන නිවාස ණය ලබා දී ඇති ආකාරය
1.17.5. සේවාවන් අනුව විරු සහන නිවාස ණය ලබාදීම 202-4
1.18. සනීපාරක්ෂක ආධාර ව්‍යාපෘතිය
1.18.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.18.2. වසර තුල කාර්යය සාධනය 2024
1.18.3. සේවාවන් අනුව සනීපාරක්ෂක ආධාර ලබාදීම -2024
1.19. විරුසර කාඩ්පත
1.19.1. ව්‍යාපෘතිය හැඳින්වීම
1.19.1.1. පළමු අදියර
1.19.1.2. දෙවන අදියර
1.19.2. ADL ආයතනය මඟින් මාණය සහ ණය කර ඇති කාඩ්පත් ප්‍රවර්ෂයේදී මුද්‍ර 2024 මාණයගෙවා ඇති මුදල් ප්‍ර
1.20. මාපිය සුරැකුම වැඩ සටහන
1.20.1. හැඳින්වීම

1.20.2.2025 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා විස්තර වාර්ථාව
2. පුනරුත්තාපන හා සුබසාධන අංශය
2.1. අංශය හැඳින්වීම
2.2. සංසද මගින් ක්‍රියාත්මක වැඩසටහන් වර්ග
2.2.1. වෛද්‍ය වැඩසටහන්
2.2.2. ක්‍රීඩා වැඩසටහන්
2.2.3. ආගමික වැඩසටහන්
2.2.4. මනෝ සමාජයීය වැඩසටහන්
2.2.5. වෙනත් ආයතන සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලබන වැඩසටහන්
2.3. සංසද වාර ,ජංගම සේවාතිලාභ ලබාදීම නිරීක්ෂණ හා ඉල්ලුම්පත් නිකුත්කිරීම හා ප්‍රක්ෂේත්‍ර ,
2.4. වර්ෂයේ සංසද සහභාගීත්වයෙන් පැවැත් වූ වැඩසටහන් 2024ප්‍රමාණය
2.5. රණවිරු ප්‍රජා සංවර්ධන (ජංගම සේවා)
2.5.1. වසර තුළ කාර්යය සාධනය 2024
3. පාලන අංශය
3.1. මානව සම්පත් අංශය
3.1.1. අංශය හැඳින්වීම
3.1.2. මානව සම්පත් සංවර්ධන ක්‍රමවේදය
3.1.2.1. කණ්ඩායම් පුහුණු ටහන් පැවැත්වීමවැඩස (ආයතනය තුළ)
3.1.2.2. පුහුණු වැඩසටහන් සඳහා පිටත ආයතනවලට යොමු කිරීම
3.2. තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය අංශය
3.2.1. හැඳින්වීම
3.2.2. කාර්යයභාරයන්
3.2.2.1. සුභසාධන කලමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරිම.
3.2.2.2. වෙබ් අඩවිය හා මුහුණු පොත නිර්මාණය කිරිම හා යාවත්කාලීන කිරිම.
3.2.2.3. ආයතනයේ අවශ්‍යතාව පරිදි සුදුසු මෘදුකාංග හඳුන්වාදීම හා නිර්මාණය කිරිම
3.2.2.4. ආයතනයේ තොරතුරු තාක්ෂණයට අදාල ආයතන සම්බන්ධීකරණය සිදු කිරිම
3.2.2.5. ආයතනයේ පරිගණක අළුත්වැඩියා කටයුතු සිදු කිරිම හා අධීක්ෂණය කිරිම
3.2.2.6. රණවිරු සේවා අධිකාරියේ ජාලකරණ පද්ධතිය පවත්වාගෙන යාම
3.2.2.7. ආයතනික කාර්යක්ෂමතාවය හා පිරිවැය අඩුකිරිම සඳහා නවෝත්පාදන තොරතුරු තාක්ෂණ පද්ධති හා ගූගල් පෝරමයන්)Google From(/ පැතුරුම්පත්)Spreadsheet(නිර්මාණය කිරිම .
3.2.2.8. ආයතනයේ මුද්‍රණ කාර්යයන්ට අදාල නිර්මාණ කටයුතු සිදු කිරිම.
3.2.2.9. ආයතනයේ නිළධාරින් සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුවත් කිරීම් සිදු කිරීම .
3.2.2.10. ආයතනයේ ප්‍රධාන විද්‍යුත් තැපෑල පරීක්ෂා කිරිම හා බෙදා හැරීම.
3.2.2.11. Veteran Relationship Management System (VRMS) පවත්වාගෙන යාම .
3.2.2.12. Welfare Management Information System (WIMS) ජංගම දුරකථන යෙදවුම සැකසීම .
3.3. සැලසුම් අංශය
4. සැපයුම් කාර්යය හා ප්‍රසම්පාදන අංශය
4.1. වර්ෂය තුල සිදුකරන ලද මිලදිගැනීම් 2024

5. ගිණුම් අංශය
6. හමුදා සම්බන්ධීකරණ අංශය
6.1. හැඳින්වීම
6.2. - කාර්යය සාධනය **20242024** වර්ෂය තුලදී හමුදා සම්බන්ධීකාරක අංශය වෙතින් ලිපි ඉදිරිපත් කර ඇති විස්තරය
7. අභ්‍යන්තර විගණන අංශය
7.1. ගතියවර්ෂය තුළ අත්පත්කරගත් ප්‍ර **2024**
8. සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රය
8.1. හැඳින්වීම
8.2. 2024 වර්ෂයේදි ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර

1. ව්‍යාපෘති අංශය

1.1. රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා ආබාධිත සහායක උපකරණ ලබා දීමේ ව්‍යාපෘතිය

1.1.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටිය දී රණක්ෂිතයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් පුනරුත්ථාපනය සහ පසුඋවටැන් කිරීම රණවිරු සේවා අධිකාරියේ ප්‍රමුඛතම කාර්යභාරයකි. ක්‍රියාන්විතයේ දී රණක්ෂිතයටපත් රණවිරුවන් කායික පුනරුත්තාපන ක්‍රියාවලියේදී සහයක උපකරණ භාවිතා කරනු ලබයි. එය ආබාධිත තත්වය මග හරවා ගැනීමට ඉවහල් වේ. මෙම ව්‍යාපෘතිය මඟින් රණක්ෂිතයටපත් රණවිරුවා කායිකව සහ මානසිකව සවිබල ගැන්වීමක් සෘජුවම සිදු කරනු ලබන අතර රණවිරු පවුල් සාමාජිකයන් සඳහා ද ධනාත්මක බලපෑමක් වක්‍රාකාරයෙන් සිදු කරනු ලබයි. භාවිතා කරනු ලබන උපකරණ තාක්ෂණික වශයෙන් ඉහළ ගුණාත්මක තත්ත්වයක පැවතීම රණවිරුවාගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමක පවත්වා ගැනීමට උපකාරී වේ.

කෘතීම පාද, කෘත්‍රීම අත්, රෝද පුටු, අත්වාරු, කිහිළිකරු, උපැස්, සායනික සපත්තු, ශ්‍රවණ උපකරණ, සුදු සැරයටි, බස්තම්, කොමඩ් පුටු, රෝහෝ කුෂන්, වායු මෙට්ට, ජෙල් මේස්, ජෙල් ලයිනර්, විද්‍යුත් ආරෝපිත යතුරු පැදි සහ වෙනත් සහායක උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබයි.

නිවෙස්ගත කර ඇති රණක්ෂිතයටපත් රණවිරුවන් ආබාධිත තත්ත්වය සමග දෛනික කටයුතු සිදුකර ගැනීමේ දී ඇති වන අපහසුතාවන් මග හරවා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගයක් මෙම උපකරණ ලබාදීමෙන් බලාපොරොත්තු වේ. ඒ අනුව රණක්ෂිතයටපත් රණවිරුවාගේ අවශ්‍යතාවය පරිදි සහායක උපකරණ අඛණ්ඩව ලබා දීම මෙහි අරමුණයි.

2024 වර්ෂය සඳහා රණක්ෂිතයටපත් රණවිරුවන් උදෙසා සහායක උපකරණ මිල දී ගැනීම සඳහා රු. මිලියන 55.56 මූල්‍යම ප්‍රතිපාදන වෙන් කරන ලදී. ඒ අනුව 2024 වසරේ දී රණවිරු සේවා අධිකාරිය මඟින් වෙන් කරන ලද මූල්‍යම ප්‍රතිපාදන අනුව මිල දී ගන්නා ලද ආබාධිත සහායක උපකරණ රණවිරුවන් වෙත ලබාදෙන ලදී.





1.1.2. 2024 වසර තුළ කාර්ය සාධනය


රණක්ෂිතයටපත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීම					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	**2024.12.31 දිනට කාර්යය සාධනය රු.**	**ප්‍රගතිය (%)**	**වාර්ෂික ඉලක්කය**	**කාර්යය සාධනය**	**ප්‍රගතිය (%)**
55,650,000.00	32,198,682.59	58%	1500	690	46%

1.1.3. ආබාධිත සහායක උපකරණ ලබා දීම.

1.1.3.1. රෝද පුටු ලබාදීම


ආබාධිත සහායක උපකරණ ලබාදීමේ නිර්ණායක මත දෙනිකව භාවිතා කරනු ලබන රෝද පුටුව අබලන්ව (කැඩී බිඳී /ඉරී/තැලී/මල බැඳුණු) පවතින සහ රෝගාතුරවීමක් මත හදිසි අවශ්‍යතාවයක් (හදිසි සැත්කම්, අනතුරු, කායික දුබලතා) මතු වන ලද රණවිරුවන් වෙත පමණක් රෝදපුටු ලබා දෙනු ලබයි. ඒ අනුව කොමඩ් රෝදපුටු 25ක්, ක්‍රියාකාරී රෝදපුටු 15ක්, සාමාන්‍ය රෝදපුටු 65ක් ලෙස රෝදපුටු 105ක් මිල දී ගන්නා ලදී. පහත පරිදි රණවිරුවන් වෙත ලබාදෙන ලදී.

අ/අ	දිස්ත්‍රික්කය	සාමාන්‍ය රෝද පුටුව - ටියුබ් සහිත සුලං ටයර්	සාමාන්‍ය රෝද පුටුව - ටියුබ් රහිත ගල් ටයර්	ක්‍රියාකාරී රෝද පුටු
1	අනුරාධපුරය	3	5	2
2	අම්පාර	2		
3	කළුතර	3	3	
4	කුරුණෑගල	4		
5	ගම්පහ	3	3	
6	ගාල්ල	1		
7	නුවර එළිය	1		
8	පොළොන්නරුව	1	3	
9	මහනුවර	1		1
10	මාතර			2
11	රත්නපුර	8		3
12	බදුල්ල			
13	පුත්තලම	1		2
14	කැගල්ල	1	2	
15	කොළඹ	2		1
16	හම්බන්තොට	1	1	4
17	මාතලේ	3	1	
	එකතුව	**35**	18	**15**



1.1.3.2. අත්වාරු ලබාදීම


2024 වසර සඳහා අත්වාරු ඉල්ලීම් කරන ලද රණවිරුවන් වෙත ලබා දීමට සහ රණවිරු සේවා අධිකාරියේ සංචිතයක් ලෙස පවත්වා ගෙන යාමට අත්වාරු 2200ක ප්‍රමාණයක් මිලදී ගන්නා ලදී. පහත පරිදි අත්වාරු රණවිරුවන් වෙත ලබාදෙන ලදී.



අ/අ	දිස්ත්‍රික්කය	ප්‍රමාණය
1	අනුරාධපුරය	230
2	අම්පාර	2
3	කළුතර	48
4	කුරුණෑගල	158
5	ගම්පහ	97
6	නුවර එළිය	2
7	පොළොන්නරුව	6
8	මහනුවර	78
9	මාතර	28
10	රත්නපුර	126
11	පුත්තලම	32
12	කෑගල්ල	24
13	කොළඹ	32
14	හම්බන්තොට	16
15	මාතලේ	112
	එකතුව	991

1.1.3.3. කිහිලිකරු ලබාදීම


2024 වර්ෂය තුළ කිහිලිකරු යුගල 25ක ප්‍රමාණයක් මිලදී ගන්නා ලද අතර ඒවා පහත පරිදි රණවිරුවන් වෙත ලබාදෙන ලදී.



අ/අ	දිස්ත්‍රික්කය	කිහිලිකරු
1	අනුරාධපුරය	3
2	අම්පාර	1
3	කළුතර	3
4	ගම්පහ	9
5	ගාල්ල	2
6	පොළොන්නරුව	1
7	මහනුවර	1
8	මාතර	2
9	රත්නපුර	2
10	කොළඹ	1
	එකතුව	25

1.1.3.4. බස්තම් ලබාදීම


වර්ෂ 2024 සඳහා බස්තම් 50ක ප්‍රමාණයක් මිලදී ගෙන පහත පරිදි රණවිරුවන් වෙත ලබා දෙන ලදී.



අ.අ.	දිස්ත්‍රික්කය	බස්තම්
1	අනුරාධපුරය	3
2	අම්පාර	1
3	ගම්පහ	4
4	ගාල්ල	1
5	නුවර එළිය	3
6	පොළොන්නරුව	3
7	මාතර	3
8	රත්නපුර	3
9	පුත්තලම	4
10	කැගල්ල	8
11	හම්බන්තොට	2
	එකතුව	35

1.1.3.5. කොමඩ් පුටු


2024 වර්ෂය සඳහා කොමඩ් පුටු 25 ක ප්‍රමාණයක් මිලදී ගෙන පහත පරිදි රණවිරුවන් වෙත ලබා දෙන ලදී.



අ/අ	දිස්ත්‍රික්කය	ප්‍රමාණය
1	අනුරාධපුරය	1
2	අම්පාර	3
3	කළුතර	3
4	කුරුණෑගල	4
5	ගම්පහ	3
6	ගාල්ල	3
7	පොළොන්නරුව	2
8	මහනුවර	1
9	රත්නපුර	1
10	පුත්තලම	1
11	කැගල්ල	1
12	හම්බන්තොට	1
13	මාතලේ	2
	එකතුව	**25**

1.1.3.6. විද්‍යුත් ආරෝපිත යතුරුපැදි

වර්ෂ 2024 සඳහා විද්‍යුත් ආරෝපිත යතුරු පැදි 50 ක ප්‍රමාණයක් මිලදී ගෙන පහත පරිදි රණවිරුවන් වෙත ලබා දෙන ලදී.




අඅ	දිස්ත්‍රික්කය	ප්‍රමාණය
1	අනුරාධපුර	10
2	අම්පාර	5
3	කලුතර	2
4	කුරුණෑගල	5
5	කොළඹ	3
6	ගම්පහ	6
7	ගාල්ල	3
8	පුත්තලම	1
9	පොළොන්නරුව	1
10	බදුල්ල	1
11	මහනුවර	3
12	මාතර	1
13	මාතලේ	3
14	මොණරාගල	2
15	රත්නපුර	2
16	හම්බන්තොට	2
	එකතුව	**50**

1.1.3.7. වායු මෙට්ට ලබා දීම

ඇඳටම සීමා වූ රණවිරුවන්ගේ කඩිනම් අවශ්‍යතා මත ගම්පහ, බදුල්ල, මාතර යන දිස්ත්‍රික්කයන්හි රණවිරුවන් හතර දෙනෙකු සඳහා වායු මෙට්ට 4ක් මිලදී ගෙන ලබාදෙන ලදී.

1.1.3.8. ඇස් කණ්ණාඩි ලබාදීම

2024 වසරේ මූල්‍ය ප්‍රතිපාදන මගින් රණවිරුවන් 300 ක් වෙත ඇස් කණ්ණාඩි ලබාදෙන ලදී.



අ/අ	දිස්ත්‍රික්කය	ප්‍රමාණය
1	අනුරාධපුරය	96
2	අම්පාර	1
3	ගම්පහ	54
4	ගාල්ල	4
5	පොළොන්නරුව	1
6	මාතර	42
7	රත්නපුර	31
8	පුත්තලම	6
9	කෑගල්ල	39
10	කොළඹ	5
11	හම්බන්තොට	17
12	මාතලේ	4
	එකතුව	**300**

1.2. වෛද්‍ය ආධාර ලබාදීම

ක්‍රියාන්විත හේතූන් මත ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවයේ දිවි පිදූ විවාහක රණවිරුවන්ගේ සම්පූර්ණ වැටුප නොලබන දෙමාපියන්, ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවය මගින් විශ්‍රාම වැටුප/යැපෙන්නන්ගේ දීමනාව පමණක් ලබන දිවි පිදූ රණවිරුවන්ගේ භාර්යාවන් සහ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක, රැකියා විරහිත දූ දරුවන් සඳහා ද ක්‍රියාන්විත හේතූන් මත රණක්ෂිතයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ට සහ ක්‍රියාන්විත හේතූන් මත ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවයේ දිවි පිදූ විවාහක රණවිරුවන්ගේ සම්පූර්ණ වැටුප ලබන ළඟම ඥාතීන් සඳහා වෛද්‍ය ණය ලබා ගැනීමට නොහැකි අවස්ථාවන්හිදී කළමනාකරණ මණ්ඩල අනුමැතිය යටතේ වෛද්‍ය ආධාර පිරිනමනු ලබයි.


මෙම වැඩසටහන යටතේ රණවිරු ප්‍රජාව වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහාය වීම, රෝග තත්ත්වයන් මගහරවා ගැනීමට අත්‍යවශ්‍ය වන

වෛද්‍ය උපකරණ ලබා දීම, ආර්ථික අපහසුතා ඇති රෝගයන්ගෙන් පෙළෙන රණක්ෂිතයටපත් රණවිරුවන් සහ රණවිරු ඥාතීන් වෙත ප්‍රතිකාර ගැනීම සඳහා සහාය වීම වැනි කර්තව්‍යයන් සිදු කරනු ලබයි. ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබාගත හැකි රෝහලක් වෙතින් අවශ්‍ය ප්‍රතිකාර, පරීක්ෂණ හෝ සැත්කම් සිදුකර ගැනීමට ප්‍රමාණවත් මූල්‍ය සහයෝගයක් ලබාදීම මෙම වැඩසටහන මගින් සිදු වෙයි. රණවිරුවා සඳහා උපරිමය රු.500,000.00ක් ද, රණවිරු ඥාතීන් සඳහා උපරිමය රු.75,000.00ක් ද වශයෙන් මූල්‍ය ආධාර ලබා දෙනු ලබයි.

1.2.1. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

2024 වසරේ දී රණවිරු ප්‍රජාව වෙත ලබා දීම සඳහා වෛද්‍ය ආධාර ලෙස රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉන් රු. 4,104,277.34ක මුදලක් රණවිරුවන් හා රණවිරු ළඟම ඥාතීන් වෙත වෛද්‍ය ආධාර ලබාදී ඇත.

වෛද්‍ය ආධාර ලබාදීම					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	2024.12.31 දිනට කාර්යය සාධනය රු.	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය (ඉල්ලීම් පරිදි)	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
10,000,000.00	4,104,277.34	41%	24	24	100%



අ/අ	දිස්ත්‍රික්කය	ප්‍රමාණය
1	අනුරාධපුර	2
2	කළුතර	2
3	කෑගල්ල	1
4	කොළඹ	3
5	ගම්පහ	3
6	පුත්තලම	2
7	පොළොන්නරුව	1
8	බදුල්ල	1
9	මහනුවර	3
10	මාතර	3
11	රත්නපුර	2
12	අම්පාර	1
එකතුව		**24**

1.3. වෛද්‍ය ණය ව්‍යාපෘතිය

රණවිරුවන් හා රණවිරු ඥාතීන් ද වැරදි පෝෂණ පුරුදු නිසා බෝ නොවන රෝගයන්ට ගොදුරු වීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා අතරම හදිසි අනතුරුවලට මුහුණදීම නිසා ද සෞඛ්‍ය ගැටලු ඇතිවීම නොවැළැක්විය හැකිය. එසේම වයෝවෘද්ධ තත්ත්වය මත විවිධ රෝගයන්ට ගොදුරුවීම නිසා සෞඛ්‍ය පිරිහීමට ලක් වේ. මෙම තත්වය මත රණවිරු ප්‍රජාව මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු පදනම් කරගෙන වාර්ෂිකව විශාල පිරිසක් වෛද්‍ය ආධාර අයදුම් කරයි. හදිසි සැත්කම් හා ප්‍රතිකාරයන් සඳහා බහුතරයක් ඉල්ලීම් යොමු කරන අතර මින් වැඩි පිරිසක් වැටුප් හා දීමනා ලබන පුද්ගලයන් වේ. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන් වූ රණවිරුවන් අදාළ ආබාධිත තත්ත්වයන්ට හේතු වූ කරුණු වල ඍජු හෝ වක්‍ර බලපෑම් මත තවදුරටත් රෝගයන්ට ගොදුරුවීම සිදු වේ.

මෙවැනි සාධක නිසා රණවිරු ප්‍රජාව ගොදුරුවන රෝගාබාධයන් සඳහා ක්ෂණික ප්‍රතිකාර ලබාගැනීමට රජයේ රෝහල්වල රෝගීන් දීර්ඝ කාලීනව පොරොත්තු ලේඛනගත කිරීම වැනි කරුණු ද පුද්ගලික අංශයේ රෝහල් වලින් ප්‍රතිකාරයන් ලබා ගැනීමට ආර්ථිකමය හැකියාවක් නොමැතිකම නිසා රෝගය සඳහා නිසි ප්‍රතිකාර කලට වේලාවට නොලැබීම හේතුවෙන් රෝගී තත්වය උත්සන්න වීම හා වෙනත් අතුරු ආබාධයන්ට ලක්වීම සිදුවිය හැකි අතර ඒ හේතු කොටගෙන අකල් මරණයන්ට ද ගොදුරුවිය හැකිය.

එවන් අවස්ථාවල දී වෛද්‍ය නිර්දේශය මත හදිසි මූල්‍යමය අවශ්‍යතාවයන් සඳහා රණවිරු ප්‍රජාව වෙනුවෙන් පොලී රහිත ණය මුදලක් ලබා දීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. රෝගයට ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමුවී කඩිනමින් සේවා ලබාගැනීමට මූල්‍යමය දායකත්වය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකරනු ලැබේ.

රු.500,000.00 ක මුදලක් උපරිමය වශයෙන් වෛද්‍ය ණය මුදලක් ලෙස ලබාගත හැකිය. ණය මුදල අයකරන කාලය උපරිමය වාරික 36 කි. මෙම ණය මුදල ලබාදීමේ දී කිසිදු සේවා ගාස්තුවක් අය නොකරයි.

1.3.1. වෛද්‍ය ණය ලබාදීම

වෛද්‍ය ණය ලබා දීම සඳහා රු.මිලියන 01 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඉන් රු.500000.00 ක වෛද්‍ය ණය මුදලක් කුරුණෑගල දිස්ත්‍රික් රණවිරුවකු සඳහා ලබා දෙන ලදී.

1.4. හදිසි ආපදා ආධාර

1.4.1. ව්‍යාපෘතිය හැදින්වීම

ක්‍රියාන්විතයේ දී දිවිපිදූ රණවිරු පවුල් වල ළඟම ඥාතීන් සහ ක්‍රියාන්විත හේතූන් මත රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ නිවාස වලට සිදුවන ගංවතුර, නායයෑම්, සුළිසුලං, ගස්කඩා වැටීම්, සහ ගිනි ගැනීම් වැනි හදිසි ආපදා තත්වයකදී දේපල වලට සිදුවන අලාභහානි සහ රණක්ෂිතයට පත් රණවිරුවා මියයෑම සැලකිල්ලට ගෙන එම රණවිරු පවුල් වෙත අස්වැසිල්ලක් වීම අරමුණ කොට ගෙන හදිසි ආපදා ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

1.4.2. ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

- දිවයින පුරා විහිදි ඇති රණවිරු සංසද සාමාජිකත්වය ලබා ගෙන ඇති රණවිරුවන් වෙනුවෙන් ඔවුන්ගේ නිවාසවලට සිදුවන ගංවතුර, නායයෑම්, සුළිසුලං, ගස්කඩා වැටීම්, සහ ගිනි ගැනීම් වැනි හදිසි ආපදා තත්වයකදී සිදුවන අලාභහානි වෙනුවෙන් රුපියල් 100,000.00 ක මූල්‍යමය ආධාරයක් ද

- දිවයින පුරා විහිදි ඇති රණවිරු සංසද සාමාජිකත්වය ලබා ගෙන ඇති රණවිරුවන් වෙනුවෙන් රණක්ෂිතයට පත් රණවිරුවා මියයෑම සැලකිල්ලට ගෙන එම රණවිරු පවුල් වෙත රුපියල් 10,000.00 ක මූල්‍යමය ආධාරයක් ද ලබාදීම.

1.4.3. 2024 වසර තුළ කාර්යය සාධනය

හදිසි ආපදා ආධාර (ස්වභාවික ආපදා සහ රණවිරු මියයෑම්)					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	2024.12.31 දිනට කාර්යය සාධනය රු.	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය (ඉල්ලීම් පරිදි)	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
4,000,000.00	2,228,167.72	56.95%	54	54	100%

- නිවස මතට ගසක් කඩා වැටීම නිසා සිදු වූ ආපදා තත්වයක්






1.4.4. හදිසි ආපදා ආධාර ලබා දීම (ස්වභාවික ආපදා) – 2024

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රමාණය	මුළු මුදල (රු)
01	කොළඹ	03	262,617.72
02	ගම්පහ	03	300,000.00


03	මහනුවර	01	100,000.00
04	මාතලේ	01	100,000.00
05	මාතර	04	350,000.00
06	හම්බන්තොට	02	158,820.00
07	බදුල්ල	01	100,000.00
08	රත්නපුරය	02	200,000.00
09	පොලොන්නරුව	03	236,730.00
10	අනුරාධපුරය	01	100,000.00
එකතුව			1,908,167.72



හදිසි ආපදා ආධාර (රණවිරුවා මිය යෑම)

1.4.5. හදිසි ආපදා ආධාර ලබා දීම (මියගිය රණවිරුවන් සඳහා) – 2024

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රමාණය	මුළු මුදල (රු)
01	කොළඹ	2	20,000.00
02	ගම්පහ	4	40,000.00
03	කලුතර	2	20,000.00
04	මහනුවර	3	30,000.00
05	මාතලේ	1	10,000.00
06	මාතර	2	20,000.00
07	හම්බන්තොට	1	10,000.00
08	මොණරාගල	1	10,000.00
09	රත්නපුරය	2	20,000.00
10	පොලොන්නරුව	5	50,000.00
11	අනුරාධපුරය	4	40,000.00
12	පුත්තලම	5	50,000.00
13	කොළඹ	2	20,000.00
එකතුව			320,000.00



1.5. ජාතික රණවිරු අනුස්මරණ දිනය

1.5.1. ව්‍යාපෘතිය හැඳින්වීම

දශක තුනකට අධික කාලයක් පැවති කුරිරු ත්‍රස්තවාදය නිමාකර නිදහස් නිවහල් දේශයක් වෙනුවෙන් දිවිපිදූ දේශප්‍රේමී විරෝදාර රණවිරුවන් හා මාතෘභූමියේ චිරස්ථිතිය උදෙසා තම ශරීරාංග කැප කල වීර වික්‍රමාන්විත රණවිරුවන් අනුස්මරණය කරමින් ජාතියේ උපහාරය පුද දීම රණවිරුවාගේ නාමය අඛණ්ඩතාවය සුරක්ෂිත කිරීම උදෙසා රණවිරු අනුස්මරණ දින වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

1.5.2. 2024 වසර තුළ කාර්යය සාධනය

ජාතික රණවිරු අනුස්මරණ දිනය					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	2024.12.31 දිනට කාර්යය සාධනය රු.	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
5,000,000.00	3,795,926.38	76%	1	1	100%

1.5.3. රණවිරු කොඩි බෙදා හැරීම -2024

අ.අ.	ආයතනය	කොඩි ප්‍රමාණය
01	බස්නාහිර ආණ්ඩුකාර කාර්යාලය	100,000
02	නැගෙනහිර ආණ්ඩුකාර කාර්යාලය	75,000
03	ඌව පළාත් ආණ්ඩුකාර කාර්යාලය	50,000
04	සබරගමුව පළාත් ආණ්ඩුකාර කාර්යාලය	50,000
05	වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලය	100,000
06	මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලය	60,000
07	උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලය	100,000
08	උතුරු පළාත් ආණ්ඩුකාර කාර්යාලය	20,000
09	දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලය	100,000

10	යුද්ධ හමුදාව	150,000
11	නාවික හමුදාව	50,000
12	ගුවන් හමුදාව	30,000
13	පොලිසිය	80,000
14	විශේෂ කාර්යය බලකාය	10,000
15	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව (CSD)	25,000
	එකතුව	1,000,000

1.5.4. රණවිරු කොඩි ආදායම - 2024

අ/අ	ආයතනය	(2024 වර්ෂයේ කොඩි සදහා ලැබුනු මුදල්) කොඩි ආදායම (රු)
1	බස්නාහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලය	379,046.00
2	නැගෙනහිර පළාත් ආණ්ඩුකාර කාර්යාලය	954,500.00
3	දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලය	392,400.00
4	මධ්‍යම පළාත් ආණ්ඩුකාර කාර්යාලය	150,000.00
5	ඌව පළාත් ආණ්ඩුකාර කාර්යාලය	413,068.00
6	වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලය	536,762.50
7	උතුරු මැද පළාත් ආණ්ඩුකාර කාර්යාලය	100,000.00
8	උතුරු පළාත් ආණ්ඩුකාර කාර්යාලය	75,262.00
9	යුද්ධ හමුදාව	1,840,944.00
10	නාවික හමුදාව	954,680.00
11	ගුවන් හමුදාව	533,375.00
12	පොලිසිය	1,225,000.00
13	විශේෂ කාර්ය බලකාය	200,000.00
14	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව (CSD)	500,000.00
15	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	3,515.00
16	ජනාධිපති කාර්යාලය	16,000.00
17	කොත්මලේ ප්‍රාදේශීය සභාව	10,700.00
18	බත්තරමුල්ල,ඇපිටිය ,මහර	36,800.00
19	මහජන බැංකුව	2,775.00
20	එකතුව	8,324,827.50





2024 වර්ෂයේ පැවති රණවිරු අනුස්මරණ උත්සවය

1.6. රණවිරු දිරිය ණය

1.6.1. ව්‍යාපෘතිය හැදින්වීම

රටේ සම්පත් රට තුළ ම ඉතිරි කරමින් දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කරන ආර්ථික සංකල්පය යටතේ ආබාධිත රණවිරුවන් සහ ක්‍රියාන්විතයේදී දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් තුළ ආකල්පමය වෙනසක් ඇති කර එමගින් කුසලතාවයෙන් යුතු ව්‍යාවසායකයින් පිරිසක් බවට පත් කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ.

රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සහජ දක්ෂතා පදනම්ව, පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ස්වයං රැකියා සඳහා දිරිමත් කිරීම. රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ඉතිරි කිරීම වර්ධනය කිරීම තුලින් රටේ ආර්ථිකයට සක්‍රිය දායකත්වයක් ලබාදීම වැනි අරමුණු පෙරදැරිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි.


❖ උසස් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් වැඩි ගුණාත්මකභාවයකින් යුතු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පිළිබඳ දැනුම ලබා දීම, පුහුණු සඳහා රාජ්‍ය ආයතන හා පුද්ගලයන් හඳුන්වා දීම, අදාළ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හඳුන්වා දෙමින් දේශීය වෙළඳ පොළ සඳහා නිෂ්පාදන ඉදිරිපත් කිරීම, අපනයන වෙළඳපොල හඳුන්වාදෙමින් තම නිෂ්පාදන අපනයනය සඳහා යොමු කිරීම රණවිරු දිරිය ණය ව්‍යාපෘතිය මගින් සිදු කරයි.මෙහිදී එක් අයකුට උපරිම ලක්ෂ 07 ක් දක්වා ණය මුදල් ලබාදෙන අතර 5% ක වාර්ෂික සහන පොලියක් අය කිරීම මෙන් ම, ණය අයකර ගැනීමේ උපරිම කාල සීමාව වසර 04 කි.

1.6.2. 2024 වසර තුළ කාර්යය සාධනය

රණවිරු දිරිය ණය					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	2024.12.31 දිනට කාර්යය සාධනය රු.	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
60,000,000.00	37,600,000.00	62.66%	99	60	60.60%

1.6.3. 2024 දිස්ත්‍රික්කක අනුව දිරිය ණය ලබා දීම

පලාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ලබාදුන් මුදල් (රු)	සම්පූර්ණ මුදල (රු)
බස්නාහිර	ගම්පහ	6	3,700,000.00	5,100,000.00
	කොළඹ	1	700,000.00	
	කළුතර	1	700,000.00	
මධ්‍යම	මාතලේ	2	1,100,000.00	3,900,000.00
	නුවර	4	2,800,000.00	
දකුණ	ගාල්ල	4	2,400,000.00	4,500,000.00
	මාතර	3	2,100,000.00	
ඌව	මොණරාගල	2	1,100,000.00	2,500,000.00
	බදුල්ල	2	1,400,000.00	
සබරගමුව	රත්නපුර	9	4,900,000.00	4,900,000.00
වයඹ	කුරුණෑගල	9	5,900,000.00	8,700,000.00
	පුත්තලම	4	2,800,000.00	
උතුරු මැද	අනුරාධපුර	12	6,600,000.00	8,000,000.00
	පොළොන්නරුව	2	1,400,000.00	
	එකතුව	60		37,600,000.00



ඇදුම් මැසීමේ ව්‍යාපාරයක නියැලෙන රණවිරුවෙක්





යකඩ පෑස්සුම් කම්හලක නියැලෙන රණවිරුවෙක්



කොහු කර්මාන්තයේ නියැලෙන රණවිරුවෙක්



1.7. රණවිරු ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

දිවයින පුරා විසිරී ඇති රණවිරු ගම්මාන යුධ, නාවික, ගුවන් සහ පොලිස් සේවාවලට අයත් මෙන්ම, ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අයත් වේ. එම ආයතන මගින් මෙම රණවිරු ගම්මානවල සංවර්ධන සහ නඩත්තු කටයුතු සිදුකිරීම කරනු ලබයි.

එම රණවිරු ගම්මාන ආරම්භ කිරීමත් සමඟ රණවිරු පවුල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වනුයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ගැනීමේ දුෂ්කරතාවයයි. ඒ සඳහා මධ්‍යම ආණ්ඩුව සහ ඒ යටතේ වගකිව යුතු ආයතන දැනුවත් කර අදාල කටයුතු සම්බන්ධීකරණය සිදුකිරීම හා සුළු සංවර්ධන කටයුතු සිදුකිරීමට රණවිරු සේවා අධිකාරිය මැදිහත්ව ක්‍රියාකරනු ලබයි.

2024 වර්ෂයේදී මුංගන්දළුව රණවිරු ගම්මානයේ පිවිසුම් මාර්ගය බොරළු දමා පිළිසකර කිරීම සඳහා **රු.145,000.00** මුදලක් වැය දරා ඇත.

1.8. ප්‍රාදේශීය රණවිරු ස්මාරක නඩත්තුව හා පවත්වාගෙන යෑම

බත්තරමුල්ල රණවිරු ස්මාරකයේ 2024 වර්ෂය සඳහා නඩත්තු කටයුතු වෙනුවෙන් **රු 38,810.00** මුදලක් වැය දරා ඇත.

1.9. මයිලපිටිය රණවිරු අනුස්මරණ ස්මාරකය සහ උද්‍යානය නඩත්තුව හා සංවර්ධනය

මයිලපිටිය රණවිරු ස්මාරකය සහ උද්‍යානයේ වාර්ෂික නඩත්තු කටයුතු සහ විදුලි බිල්පත් සහ ජල බිල්පත් ගෙවීම මෙම අධිකාරිය මඟින් සිදුකරනු ලබයි.

ඒ අනුව මයිලපිටිය රණවිරු ස්මාරකය සහ උද්‍යානයේ නඩත්තු කටයුතු වෙනුවෙන් 2024 වරෂයේ රුපියල් 514,447.08 ක වැයක් දරා ඇත.


1.10. ක්‍රීඩා ව්‍යාපෘතිය

1.10.1. ව්‍යාපෘතිය හැඳින්වීම

රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කල ආබාධිත රණවිරුවන් කායික සහ මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඔවුන්ව ක්‍රීඩාවන් වෙත යොමු කරවීම මගින් ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් දියුණු කිරීම මෙන්ම රණවිරු දුදරුවන්ගේ ක්‍රීඩා කුසලතා දියුණු කිරීමට උපකාර කිරීම රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා අංශයේ මූලික පරමාර්ථය වේ.මෙහිදි ඔවුන්ගේ ක්‍රීඩා හැකියාවන් වර්ධනය කිරීමට අප විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1.10.2. 2024 වසර තුළ කාර්යය සාධනය

ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතිය					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	**2024.12.31** දිනට කාර්යය සාධනය රු.	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
1,000,000.00	574,390.00	57.43%	11	11	100%



1.10.3. 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

1.10.3.1. තරගාවලි වෙත යොමු කරවීම.

- 2024 පෙබරවාරි මස 21 වන දින කුරුණෑගල වෙළගෙදර ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී පවත්වන ලද ආබාධිත ටේබල් ටෙනිස් තරගාවළිය වෙනුවෙන් රණවිරුවන් 04 දෙනෙකු සහභාගි කරවන ලද අතර එහිදි රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරන ලද රණවිරුවන් විශිෂ්ඨ දක්ෂතා දක්වන ලදි.
- 2024 මැයි මස 11 සහ 12 යන දිනයන් හි දී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේදී පවත්වන ලද ආබාධිත මළල ක්‍රීඩා තරගාවළිය වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් රණවිරුවන් සහභාගි කරවන ලදි.
-

1.10.3.2. ක්‍රීඩකයන්ට අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම.

රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කල ආබාධිත තත්වයට පත් ව සිටින නමුත් තම ක්‍රීඩා හැකියාවන් හරහා තව දුරටත් තම රටට ගෞරවයක් ගෙන ඒමට වෙහෙසෙන රණවිරුවන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම යටතේ බැට්මින්ටන් ක්‍රීඩාවෙන් විශිෂ්ඨ දක්ෂතා දක්වනු ලබන සෙ/403294 බනි ii රේමන් එස්.ජේ.එන්(ආර්එස්පි) රණවිරුවා හට ඔහුගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම පිණිස රු 78,000.00 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම .

ත්‍රස්තවාදය නිමා කිරීමට තම තරුණ ජීවිතය කැප කර ආබාධිත තත්වයට පත්ව සිටින නමුත් තම ක්‍රීඩා හැකියාවන් හරහා තව දුරටත් තම රටට ගෞරවයක් ගෙන ඒමට වෙහෙසෙන රණවිරුවන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම යටතේ ක්‍රිකට් ක්‍රීඩාවෙන් විශිෂ්ඨ දක්ෂතා දක්වා 2024 වර්ෂයේ ආබාධිත ක්‍රිකට් සංචිතයට සුදුසු කම් ලබා ඇති XP23545 බල සෙබළ ඩබ්.ජී.ඩී කුමාර රණවිරුවා හට ඔහුගේ ක්‍රීඩා කුසලතා වර්ධනය කිරීම පිණිස රු 144,150.00 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

ත්‍රස්තවාදය නිමා කිරීමට තම තරුණ ජීවිතය කැප කර ආබාධිත තත්වයට පත්ව සිටින නමුත් තම ක්‍රීඩා හැකියාවන් හරහා තව දුරටත් තම රටට ගෞරවයක් ගෙන ඒමට වෙහෙසෙන රණවිරුවන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම යටතේ ටේබල් ටෙනිස් ක්‍රීඩාවෙන් විශිෂ්ඨ දක්ෂතා දක්වන සහ පුහුණුකරුවෙකු ලෙස කටයුතු කරන සෙ 550173 බනි ii ඩබ්ලිව් මුණිදාස රණවිරුවා හට ඔහුගේ ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය රු 36,000.00 ක් වටිනා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

1.10.3.3. ශක්තිජනක පාන වර්ග සහ පෝෂණ අතිරේක ලබා දීම

රණවිරු සේවා අධිකාරියේ මලල ක්‍රීඩා සංචිතය නියෝජනය කරමින් දේශිය මෙන්ම විදේශිය තරගාවලි වලින් ජයග්‍රහණ අත්පත් කර ගත් රණවිරු බනි ii අනිල් ප්‍රසන්න ජයලත් හට ඔහුගේ ඉදිරි ක්‍රීඩා පුහුණුවීම් කටයුතු වෙනුවෙන් 2024 වර්ෂය තුළ අවස්ථාවන් දෙකකදි ශක්තිජනක පාන වර්ග සහ පෝෂණ අතිරේක ලබා දීම

මළල ක්‍රීඩාවෙන් දේශිය සහ විදේශිය ජයග්‍රහණ අත්පත්කර ගත් සෙ/32600 මා/සැරයන් අනුර එන්ජී රණවිරුවාගේ දියණිය වන එම්ජී චාරුණි ප්‍රමුදිකා දියණිය හට ඇයගේ ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය රු 25,000.00 ක් වටිනා පෝෂණ අතිරේක ලබා දෙන ලදි.


අන්තර් ජාතික වශයෙන් ජයග්‍රහණ රාශියක් ලබා ඇති කාය වර්ධන ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට අභිමානයක් ගෙන දුන් සෙ/408397 ලා/කෝප්‍රල් පෙරේරා එච්ඒඑස් (මියගිය) රණවිරුවාගේ

දියණිය වන තාරකා සඳරේණු පෙරේරා දියණිය හට ඇයගේ ඉදිරි ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය රු 72,500.00 ක් වටිනා පෝෂණ අතිරේක අවස්ථාවන් දෙකකදී ලබා දෙන ලදි.

1.10.3.4. රණවිරු දු දරුවන් වෙත අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීම.

ක්‍රීඩා හැකියාවන් ඇති දු දරුවන් හට තම ක්‍රීඩා හැකියාවන් දියුණු කර ගැනීමට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා දීම යටතේ රට වෙනුවෙන් ජීවිතය කැප කල සෙ/363874 ලා/කොං තෙන්නකෝන් ටිඑම්ආර් රණවිරුවාගේ දියණිය වන අයෝද්‍යා දෙවිමිණි තෙන්නකෝන් හට ඉන්දියාවේ පවත්වනු ලැබූ සෙස්ටබෝල් තරගාවලිය සඳහා සහභාගී වීම පිණිස ගුවන් ටිකට් පත් ලබා ගැනීම වෙනුවෙන්රු 55,500.00 ක මුදලක් ලබා දෙන ලදි.





1.10.3.5. රණවිරු සංසඳ සාමාජිකයින් වෙනුවෙන් තරගාවළි සංවිධානය කිරීම.

රටේ ඒකීයභාවය වෙනුවෙන් තම ශාරීරාංග පූජා කල රණවිරුවන්ට සහ ජීවිතය කැප කල රණවිරුවන්ගේ යැපෙන්නන්ගේ මානසිකත්වය නගා සිටුවීම සහ ඔවුන් අතර අනෝන්‍ය සහයෝගීතාව ඇති කිරීම පිණිස දිසත්‍රික් මට්ටමින් රණවිරු සංසඳ සාමාජිකයන් වෙනුවෙන් ක්‍රීඩා තරග සංවිධානය කිරීමේ වැඩසටහන් මාලාවේ ප්‍රථම වැඩසටහන මාතර දිස්ත්‍රික් රණවිරු සංසඳ සාමාජිකයන් වෙනුවෙන් පවත්වන ලදි.

- මාතර රණවිරු සංසඳ සාමාජිකයින් වෙනුවෙන් ක්‍රීඩා තරගාවළි සංවිධානය කිරීම.




1.10.3.6. වෙනත්

පුරා දශක තුනක කුරිරු ත්‍රස්තවාදය නිමා කිරීමට තම තරුණ ජීවිතය කැප කල XC38646 නායක නැවි එච්ආර්අයිඑස් ධනවර්ධනගේ පියා වන ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා තරගාවළි ජයග්‍රහණය කල

සහ ඉදිරි තරගාවළි නියෝජනය කිරීමට සුදුසුකම් ලැබූ එච්ආර් ධනවර්ධන රණවිරු පියාණන් හට රු 18,000.00 ක් වටිනා ක්‍රීඩා සපත්තු ලබා දීම ද සිදු කරන ලදි

1.10.4. 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්

අ.අ	ප්‍රතිලාභය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය දැරීම (රු)
01	රණවිරුවන් වෙනුවෙන් ක්‍රීඩා උපකරණ ලබා දීම	03	රු 258,950.00
02	රණවිරුවන් වෙනුවෙන් පෝෂණ අතිරේක ලබා දීම	01	රු 83,000.00
03	මියගිය රණවිරු යැපෙන්නන් වෙනුවෙන් ක්‍රීඩා උපකරණ ලබා දීම	01	රු 18,000.00
04	මියගිය රණවිරු යැපෙන්නන් වෙනුවෙන් පෝෂණ අතිරේක ලබා දීම	02	රු 97,500.00
05	මියගිය රණවිරු යැපෙන්නන් වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම	01	රු 55,500.00
06	ක්‍රීඩා තරග සඳහා යොමු කරවීම	02	රු 11,340.00
07	රණවිරු සංසඳ සාමාජිකයින් වෙනුවෙන් තරගාවළි සංවිධානය කිරීම	01	රු 50,100.00

1.11. **ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය**

1.11.1. ව්‍යාපෘතිය හැදින්වීම


රට වෙනුවෙන් තම තරුණ ජීවිත කැප කරමින් ආබාධිත විශ්‍රාමික වූ රණවිරුවන් ඔවුන් ප්‍රගුණ කල කුසලතාවයන් උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ සේවා නියුක්තිය සහතික කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. වැඩමුළු, උපදේශන සේවා, පුහුණු සැසි ක්‍රියාත්මක කිරීම මෙම අංශය මගින් සිදු කරයි. දිස්ත්‍රික්ක මට්ටමින් පිහිටුවා ඇති රණවිරු සංසදයන්හි සාමාජිකයන් සහභාගි කරවා ගනිමින් ඔවුන් ව්‍යවසායකයින් ලෙස බල ගැන්වීමට අවැසි මග පෙන්වීම මෙහිදී සිදු කරයි.

1.11.2. 2024 වසර තුළ කාර්යය සාධනය

ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව	2024.12.31 දිනට කාර්යය සාධනය	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
මිලියන 01	රු 349,215.00	34.92%	10	07	70%

1.11.3. දිස්ත්‍රික් වශයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අ.අ	දිනය	වැඩසටහන	දිස්ත්‍රික්කය	වියදම රු.
01	2024.02.20	ගෙවතු වගාව සහ කාබනික පොහොර භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහන සහ උපකරණ/පැළ බෙදා දීම	ගම්පහ	රු 9,975.00
02	2024.03.07	ගෙවතු වගාව සහ කාබනික පොහොර භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහන සහ උපකරණ/පැළ බෙදා දීම	කොළඹ	රු 6,430.00
03	2024.03.14	ගෙවතු වගාව සහ කාබනික පොහොර භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහන සහ උපකරණ/පැළ බෙදා දීම	කළුතර	රු 5,670.00
04	2024.03.22	කාබනික ගෙවතු වගාව සහ බහු වාර්ෂික බෝග වගාව පිළිබඳ පුහුණු වැඩසටහන	රත්නපුර	රු 14,640.00
05	2024.04.26	පැළ තවාන් පාලනය සහ පැල බද්ධ කිරීමේ පුහුණු වැඩසටහන	හම්බන්තොට	-
06	2024.10.01	කරීටාස් රාජ්‍ය නොවන සංවිධානයේ අනුග්‍රහය මත ගෙවතු වගාව සහ කාබනික පොහොර භාවිතය සම්බන්ධ පුහුණු වැඩසටහන.	කුරුණෑගල	-
07	2024.10.28	වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 50% දායකත්වය මත T&JC අඹ පැළ රණවිරුවන් 50 දෙනෙකුට (එක් අයකුට පැළ 50 බැගින්) බෙදා දීමේ වැඩසටහන		රු.312,500.00



දිස්ත්‍රික් වශයෙන් ප්‍රතිලාභ ලබා දීම - ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය

1.11.4.2024 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන් පිලිබඳ සංක්ෂිප්ත විස්තරය

1.11.4.1. කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව, උපකරණ/පැළ බෙදා දීම සහ සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සම්බන්ධීකරණයෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුග්‍රහය මත ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහනට සමගාමීව ගම්පහ දිස්ත්‍රික්කයේ රණවිරුවන් 20 දෙනෙකු සඳහා ගෙවතු සහ බහු වාර්ෂික වගාවන් වෙනුවෙන් බස්නාහාර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් ප්‍රායෝගික පුහුණුවක් සහ කෙටි කාලීන සහ බහු වාර්ෂික භෝග මෙන්ම කෘෂි මෙවලම් කට්ටලය බැගින් නිවි නිපොන් හෝටලය, මීරිගම යන ස්ථානයේ දී එම රණවිරුවන් වෙත බෙදා දීම සිදුකරන ලදි.





1.11.4.2. කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව, උපකරණ/පැළ බෙදා දීම සහ සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සම්බන්ධීකරණයෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුග්‍රහය මත ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහනට සමගාමීව කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරුවන් 20 දෙනෙකු සඳහා ගෙවතු සහ බහු වාර්ෂික වගාවන් වෙනුවෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් ප්‍රායෝගික පුහුණුවක් සහ කෙටි කාලීන සහ බහු වාර්ෂික භෝග මෙන්ම කෘෂි මෙවලම් කට්ටලය බැගින් දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය හෝමාගම යන ස්ථානයේ දී එම රණවිරුවන් වෙත බෙදා දීම සිදුකරන ලදි





1.11.4.3. කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව, උපකරණ/පැළ බෙදා දීම සහ සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

1.11.4.4. කෘෂි මෙවලම් කට්ටලය බැගින් බෙදා දීම

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්දන අංශයේ සම්බන්ධීකරණයෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අනුග්‍රහය මත ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහනට සමගාමීව කළුතර දිස්ත්‍රික්කයේ රණවිරුවන් 20 දෙනෙකු සඳහා ගෙවතු සහ බහු වාර්ෂික වගාවන් වෙනුවෙන් බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් ප්‍රායෝගික පුහුනුවක් සහ කෙටි කාලීන සහ බහු වාර්ෂික භෝග මෙන්ම කෘෂි මෙවලම් කට්ටලය බැගින් සණස කාර්යාලය මතුගම යන ස්ථානයේ දී එම රණවිරුවන් වෙත බෙදා දීම සිදුකරන ලදි.





1.11.4.5. කාබනික ගෙවතු වගාව සහ බහුවාර්ෂික භෝග වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන සහ නයි මිරිස් පැළ බෙදා දීම

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සම්බන්ධීකරණය සහ මුල්‍යමය අනුග්‍රහය මත රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ රණවිරු සංසදයේ රණවිරුවන් 37 දෙනෙකු සඳහා ශ්‍රී සුමනතිස්සාරාම විහාරස්ථානය, යාය පාර, ඇහැලියගොඩ යන ස්ථානයේ දී ගෙවතු වගාව ආශ්‍රිතව නයි මිරිස් වගාව , බහු වාර්ෂික භෝග වගාව, මී මැසි පාලනය සිදු කිරීම වෙනුවෙන් ප්‍රායෝගික පුහුණුවක් මුවගම නියොජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ සම්පත් දායකත්වයෙන් සිදු කරන ලද අතර සහභාගී වූ රණවිරුවන් වෙත නයි මිරිස් පැල බෙදා දීම සිදුකරන ලදි.





1.11.4.6. පැළ තවාන් පාලනය සහ බද්ධ කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සම්බන්ධීකරණය මත හම්බන්තොට දිස්ත්‍රික්කයේ රණවිරුවන් 25 දෙනෙකු සඳහා පැළතවාන් පාලනය සහ බද්ධ කිරීම වෙනුවෙන්

ප්‍රායෝගික පුහුණුවක් දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථානය වීරවිල යන ස්ථානයේ දී එම ආයතනයේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදි.





1.11.4.7. කාබනික ගෙවතු වගාව සහ බහුවාර්ෂික භෝග වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සම්බන්ධීකරණයෙන් කුරුණෑගල ජනසෙත කරීටාස් රාජ්‍ය නොවන සංවිධානයේ අධ්‍යක්ෂ පියතුමන්ගේ සහභාගිත්වයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල රණවිරු සංසදයේ රණවිරුවන් 20 දෙනෙකු සඳහා කාබනික ගෙවතු වගාව සහ බහු වාර්ෂික භෝග, ධාන්‍ය වගාව පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ටීජී මාලනී ඉන්ද්‍රලතා, අංක 210, අඹකොලවැව, අඹන්පොල යන ස්ථානයේ දී පවත්වන ලදි ඒ සඳහා ගල්ගමුව සහකාර කෘෂිකර්ම කාර්යාලයේ කෘෂිකර්ම උපදේශක අයිඑම්ඩබ් සරත්චන්ද්‍ර මහතා සහ සැරයන් සුමිත් කුමාර යන අය සම්පත් දායකත්වය ලබා දෙන ලදි.





1.11.4.8. වයඹ පළාත් රණක්ෂිතයට පත් රණවිරුවන් වෙත TJC අඹ පැල බෙදා දීමේ වැඩසටහන

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සම්බනධීකරණයෙන් වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 50% දායකත්වය සහ රණවිරු සේවා අධිකාරියේ ඉතිරි 50% දායකත්වය මත වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් රණවිරුවන් 24 දෙනෙකු සහ පුත්තලම දිස්ත්‍රික්කයෙන් රණවිරුවන් 26 දෙනෙකු සඳහා TJC අඹ පැල 50 බැගින් ලබා දීම සිදු කරන ලදි.

1.12. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

1.12.1. ව්‍යාපෘතිය හැඳින්වීම

මාතෘභූමියේ ඒකීයභාවයත් ජනතාවගේ ආරක්ෂාවත් වෙනුවෙන් තම ජීවිත පරිත්‍යාගයෙන් යුතුව ත්‍රිවිධ හමුදා සහ පොලිස් සේවය වෙත අනුයුක්තව රාජකාරී කරමින් සිටිය දී ක්‍රියාන්විත නොවන හේතුවලින් මියගිය හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ දරුවන් වෙත මෙම ව්‍යාපෘතිය මඟින් ශිෂ්‍යාධාර පිරිනමනු ලබයි.

රණවිරු සේවා අධිකාරියේ පනතට අනුකූල ප්‍රතිලාභී කාණ්ඩයට අයත් නොවන බැවින් මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය සඳහා මුදල් වෙන්කිරීමක් සිදු නොකෙරේ. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීම දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන් වෙතින් ලැබෙන මූල්‍යමය පරිත්‍යාග මත සිදු කෙරේ.මෙම වසරේදී මාපිය කැපකරු ශිෂ්‍යත්ව ලබා දීම සඳහා දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන් වෙතින් රු. 3644000.00 ක මුදලක් රණවිරු සේවා අධිකාරිය වෙත ලැබී ඇත.

ඉහත කාණ්ඩයට අයත් රණවිරුවන්ගේ සේවය ඇඟයීමත්,ආර්ථික අපහසුතා හේතුවෙන් අධ්‍යාපන කටයතු නිසියාකාරව සිදු කර ගැනීමට නොහැකි වී සිටින දරුවන් හට ආර්ථිකමය වශයෙන් සවියක් වීමත්,ශිෂ්‍යාධාර පිරිනැමීම තුලින් දරුවන්ගේ අධ්‍යාපන කටයතු සඳහා දිරිදීමත් මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ.පළමු වසරේ සිට අ.පො.ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබන දරුවන් වෙත මෙම ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍යාධාර පිරිනැමීම සිදු කරනු ලබයි.


1.12.2. 2024 වර්ෂය තුල කාර්ය සාධනය

මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	2024/12/31 දිනට කාර්ය සාධනය රු.	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
රු.3,960,000.00	රු.2,705,000.00	68%	200	112	56%

1.12.3. 2024 වර්ෂයේදී ශිෂ්‍යාධාර ගෙවීම

අ.අ	මාසය	අලුතින් ආරම්භ කරන ලද ශිෂ්‍යත්ව ගණන	අවසන් කරන ලද ශිෂ්‍යත්ව ගණන	මාසයේ ශිෂ්‍යත්ව ලබාගත් ප්‍රමාණය	වැය වූ මුදල (රු)
01	ජනවාරි	14	24	156	රු.232,500.00
02	පෙබරවාරි	-	82	74	රු.149,500.00
03	මාර්තු	01	17	58	රු. 70,000.00
04	අප්‍රේල්	10	-	68	රු. 98,000.00
05	මැයි	-	-	68	රු. 80,000.00
06	ජුනි	47	04	111	රු.295,000.00
07	ජූලි	-	-	111	රු.295,000.00
08	අගෝස්තු	-	-	111	රු.295,000.00
09	සැප්තැම්බර්	1	1	111	රු.295,000.00
10	ඔක්තෝබර්	3	3	111	රු.295,000.00
11	නොවැම්බර්	1	-	112	රු.300,000.00
12	දෙසැම්බර්	8	8	112	රු.300,000.00

1.12.4. ශිෂ්‍යාධාර ලබා දීම - 2024



1.12.5. ව්‍යාපෘතිය යටතේ ඇති මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය

අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ගණන
01	බස්නාහිර	කොළඹ	04
		ගම්පහ	05
		කළුතර	05
02	මධ්‍යම	මහනුවර	06
		මාතලේ	05
		නුවරඑළිය	01
03	දකුණ	ගාල්ල	08
		මාතර	06
		හම්බන්තොට	01
04	උතුර	යාපනය	-
		මන්නාරම	-
		වව්නියාව	-
		මුලතිව්	-
		කිලිනොච්චිය	
05	නැගෙනහිර	මඩකලපුව	-
		අම්පාර	07
06	වයඹ	ත්‍රිකුණාමලය	-
		කුරුණෑගල	14
		පුත්තලම	-
07	උතුරු මැද	අනුරාධපුරය	23
		පොළොන්නරුව	04
08	ඌව	බදුල්ල	03
		මොණරාගල	03
09	සබරගමුව	රත්නපුරය	13
		කෑගල්ල	04

1.13. මා පිය රැකවරණ ව්‍යාපෘතිය

1.13.1. ව්‍යාපෘතිය හැඳින්වීම

- යුද්ධයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය, අතුරුදහන් හා ආබාධිත තත්වයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාමිකව සිටින රණවිරුවන්ගේ දෙමාපියන් වෙනුවෙන් මෙම දීමනාව ගෙවනු ලැබේ.


1.13.2. ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

- යුද්ධයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය, අතුරුදහන් හා ආබාධිත තත්වයට පත්ව වෛද්‍ය හේතූන්මත විශ්‍රාමිකව සිටින (රණවිරු සේවා අධිකාරියේ පනත යටතට ගැනෙන) රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන් වෙත ගෙවනු ලබන මාපිය රැකවරණ දීමනාව (750/=) මසකට වරක් ලබාදීම රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙතින් සිදුකරනු ලබයි.
- මේ සඳහා මුදල් බැර කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ප්‍රාදේශිය සංවර්ධන බැංකු වෙතින් නිකුත් කරනු ලබන මාපිය රැකවරණ ගිණුම් සඳහා පමණි.


1.13.3. වසර තුළ කාර්යය සාධනය

මාපිය රැකවරණ					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු.	**2024.12.31 දිනට කාර්යයසාධනය**	**ප්‍රගතිය (%)**	**වාර්ෂික ඉලක්කය**	**කාර්යය සාධනය**	**ප්‍රගතිය (%)**
310,000,000.00	227,507,433.34	73%	34000	34000	100%

1.13.4. 2024 වසර සඳහා මුදල් ගෙවූ ප්‍රතිලාභීන් ගණන



1.13.5.2024 වසර සඳහා බැර වූ මුදල



*අර්ධ වාර්ෂික ව රණවිරු සේවා අධිකාරිය වෙත එවිය යුතු ජීවත්වීමේ සහතිකය ලබා දී ඇති ප්‍රතිලාභීන් සඳහා පමණක් ගෙවීම් සිදු කිරීම, 2024 වර්ෂයේ අවසන් මාස 04 හි ගෙවූ මුදල සහ ප්‍රතිලාභීන් ප්‍රමාණය සාපේක්ෂව අඩු වීමට හේතු වී ඇත.

1.14. ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

1.14.1. ව්‍යාපෘතිය හැදින්වීම

ක්‍රියාන්විතයේදී තම ජීවිත පරිත්‍යාග කරමින් හා ශරීරාංග පරිත්‍යාග කරමින් ආබාධිත තත්වයට පත් රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු උසස් අධ්‍යාපනය දක්වා කරගෙන යාමට දිරිදෙමින් හා උසස් අධ්‍යාපනයට තේරිපත්වූ හා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව නිමකිරීමට ආර්ථික මට්ටමින් සහයක් වෙමින් සමාජීය වශයෙන් හා චෘත්තීමය වශයෙන් යහපත් දරුවන් කොටසක් සමාජයට බිහිකිරීමට සහය වීම සහ ඔවුන් අභිප්‍රේරණය කිරීම.

1.14.2. ව්‍යාපෘතිය මගින් ලබා දෙනු ලබන ශිෂ්‍යාධාර

1. 6 – 11 වසර දක්වා අධ්‍යාපනය ලබන දරුවන් හට ශිෂ්‍යාධාර
2. අපොස උසස් පෙළ අධ්‍යාපනය ලබන දරුවන් හට ශිෂ්‍යාධාර
3. උසස් අධ්‍යාපන අධ්‍යාපනය ලබන දරුවන් හට ශිෂ්‍යාධාර
4. කුසලතා ප්‍රවර්ධන ණය

1.14.2.1. 6 – 11 වසර දක්වා ශිෂ්‍යාධාර

රණවිරුවන්ගේ 6 -11 වසර දක්වා අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේදී 6 වසරේ සිට අපොස සාපෙළ අධ්‍යාපනය තෙක් මසකට රු.500/- බැගින් පහත සඳහන් ආකාරයට ශිෂ්‍යාධාර ලබාදේ. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට ප්‍රයෝජනයට ගත හැකි පරිදි එම දරුවන්ගේ නමින් මව/පියා භාරකාරත්වයේ ඇති ජාතික ඉතිරිකිරීම් බැංකු ගිණුම් සඳහා මාසික මුදල් තැන්පත් කෙරේ.

ඉගෙන ගනු ලබන වසර	ගෙවනු ලබන වාරික මුදල (රු)	ගෙවනු ලබන මුලු වාරික ගණන
6 වසර	500/-	72
7 වසර	500/-	60
8 වසර	500/-	48
9 වසර	500/-	36
10 වසර	500/-	24
11 වසර	500/-	12

1.14.3.දිස්ත්‍රික්ක හා පළාත් අනුව 6-11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යත්ව බෙදී යාම

පළාත	දිස්ත්‍රික්කය	ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය	මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය
බස්නාහිර	කොළඹ	46	217
	ගම්පහ	111	
	කළුතර	60	
මධ්‍යම	මහනුවර	108	214
	මාතලේ	62	
	නුවර එළිය	44	
දකුණ	ගාල්ල	66	191
	මාතර	64	
	හම්බන්තොට	61	
නැගෙනහිර	මඩකලපුව	2	68
	අම්පාර	60	
	ත්‍රිකුණාමළය	6	
වයඹ	කුරුණෑගල	124	182
	පුත්තලම	58	
උතුරු මැද	අනුරාධපුර	186	244
	පොළොන්නරුව	58	
ඌව	බදුල්ල	47	113
	මොණරාගල	66	
සබරගමුව	රත්නපුර	81	150
	කෑගල්ල	69	
		1379	

1.14.3.1. අපොස උසස් පෙළ ශිෂ්‍යාධාර

අපොස උසස් පෙළ අධ්‍යාපනය ලබන රණවිරු දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම වැඩසටහනේදි මසකට රු.1500/- බැගින් උපරිම වාරික 24ක් ඇතුලත්වනසේ ඔවුන්ගේ උසස් පෙළ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගතහැකි වන පරිදි දරුවන්ගේ නමින් ඇති ගිණුම් වෙත මාසික මුදල් බැර කෙරේ.

1.14.4.දිස්ත්‍රික්ක හා පළාත් අනුව අපොස උසස් පෙළ ශිෂ්‍යත්ව බෙදී යාම

අ.අ	මාසය	පවත්වාගෙන එන ප්‍රතිලාභීන් ගණන	අලුතින් එකතු වූ ගණන	මාසය තුල මුලු ප්‍රතිලාභීන් ගණන	ඉවත් කිරීම
1	ජනවාරි	540	28	294	-
2	පෙබරවාරි	294	27	321	-
3	මාර්තු	321	52	372	-
4	අප්‍රේල්	372	69	441	-
5	මැයි	441	37	478	-
6	ජූනි	478	55	534	-
7	ජූලි	534	29	563	-
8	අගෝස්තු	563	37	612	-
9	සැප්තැම්බර්	612	09	626	-
10	ඔක්තෝබර්	626	07	635	-
11	නොවැම්බර්	635	0	313	322
12	දෙසැම්බර්	313	0	313	-

1.14.4.1. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

රණවිරුවන්ගේ විශ්ව විද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත වෙනත් උසස් අධ්‍යාපන පාඨමාලා සඳහා තේරිපත් වූ දරුවන් සඳහා මසකට රු.3000/- බැගින් ඔවුන්ගේ පාඨමාලා කාලය තුල උපරිම වාරික 48 ක් ඇතුලත් වනසේ ශිෂ්‍යාධාර ලබාදේ.

1.14.5.දිස්ත්‍රික්ක හා පළාත් අනුව උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර බෙදී යාම

පළාත	දිස්ත්‍රික්කය	ලබාදුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය	මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය
බස්නාහිර	කොළඹ	22	111
	ගම්පහ	59	
	කළුතර	30	
මධ්‍යම	මහනුවර	39	71
	මාතලේ	17	
	නුවර එළිය	15	
දකුණ	ගාල්ල	38	82
	මාතර	24	
	හම්බන්තොට	20	
නැගෙනහිර	මඩකලපුව	04	29
	අම්පාර	19	
	ත්‍රිකුණාමළය	06	
වයඹ	කුරුණෑගල	49	63
	පුත්තලම	14	
උතුරු මැද	අනුරාධපුර	53	65
	පොළොන්නරුව	12	
ඌව	බදුල්ල	43	59
	මොණරාගල	16	
සබරගමුව	රත්නපුර	19	50
	කෑගල්ල	31	
			530

1.15. කුසලතා ප්‍රවර්ධන ණය

අපොස සාපෙළ, උපෙළ මට්ටමින් හා උසස් අධ්‍යාපන කටයුතු අවසන් කරන ලද රණවිරු දරුවන් සඳහා විවිධ පාඨමාලා ඔස්සේ තම අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යමින් තම අනාගතය අධ්‍යාපනික මාර්ගයක් ඔස්සේ සැලසුම් කරගැනීමට දිරිදෙමින් ඔවුනට අවශ්‍ය පාඨමාලාව හැදෑරීම සඳහා මූල්‍යමය වශයෙන් සහනයක් වීම අරමුණු කරගනිමින් පාඨමාලා ගාස්තුවට අදාලව රු.500,000.00ක උපරිමයකට යටත්ව අධ්‍යාපන ණය ලබාදීම හා ලැප්ටොප් හා අධ්‍යාපනික පරිසණක උපකරණ ලබා ගැනීමට රු.300,000.00කට යටත්ව ණය මුදලක් ලබාදීම මෙම ව්‍යාපෘතියෙන් සිදු කරයි.

1.15.1.දිස්ත්‍රික්ක හා පළාත් අනුව කුසලතා ප්‍රවර්ධන ණය බෙදී යාම

පළාත	දිස්ත්‍රික්කය	ලබාදුන් ණය ප්‍රමාණය	මුළු ශිෂ්‍යත්ව ප්‍රමාණය
බස්නාහිර	කොළඹ		06
	ගම්පහ	04	
	කළුතර	02	
මධ්‍යම	මහනුවර	02	02
	මාතලේ		
	නුවර එළිය		
දකුණ	ගාල්ල		03
	මාතර	02	
	හම්බන්තොට	01	
නැගෙනහිර	මඩකලපුව		-
	අම්පාර		
	ත්‍රිකුණාමලය		
වයඹ	කුරුණෑගල	03	03
	පුත්තලම		
උතුරු මැද	අනුරාධපුර	01	02
	පොළොන්නරුව	01	
ඌව	බදුල්ල		01
	මොණරාගල	01	
සබරගමුව	රත්නපුර	01	01
	කෑගල්ල		
			18

1.15.2. 2024 වසර තුල ව්‍යාපෘතියේ කාර්යසාධනය

ව්‍යාපෘතියේ නම	මූල්‍ය			භෞතික		
	වාර්ෂික ඇස්තමේන්තුව රු.	**2024.12.31** දිනට කාර්යය සාධනය	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
ශිෂ්‍යාධාර ලබාදීම	36,500,000.00	36,393,500.00	99.70%	2500	2545	101%
කුසලතා ප්‍රවර්ධන ණය	15,000,000.00	5,707,099.00	38%	30	18	60%

1.16. ඉඩම් අංශය

1.16.1. හැඳින්වීම

රණවිරුවන් හා එම පවුල් වල ළඟම ඥාතීන් සම්බන්ධයෙන් රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය ඉටු කිරීමේදී වඩාත් විශේෂ වූ හා සංකීර්ණ වූ අංශයක් ලෙස එම පවුල් සඳහා වාසස්ථානයක් සපයාදීම දැක්විය හැකිය. එහෙත් බොහෝ විට නිවාස සකස් කර ගැනීම වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය මඟින් ක්‍රියාත්මක වන නිවාස ණය ව්‍යාපෘතිය මඟින් අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයා පදිංචියට නිවසක් සඳහා දිරිදුන්න ද එම නිවස ගොඩනැගීම සඳහා භූමියක් (ඉඩමක්) හිමි නැති අවස්ථාවල දී රණවිරුවා හා එම පවුල් වල ළඟම ඥාතීන් මහත් අසීරුතාවයට පත් වේ. තව ද ඉඩමක් නොමැති වීම හේතුවෙන් රණවිරුවන් වෙනුවෙන් ලබාදෙන නිවාස ආධාර ආදී සුභසාධන අවස්ථා ලබා ගැනීමට ඇති ඉඩකඩ අහිමි වන බවද හඳුනා ගෙන ඇත.

එම අවස්ථා හඳුනාගෙන රණවිරුවන්ගේ ඉඩම් අවශ්‍යතා කළමණාකරණය කිරීම සඳහා රණවිරු සේවා අධිකාරියේ ඉඩම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, ඒ තුළින් රණවිරුවන් වෙත සෘජුවම ඉඩම් කැබලි ලබාදීම හා වක්‍රව ඉඩම් ලබා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම සිදුකෙරේ.

1.16.2. ඉඩම් ලබා දීම

1.16.2.1. අධිකාරිය වෙත සෘජුවම පරිත්‍යාග කර ඇති ඉඩම් තාවකාලික බලපත්‍රයක් හා ඔප්පුවක් මඟින් රණවිරුවන් වෙත ලබාදීම.

1.16.2.1.1. බලංගොඩ ඉඩම්ලාභී රණවිරු මව වෙත තෑගි ඔප්පු පිරිනැමීම

රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කර ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ මැදකෝරලේ හෙල උඩ පත්තුවේ 254 පහල මස්සැන්න බලංගොඩ ග්‍රාම සේවා වසම තුල පිහිටි අබේසිංහහේන හෙවත් විලේගොඩ කැල්ල ඉඩමේ ලොට් අංක.07 දරණ ඉඩම් කොටස තාවකාලික බලපත්‍ර මඟින් ලබාදී තිබූ ක්‍රියාන්විත රාජකාරියේ දී දිවිපිදූ ඩබ්.බී.එස්.වීරකෝන් රණවිරුවාගේ මව වන ඒ.එස්.වයලට් මොරාල් මහත්මිය වෙත 2024.08.13 වන දින තෑගි ඔප්පුව පිරිනමන ලදී.





1.16.2.2. රණවිරුවන් වෙත වෙන්කර ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මහවැලි අධිකාරිය සතු රජයේ ඉඩම් ලබා දීම සඳහා 2024/01 චක්‍රලේඛයට අනුව මැදිහත් වීම.

1.16.2.3. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් රණවිරුවන් වෙත ලබා දීම සඳහා මැදිහත් වීම.

1.16.2.4. රණවිරුවන් විසින් භදුනා ගන්නා ලද ඉඩම් ලබා ගැනීම සඳහා අප අධිකාරියේ මැදිහත් වීම මත ඉඩම අයත් ආයතනය සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය නිර්දේශය ලබා දීම.

1.16.2.5. ඔප්පු/බලපත්‍ර ලබා දීමට අදාළ නිර්දේශ ලබා දීම

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2024/01 චක්‍රලේඛයට අනුව රජයේ ඉඩම් කොටස්වල පදිංචි වී ඇති රණවිරුවන් සඳහා රණවිරු සහන පදනම මත එම ඉඩමට අදාළ ඔප්පු/බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම.

1.16.2.6. රණවිරුවන් පදිංචි ඉඩම්වල පවතින ඉඩම් ගැටළු, ඉඩම් ආරවුල් විසඳීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය සහය වීම.

1.16.3. වසර තුළ කාර්යසාධනය

1.16.3.1. භදුනාගත් ඉඩම් සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ඉඩම් නොමැති රණවිරුවන්ගේ නාම ලේඛන යොමු කිරීම


ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	නාම ලේඛන යොමු කළ රණවිරුවන් ගණන
වනාතවිල්ලුව	05

1.16.3.2. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් පවත්වන ලද ඉඩම් කච්චේරි සඳහා සම්බන්ධ වීම.

ඉඩම් කච්චේරි පවත්වන ලද ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	**ඉඩමේ නම**	**දිනය**
මතුගම	හේන්පිට ඉඩම	2024.06.28
දඹුල්ල	දිගම්පතහ ඉඩම	2024.09.27

1.16.4. අංශයට අදාල ප්‍රගතිය

අ.අ	දිස්ත්‍රික්කය	ඉඩම් කොටස් ලබා දීම (ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත්)	ඉඩම් කොටස් ලබා දීමට අදාල නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම	ඔප්පු/බලපත්‍ර ලබා දීමට අදාල නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම	අධිකාරිය වෙත පරිත්‍යාග කර ඇති ඉඩම් ලබාදීම/ ඔප්පු ලබාදීම	ප්‍රතිලාභයේ වටිනාකම -මුද්දර ගාස්තු (රු)
01	ගම්පහ	-	-	03	-	-
02	කළුතර	09	-	09	-	-
03	මහනුවර	-	-	09	-	-
04	මාතලේ	-	-	03	-	-
05	නුවරඑළිය	-	02	05	-	-
06	ගාල්ල	-	02	09	-	-
07	මාතර	-	-	08	-	-
08	හම්බන්තොට	-	-	06	-	-
09	අම්පාර	-	01	22	-	-
10	ත්‍රිකුණාමලය		-	02		
11	කුරුණෑගල	-	-	09	-	-
12	පුත්තලම	-	02	02	-	-
13	අනුරාධපුරය	-	-	56	-	-
14	පොලොන්නරුව	-	01	34	-	-
15	බදුල්ල	-	01	20	-	-
16	මොණරාගල	-	01	19	-	-
17	රත්නපුර	-	02	05	01	6,600.00
18	කෑගල්ල	-	01	02	-	-
මුළු එකතුව		**09**	**11**	**222**	**01**	**6,600.00**



1.17. “විරු සහන” නිවාස ණය ව්‍යාපෘතිය

1.17.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියාන්විතයේදී මියගිය සහ ආබාධිත රණවිරුවන් සහ රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවාස සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතුව සහනදායී සේවා ගාස්තුවක් පමණක් අය කරමින් රණවිරු සේවා අධිකාරිය විසින් **“ විරු සහන නිවාස ණය”** වැඩසටහන ක්‍රියාත්මක කරයි.

අයදුම්කරුවන්ගේ අවශ්‍යතාවය මත නව නිවසක් ඉදි කිරීම, නිවස වැඩි දියුණු කර ගැනීම හා නිවස අලුත්වැඩියා කර ගැනීම සඳහා මෙම නිවාස ණය ක්‍රමයට අයදුම් කළ හැකිය. රණවිරු සේවා අධිකාරියේ දිස්ත්‍රික්ක භාර වැඩසටහන් නිලධාරින් හරහා ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා අනුව වාර්ෂිකව ණය අයදුම්පත් නිකුත් කරනු ලැබේ.


“විරු සහන නිවාස ණය” වැඩසටහන මඟින් එක් අයෙකුට උපරිමය රු. 700,000.00ක ණය මුදලක්, වාරික වශයෙන් වසර 04ක කාල සීමාවකින් අය වන පරිදි , 5% ණය පොලී අනුපාතයකට යටත්ව ක්‍රියාත්මක කරනු ලබයි

1.17.2. 2024 වසර තුල කාර්යය සාධනය

මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව (රු:ශත)	2024.12.31 දිනට කාර්යය සාධනය (රු: ශත)	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
75,000,000.00	63,500,000.00	85%	107	106	99%


1.17.3.විරු සහන නිවාස ණය ලබා දීම-2024 (දිස්ත්‍රික්ක අනුව)

ණය මුදල / දිස්ත්‍රික්කය	150,000	200,000	300,000	400,000	450,000	500,000	525,000	550,000	600,000	700,000	එකතුව
කොළඹ			01				01				2
ගම්පහ						01				09	10
කළුතර										02	02
මහනුවර		02	01		01					04	08
මාතලේ					01	01				05	07
නුවරඑළිය				01						01	02
ගාල්ල						01			01	02	04
මාතර			02							04	06
හම්බන්තොට						01				05	06
මොණරාගල										04	04
බදුල්ල			02				01			02	05
රත්නපුර		01		02		02				07	12
කෑගල්ල										07	07
අම්පාර						01				02	03
ත්‍රිකුණාමලය								01			01
මඩකළපුව											00
පුත්තලම				01						02	03
කුරුණෑගල		01	01							02	04
අනුරාධපුර	01	01		02	01	01			01	11	18
පොළොන්නරුව										02	02
එකතුව	**01**	**05**	**07**	**06**	**03**	**08**	**02**	**01**	**02**	**71**	**106**




1.17.4. ආබාධිත රණවිරුවන් සහ දිවිපිදූ රණවිරු ළඟම ඥාතීන් වෙත විරු සහන නිවාස ණය ලබා දී ඇති ආකාරය

ආබාධිත රණවිරුවන් ගණන (DIA)	77
රණවිරු ඥාතීන් ගණන (KIA)	27
එකතුව	106



1.17.5. .සේවාවන් අනුව විරු සහන නිවාස ණය ලබාදීම -2024

යුධ	92
නාවික	05
ගුවන්	02
පොලිස්	07
එකතුව	106



1.18. සනීපාරක්ෂක ආධාර ව්‍යාපෘතිය


1.18.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ක්‍රියන්විත හේතූන් මත සිය ශාරීරාංග කැප කර ආබාධිතව සිටින රණවිරුවන්ගේ කායික සහ මානසික තත්වයන් හේතු කොට ගෙන ඔවුන් හට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සලසා ගැනීම සඳහා රණවිරු සේවා අධිකාරිය තුලින් ඔවුන් හට ලබා දෙන සේවාවක් ලෙස සනීපාරක්ෂක පහසුකම් සැලසීම ව්‍යාපෘතියේ දැක්විය හැක.සාමාන්‍ය වැසිකිළි පහසුකම් මගින් සනීපාරක්ෂක පහසුකම් සලසාගත නොහැකි කායික ආබාධිතතාවන්ගේ පෙලෙන ආබාධිත විශ්‍රාමික රණවිරුවන් සඳහා පමණක් ඔවුන්ගේ ආබාධිත තත්වයන්ට ගැලපෙන ලෙස වැඩිදියුණු කරන ලද සනීපාරක්ෂක පහසුකම් සකසා ගැනීම වෙනුවෙන් ආධාර ලබාදීම අරමුණු කරගත් වැඩසටහනක් වන මේ මගින්, සනීපරක්ෂ පහසුකම් අලුතින්ම ගොඩනගා ගැනීමට එනම්, කොමඩ් පහසුකම් සහිත ඉදිකර ගැනීම සඳහා රු 100,000 ක මූල්‍ය ආධාර මුදලක් ද ,අලුත් වැඩියා කටයුතු සඳහා රු 50,000 ක මූල්‍ය ආධාරයක්ද ලබා දීම මේ මගින් සිදු කෙරේ.

1.18.2. 2024 වසර තුල කාර්යය සාධනය


සනීපාරක්ෂක අංශය					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව රු	2024.12.31 දිනට කාර්යය සාධනය රු	ප්‍රගතිය (%)	වාර්ෂික ඉල්ලකය	කාර්යය සාධන	ප්‍රගතිය (%)
20,000,000.00	10,771,000.00	53%	240	144	60%

දිස්ත්‍රික්ක	25,000	50,000	96,000	100,000
කොළඹ		3		2
ගම්පහ				4
කළුතර		4		5
මහනුවර		3		1
මාතලේ		4	1	3
නුවරඑළිය		2		
ගාල්ල	1	3		2
මාතර		7		5
හම්බන්තොට		3		2
මොණරාගල		1		
බදුල්ල		2		
රත්නපුර		1		3
කෑගල්ල		9		4
අම්පාර		4		3
ත්‍රිකුණාමලය		-		-
මඩකලපුව		-		-
පුත්තලම		2		1
කුරුණෑගල		2		2
අනුරාධපුර		22		30
පොළොන්රුව		1		2
එකතුව	1	71	1	69



1.18.3. සේවාවන් අනුව සනීපාරක්ෂක ආධාර ලබාදීම -2024

යුධ	129
නාවික	-
ගුවන්	1
පොලිස්	12
එකතුව	142



1.19. විරුසර කාඩ්පත

1.19.1.ව්‍යාපෘතිය හැඳින්වීම

2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන මගින් රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන් ගේ රණවිරු අනන්‍යතාවය තහවුරු කරමින් කාඩ්පතක් නිකුත් කිරීම සිදුකරයි. 'විරුසර කාඩ්පත්' හිමියන්ට හා පවුලේ සාමාජිකයන්ට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙතින් විවිධ වරප්‍රසාද ලබා ගැනීම සඳහා වරප්‍රසාද කාඩ්පතක් ලෙස 'විරුසර කාඩ්පත' භාවිතා කල හැකි වේ. මෙම ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

1.19.1.1. පළමු අදියර

යුධමය කාලසීමාව තුළ ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තුමේන්තුව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවයේ යෙදී සිටියදී ජීවිත පරිත්‍යාග කල සහ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ලඟම ඥාතීන් හෝ භාරකරුවන් වෙත සහ ක්‍රියාන්විතයේදී රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ සුභසාධනය උදෙසා පළමු අදියර ක්‍රියාත්මක විය.


1.19.1.2. දෙවන අදියර

1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල යහපත් පැවැත්මෙන් යුතුව සේවය කර විශ්‍රාම ගිය හා එම වකවානුව අතුලත ත්‍රිවිධ හමුදාවට, පොලීසියට සහ සිවිල් ආරක්ෂක බලකායට බැදී තව දුරටත් සේවයේ යෙදී සිටින සියලුම රණවිරුවන්ට හා ඉහත කාල සීමාව තුලදී ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරියේ යෙදී සිටියදී මියගිය, අතුරුදහන් හා ආබාධිත සිවිල් සේවක මහතුන් වෙත මෙම අධියර යටතේ විරුසර කාඩ්පත ප්‍රදානය කරනු ලබයි.

නිලධාරීන් සඳහා නියමිත වසර 20 ක හෝ සෙසු නිළයන් සඳහා නියමිත වසර 22 ක් සහ කාන්තා අයවලුන් හට වසර 15 ක සේවා කාලය සපුරා දැනට විශ්‍රාම ගොස් සිටින හෝ සේවයේ යෙදී සිටින රණවිරුවන් වෙත සහ පොලීසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරියේ යෙදී සිටියදී මියගිය, අතුරුදහන් හා ආබාධිත සිවිල් සේවක මහතුන් වෙත දෙවන අදියර යටතේ පිරිනමනු ලබන මෙම කාඩ්පත ලබාගැනීමේදී ඒකක, රෙජිමේන්තු සහ අදාල ආරක්ෂක අංශයන්හි සුභසාධන අංශ හරහා අයදුම්පත රණවිරු සේවා අධිකාරිය වෙත ඉදිරිපත් කල යුතුය.


- ❖ 2023.04.28 තෙක් නිකුත් කරන ලද පැරණි කාඩ්පත් වසර 05ක් සඳහා පමණක් වලංගු වූ අතර, වසර 05න් පසු වලංගු කාල සීමාව අවසන් වන බැවින් නව කාඩ්පතක් ලබා ගැනීම සිදු කල යුතු විය. නමුත් 2023.04.28 දින සිට නිකුත් කරනු ලබන නව කාඩ්පත් කල් ඉකුත්වීමක් සිදුනොවේ.


පැරණි කාඩ්පත





නව කාඩ්පත





විරුසර කාඩ්පත් මුද්‍රණය කිරීම රණවිරු සේවා අධිකාරියෙහි විරුසර කාඩ්පත් අංශය තුල 2023 අප්‍රේල් මස දක්වා සිදුකල අතර එම කාඩ්පත් මුද්‍රණය කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය වල මිල ඉහලයාම සහ කාඩ්පතෙහි කල්පැවැත්ම පිලිබඳ ඇතිවූ ගැටළු හේතුවෙන් බොරැල්ලේ පිහිටි ADL ආයතනය වෙතින් විරුසර කාඩ්පත් මුද්‍රණය කිරීම ආරම්භ කරන ලදී. රණවිරු සේවා අධිකාරියෙහි විරුසර කාඩ්පත් අංශය මගින් කාඩ්පත සැකසීම සදහා අවශ්‍ය සියලුම කාර්යයන් සිදුකර කාඩ්පත් මුද්‍රණය කිරීමට පමණක් එම ආයතනය වෙත යොමු කරනු ලබයි.

1.19.2. ADL ආයතනය මගින් 2024 වර්ෂයේදී මුද්‍රණය කර ඇති කාඩ්පත් ප්‍රමාණය සහ ගෙවා ඇති මුදල් ප්‍රමාණය

දිනය	කාඩ්පතක මිල	කාඩ්පත් ප්‍රමාණය	ගෙවූ මුදල
2024.01.29	160.00	1040	166400.00
2024.04.04	160.00	1040	166400.00
2024.05.13	160.00	1072	171520.00
2024.07.18	160.00	1072	171520.00
2024.08.11	160.00	2050	328000.00
2024.11.18	160.00	1131	180960.00
එකතුව	**160.00**	**7405**	**1184800.00**

1.20. මාපිය සුරැකුම වැඩ සටහන

1.20.1. හැදින්වීම

දීර්ඝ කාලයක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදය පරාජය කිරීමෙහිලා උතුම් ජීවිතය පරිත්‍යාගයෙන් කටයුතු කරන ලද රණවිරුවන්ගේ ඇතැම් දෙමව්පියන් ආර්ථිකමය හා මානසික වශයෙන් පීඩාවට පත්ව සිටී. ඔවුන්ගේ සැදෑ සමය ආර්ථික හා මානසික වශයෙන් තෘප්තිමත් භාවයකින් යුතුව ගත කිරීම සඳහා පිටුවහලක් වීම අරමුණු කොටගෙන මෙම සුභසාධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත 2007 වසරේ නොවැම්බර් මස 21 වන දින සිට රණවිරුවාගේ වැටුපෙන් 25% ක් ගෙවනු ලැබේ. මෙම කාලසීමාවට පෙර මියගිය විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන්ට කිසිදු දීමනාවක් නොලැබෙන අතර රණවිරු සේවා අධිකාරිය මගින් එම දෙමව්පියන්ට කෘතගුණ සැලකීමක් වශයෙන් මාපිය සුරැකුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් තම දරුවාගෙන් යැපුනු මෙම දෙමව්පියන් ආර්ථික වශයෙන් යම් මට්ටමකට ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

2024 වර්ෂයේ දී මෙවැනි රණවිරු දෙමව්පියන් 488 ක සාමාන්‍ය අගයකින් යුතු ප්‍රමාණයකට මාපිය සුරැකුම දීමනාව ලබා දීමට කටයුතු කර ඇත.

1.20.2. 2025 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා විස්තර වාර්ථාව

විස්තරය		**1500** බැඟින් ගෙවූ ප්‍රමාණය	මුදල (රුපියල්)	**2250** බැඟින් ගෙවූ ප්‍රමාණය	මුදල (රුපියල්)	සම්පූර්ණ ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මාසිකව ගෙවූ මුලු මුදල
1	ජනවාරි	219	328,500.00	246	553,500.00	465	882,000.00
2	පෙබරවාරි	231	346,500.00	263	591,750.00	494	938,250.00
3	මාර්තු	231	346,500.00	260	585,000.00	491	931,500.00
4	අප්‍රේල්	236	354,000.00	261	587,250.00	497	941,250.00
5	මැයි	236	354,000.00	262	589,500.00	498	943,500.00
6	ජුනි	237	355,500.00	260	585,000.00	497	940,500.00
7	ජුලි	234	351,000.00	260	585,000.00	494	936,000.00
8	අගෝස්තු	237	355,500.00	260	585,000.00	497	940,500.00
9	සැප්තැම්බර්	237	355,500.00	257	578,250.00	494	933,750.00
10	ඔක්තෝබර්	237	355,500.00	250	562,500.00	487	918,000.00
11	නොවැම්බර්	229	343,500.00	248	558,000.00	477	901,500.00
12	දෙසැම්බර්	221	331,500.00	244	549,000.00	465	880,500.00
එකතුව			**4,177,500.00**		**6,909,750.00**		**11,087,250.00**

2. පුනරුත්තාපන හා සුබසාධන අංශය

2.1. අංශය හැදින්වීම

මාතෘ භූමියේ සෛවරීභාවය, ඒකීයභාවය සහ භෞමික අඛණ්ඩතාවය සුරක්ෂිත කිරීම වෙනුවෙන් තම උත්තරීතර ජීවිතය පූජාකළ රණවිරුවන්ගේ රණවිරු නාමය සදාතනික කරමින් එම රණවිරු පවුල් සාමාජිකයින් ගේ සුබසාධන කටයුතු ඉටුකර සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා යුධ ආබාධිත තත්ත්වය හේතුවෙන් රණක්ෂිතයට පත් වූ රණවිරුවන්ගේ සුබසාධන කටයුතු ඉටුකරමින් සමාජගතකිරීමත්, සමාජය තුළ ගෞරවනීය වූත් අභිමානයෙන් යුතුවූත් සමාජ පසුබිමක් උරුමකර දීමත්, එම රණවිරු පවුල් සාමාජිකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරුකිරීමත් මෙම අංශයේ අරමුණු වේ.

මෙම කර්තව්‍ය ඉටු කිරීමේදී ග්‍රාමීය වශයෙන් විසිරී සිටින රණවිරු පවුල් ඒකරාශී කොට , සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි රණවිරු සංසද පිහිටුවා දිවයින පුරා විධිමත් රණවිරු සංසද ජාලයක් ක්‍රියාත්මක කිරීම, එමගින් ප්‍රාදේශීය, දිස්ත්‍රික් , පලාත් හා ජාතික මට්ටමින් වැඩසටහන් සංවිධානය කිරීම සහ ආයතනික සුබසාධන ව්‍යාපෘති සහ රණවිරුවන් විෂයෙහි සිදුකරනු ලබන රාජ්‍ය හා ආයතනික ක්‍රියාවලීන් රණවිරුවන් වෙත ප්‍රවේශ කිරීම සඳහා දිස්ත්‍රික් වැඩසටහන් නිළධාරීන් සම්බන්ධීකරණය හා එම කටයුතු අධීක්ෂණය කිරීම යන කාර්යයන් මෙම අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

2.2. සංසද මගින් ක්‍රියාත්මක වැඩසටහන් වර්ග

2.2.1. වෛද්‍ය වැඩසටහන්

- ආයුර්වේද වෛද්‍ය සායන
- සෞඛ්‍ය උපදේශන වැඩසටහන්
- අක්ෂි සායන

2.2.2. ක්‍රීඩා වැඩසටහන්

- අන්තර් සංසද ක්‍රිකට් තරගාවලි
- අන්තර් සංසද වොලිබෝල් තරගාවලි

2.2.3. ආගමික වැඩසටහන්

- සංඝගත දක්ෂිණා
- බෝධි පූජා පිංකම්
- පහන් පූජා

2.2.4. මනෝ සමාජයීය වැඩසටහන්

- රණවිරු අනුස්මරණ උත්සව
- ළමා හා වැඩිහිටි නිවාස සඳහා ආහාර, ඇදුම් හා වියළි සලාක ලබාදීම
- දන් සැල්
- සංසද සුහද හමු

- විනෝද චාරිකා
- දූ දරු කුසලතා එළිදැක්වීම්
- සංගීත හා ගීත රසවින්දන වැඩසටහන්
- මනෝ උපදේශන වැඩසටහන්
- නත්තල් උත්සව
- වෙසක්/පොසොන් බැති ගී
- නත්තල් කැරොල් වැඩසටහන්
- බක්මහ උත්සව
- ආධුනික ගී ප්‍රසංග
- රෝහල් පරිශ්‍ර පිරිසිදු කිරීම
- විශෙෂ අවශ්‍යතා සහිත දරුවන් සදහා අවශ්‍ය දෑ ලබාදීම
- ආතති කළමණාකරණ වැඩසටහන්
- සංසද නිළධාරී පුහුණු වැඩසටහන්
- වාහන ප්‍රමුඛතා ස්ටිකර් බෙදා දීම

2.2.5. වෙනත් ආයතන සම්බන්ධීකරණයෙන් සිදු කරනු ලබන වැඩසටහන්

- කෘෂිකාර්මික වැඩමුලු - ගෙවතු වගා, ගම්මිරිස් වගාව,පැලතවාන් සැකසීම,
- ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහන් හා ඉඩම් කච්චේරි
- කුඩා ව්‍යාපාර සංවර්ධන වැඩසටහන්
- පැසැල් ළමුන් සදහා පාසැල් උපකරණ ලබාදීම
- ජංගම සේවා
- ශිෂ්‍යාධාර ලබාදීම
- කෘෂි බෝග අපනයනය
- විශ්‍රාම වැටුප් ගැටලු විසදීමේ වැඩසටහන්
- සබන් හා සේදුම් දියර නිෂ්පාදනය
- ඩිජිටල් අලෙවිකරණය හා සමාජ මාධ්‍ය අලෙවිකරණ වැඩමුලුව

2.3. සංසද වාර, ජංගම සේවා, ක්ෂේත්‍ර නිරීක්ෂණ හා ඉල්ලුම්පත් නිකුත්කිරීම හා ප්‍රතිලාභ ලබාදීම

අනු අංකය	දිස්ත්‍රික්කය	අයත් සංසද ගණන	සහභාගී වූ සංසද රැස්වීම් ගණන	ජංගම සේවා ප්‍රමාණය	ක්ෂේත්‍ර නිරීක්ෂණ ප්‍රමාණය	ඉල්ලුම්පත් නිකුත්කළ ප්‍රමාණය	ප්‍රතිලාභ ලබාදුන් ප්‍රමාණය
01	කොළඹ	13	77	1	75	313	248
02	ගම්පහ	12	81	1	33	573	396
03	කලුතර	14	22	0	11	311	245
04	ගාල්ල	19	51	1	8	217	110
05	මාතර	13	47	1	13	336	210
06	හම්බන්තොට	12	42	1	31	127	198
07	මහනුවර	20	44	1	39	325	229
08	මාතලේ	10	25	1	16	81	24
09	නුවරඑළිය	05	28	0	12	146	104
10	කෑගල්ල	11	11	1	6	217	120
11	රත්නපුරය	17	33	1	58	334	204
12	අනුරාධපුරය 1	13	97	2	34	370	348
13	අනුරාධපුරය2	13	114	1	70	466	427
14	පොළොන්නරුව	8	58	0	26	386	255
15	බදුල්ල	14	28	0	61	301	212
16	මොණරාගල	11	30	1	14	200	132
17	අම්පාර	11	19	1	6	450	332
18	පුත්තලම	15	53	0	22	293	205
19	කුරුණෑගල	30	9	1	3	432	220
20	ත්‍රිකුණාමලය	9					
21	මඩකලපුව	01					
22	වව්නියාව	01	2	0	15	27	1
	එකතුව	**272**	**871**	**15**	**553**	**5905**	**4220**

2.4. 2024 වර්ෂයේ සංසද සභාගීත්වයෙන් පැවැත් වූ වැඩසටහන් ප්‍රමාණය

අ.අ.	දිස්ත්‍රික්කය	වෛද්‍ය සායන හා වැඩමුලු	ක්‍රීඩා වැඩ සටහන්	ආගමික වැඩසටහන්	මනෝ සමාජයීය වැඩසටහන්	බාහිර ආයතන සම්බන්ධීකරණ වැඩසටහන්	මුලු වැඩ සටහන් ගණන
1	කොළඹ	3	0	21	45	0	69
2	ගම්පහ	1	0	7	13	1	21
3	කලුතර	0	0	0	0	3	3
4	ගාල්ල	0	0	0	3	0	3
5	මාතර	0	1	1	3	1	6
6	හම්බන්තොට	0	0	3	3	2	8
7	මහනුවර	0	0	5	6	1	12
8	මාතලේ	0	0	2	5	0	7
9	නුවරඑළිය	3	0	2	1	4	10
10	කෑගල්ල	0	0	0	0	0	0
11	රත්නපුරය	01	0	4	5	2	12
12	අනුරාධපුරය 1	15	1	5	13	0	36
13	අනුරාධපුරය2	15	0	3	17	6	41
14	පොළොන්නරුව	1	0	3	6	4	14
15	බදුල්ල	2	1	2	3	2	10
16	මොණරාගල	0	0	1	3	0	4
17	අම්පාර	0	0	0	3	0	3
18	පුත්තලම	0	0	2	5	0	7
19	කුරුණෑගල	0	0	0	3	1	4
20	ත්‍රිකුණාමලය						0
21	මඩකලපුව						0
22	වව්නියාව						0
	එකතුව	**41**	**3**	**61**	**137**	**27**	**270**

2.5. රණවිරු ප්‍රජා සංවර්ධන (ජංගම සේවා)

මාතෘ භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම වෙනුවෙන් සටන්වැද රණක්ෂිතයටපත් රණවිරුවන් සහ දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් වෙත සුභසාධන කටයුතු සිදුකිරීමේ අරමුණින් පළාත් 08 ක රණවිරු සංසද 268 ක් ආවරණය කරමින් ජංගම සේවා පවත්වා දීප ව්‍යාප්තව සිටින සේවාලාභීන් වෙනුවෙන් සංසද නිලධාරී, සමාජික ගැටළු හඳුනාගැනීම නිරාකරණය කිරීම හා ආයතන සම්බන්ධීකරණය කිරීම ප්‍රජා සංවර්ධන (ජංගම සේවා) ව්‍යාපෘතිය යටතේ සිදුකරයි. රණවිරු ප්‍රජාසංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරමින් රණවිරු ප්‍රජාවගේ ගැටළුව හඳුනාගෙන අවශ්‍ය අංශ (රාජ්‍ය හෝ පෞද්ගලික) සම්බන්ධීකරණය සිදුකරමින් ඔවුන්ගේ ගැටළු නිරාකරණය කිරීම.

2.5.1. 2024 වසර තුළ කාර්යය සාධනය

රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන					
මූල්‍ය			භෞතික		
වාර්ෂික ඇස්තමේන්තුව (රු)	2024.12.31 දිනට කාර්යය සාධනය (රු)	ප්‍රගතිය (%)	වාර්ෂික ඉලක්කය	කාර්යය සාධනය	ප්‍රගතිය (%)
5,000,000.00	3,228,403.16	64.60%	20	13	65%

* 2024 වර්ෂයේ ජනාධිපතිවරණය හේතුවෙන් සියළු ප්‍රජා සංවර්ධන වැඩසටහන් තාවකාලිකව නවත්වන ලදී.

3. පාලන අංශය

3.1. මානව සම්පත් අංශය

3.1.1. අංශය හැඳින්වීම

සාම්ප්‍රදායික ලෙස රජයේ ආයතනවල පවතින විවිධාකාරයේ හේතූන් මත කාර්යාලීය වැඩ පරිසරය ගැටලුකාරී තත්වයන්ගෙන් පිරී පවතී. ඒ අනුව අප ආයතනයේද මානව සම්පත දැඩි පීඩනයන්ට ලක්ව රාජකාරී කරනු ලැබේ. එය ආයතනයේ අරමුණ හා ඉලක්ක හඹා යාමේදී මානව සම්පත තුලින් කාර්යක්ෂම සහ ඵලදායි රාජ්‍ය සේවයක් ලබා ගැනීමට මහත් බාධාවක්ව පවතී.

එම තත්වයන්ගෙන් මානව සම්පත මුදවාගෙන කාර්යක්ෂම සහ ඵලදායි රාජ්‍ය සේවයක් ආයතනය වෙත ලබාගැනීම සඳහා ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කර සංවර්ධනය කිරීම සඳහා විවිධ ආකාරයේ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

3.1.2. මානව සම්පත් සංවර්ධන ක්‍රමවේදය

- එක් එක් පුද්ගලයන් තෝරාගත් පුහුණු වැඩසටහන් සඳහා විවිධ ආයතන වලට යොමු කිරීම.
- ආයතනය තුළ කණ්ඩායම් පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- 2024 වසර තුළ කාර්යය සාධනය
- කණ්ඩායම් පුහුණු (ආයතනය තුළ) වැඩසටහන් පැවැත්වීම

3.1.2.1. කණ්ඩායම් පුහුණු (ආයතනය තුළ) වැඩසටහන් පැවැත්වීම

අනු අංකය	දිනය	සම්පත්දායකගේ නම	දේශන මාතෘකාව	සම්පත්දායක දීමනා ගෙවීම
01	2024.04.26	මිලින්ද රාජපක්ෂ මහතා	ධනාත්මක චින්තනය, සාකච්ඡා මාර්ගයෙන් ගැටලු විසඳීම, සන්නිවේදනය හා උපාය මාර්ගික චින්තනය	
02	2024.05.03	එම්.එම් ආනන්ද විජිත කුමාර මාපා මහතා අධ්‍යක්ෂ (සැලසුම්) වාරිමාර්ග අමාත්‍යාංශය	සාර්ථක හා ඵලදායී සේවා සපයන්නෙක් වීම සඳහා ඔබ සතු විය යුතු කුසලතා, ගුණාංග සහ ආකල්ප	4000.00
03	2024.06.14	යුධ හමුදා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් Zoom තාක්ෂණයෙන්	අභ්‍යන්තර ලිපි හුවමාරු මෘදුකාංගය පිළිබඳව අවබෝධයක් ලබා දීම	
04	2024.06.28	ඩී.එස් පත්මසිරි මහතා (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය - විශේෂ ශ්‍රේණිය) ප්‍රධාන මූල්‍ය නිලධාරී ආරක්ෂක අමාත්‍යාංශය	බඩු වට්ටෝරු ලේඛන පවත්වාගෙන යාම හා ගබඩාකරණය	4500.00
05	2024.07.19	භාතිය අර්ථනායක මහතා	ඉලක්ක හා අරමුණු හඹා යාමේදී අන්තර්පුද්ගල සම්බන්ධතාවයේ ඇති වැදගත්කම හා ධනාත්මක චින්තනය	5500.00

අනු අංකය	දිනය	සම්පත්දායකගේ නම	දේශන මාතෘකාව	සම්පත්දායක දීමනා ගෙවීම
06	2024.08.16	ආචාර්ය කේ.ඒ තිලකරත්න මහතා	විවෘත හා වගකිවයුතු රජයක් සඳහා නිලධාරීන්ගේ වගකීම කඩිනමින් ක්‍රියාවට නැංවීම	4000.00
07	2024.09.06	ධනංජය බණ්ඩාර මහතා අංශ ප්‍රධානී,ව්‍යාපාර සංවර්ධන - රාජ්‍ය අංශය	අග්‍රහාර රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම	
08	2024.12.27	මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතා	සෞන්දර්ය, සුවදායී මානසිකත්වය හා ඵලදායී රාජ්‍ය සේවය පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළුව	6000.00
			මුළු වැය දැරීම	24,000.00

3.1.2.2. පුහුණු වැඩසටහන් සඳහා පිටත ආයතනවලට යොමු කිරීම

ස්ථිර කාර්ය මණ්ඩල පුහුණු (2024)
රණවිරු සේවා අධිකාරිය

අනු අංකය	මාසය	පාඨමාලාව පැවැත්වූ දිනය	පාඨමාලාවේ නම	පුහුණු ආයතනය	සහභාගීවූ නිලධාරී නිලධාරිනියන්ගේ නම	වැයවූ මුදල
01	ජූනි	2024.06.12	නිවාඩුභාර නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	ඩී.එල්.එම් චතුරානී කළමනාකරණ සහකාර I	රු.5,000.00
02	ජූනි	2024.06.24	පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වාගෙන යාම	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	සී.කේ ඇපාසෙනෙවිරත්න කළමනාකරණ සහකාර	රු.5,000.00
03	ජූනි	2024.06.25	ලිපිගොනුකරණය	ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	පී.එන්.ඊ.දාබරේ වැඩසටහන් නිලධාරී ජේ.ඒ.ඩී.එම්.සී.කුමාරි වැඩසටහන් නිලධාරී පී.පී.එස්.පතිරාජ වැඩසටහන් නිලධාරී ඊ.ඩී.එස්.වයිමන් වැඩසටහන් නිලධාරී වී.එස්.නිමන්තිකා කළමනාකරණ සහකාර පී.යූ.එස්.පනාවල කළමනාකරණ සහකාර	රු.5,000.00 X6 රු. 30,000.00
					ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය වෙත ගෙවූ මුළු මුදල	40,000.00


අනු අංකය	මාසය	පාඨමාලාව පැවැත්වූ දිනය	පාඨමාලාවේ නම	පුහුණු ආයතනය	සහභාගීවූ නිලධාරී නිලධාරිනියන්ගේ නම	වැයවූ මුදල
01	ජූනි	2024.06.24 2024.06.25	අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන ක්‍රම	නිපුණතා සංවර්ධන අරමුදල	එම් විනිතා කළමනාකරණ සහකාර	රු.13,000.00
02	අගෝස්තු	2024.08.14 2024.08.15	බඳවා ගැනීමේ පටිපාටිය	නිපුණතා සංවර්ධන අරමුදල	ඩබ්.ඩී.එච් ගුණදාස නියෝජ්‍ය අධ්‍යක්ෂ	රු.13,000.00
03	සැප්තැම්බර් ඔක්තෝම්බර්	2024.09.30 2024.10.01	ගබඩා කළමනාකරණය,වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය පිළිබඳ	නිපුණතා සංවර්ධන අරමුදල	දිල්හානි පෙරේරා කළමනාකරණ සහකාර	රු.13,000.00
04	සැප්තැම්බර් ඔක්තෝම්බර්	2024.09.25 2024.10.02 2024.10.09 2024.10.16	Secretarial Practices	නිපුණතා සංවර්ධන අරමුදල	දිලිනි අප්සරා වැඩසටහන් නිලධාරී	රු.25,000.00
05	ඔක්තෝම්බර්	2024.10.29 2024.10.30	කාර්යාල කාර්ය සහයකයින්ගේ කාර්යභාරය හා වගකීම.	නිපුණතා සංවර්ධන අරමුදල	භාග්‍යා තිලිණි කාර්යාල සහායක එස්.ඩබ්.වයි.කේ.පී සුදුසිංහ කාර්යාල සහායක	රු.13,000x 2 රු.26,000.00
07	සැප්තැම්බර් ඔක්තෝම්බර් නොවැම්බර්	2024.09.27 සිට සිකුරාදා දින 10ක්	රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	නිපුණතා සංවර්ධන අරමුදල	ධම්මිකා ෂෙල්ටන් ධම්මිකා ශෙල්ටන් නියෝජ්‍ය අධ්‍යක්ෂ නදිශා ඉඳුනිල් ගිණුම් නිලධාරී	රු40,000.00x2 රු. 80,000.00
					නිපුණතා සංවර්ධන අරමුදල වෙත ගෙවූ මුළු මුදල	රු. 18 3,000.00

අනු අංකය	මාසය	පාඨමාලාව පැවැත්වූ දිනය	පාඨමාලාවේ නම	පුහුණු ආයතනය	සහභාගීවූ නිලධාරී නිලධාරිනියන්ගේ නම	වැයවූ මුදල
01	අගෝස්තු	2024.08.13,14,15	Government Payroll System	Metropolitan Campus KDU	මධුකා වතුරාණි,කළමනාකරණ සහකාර	රු.18,000.00
02	නොවැම්බර්	2024.11.25 2024.12.	Advanced Ms Excel	Metropolitan Campus KDU	අසංග කුමාර,කළමනාකරණ සහකාර ප්‍රියංගිකා දිල්හානී, කළමනාකරණ සහකාර	රු.26,000.00
03	දෙසැම්බර්	2024.12.05,06 හා 07	Public Financial Regulation	Metropolitan Campus KDU	වෂිකා ජයසිංහ ශිණුම් නිලධාරී මධුෂා වතුරංගී කළමනාකරණ සහකාර	රු.18,000X 2 රු. 36,000.00
04	දෙසැම්බර්	2024.12.16 හා 17	Board of Survey Los.& Writ.Of	Metropolitan Campus KDU	දිල්හානි පෙරේරා කළමනාකරණ සහකාර	13,000.00
				මෙම්ටොපොලිටන් කැම්පස් KDU		රු. 93,000.00
		කාර්ය මණ්ඩලය සිටින ආයතන වෙත යොමු කර පුහුණු පාඨමාලා ලබා දීම වෙනුවෙන් මුළු වැය දැරීම				316,000.00

3.1. තොරතුරු තාක්ෂණ හා මාධ්‍ය අංශය

3.1.1. හැඳින්වීම

විධිමත් ව පද්ධති හසුරවමින් ආයතනයේ සුභසාධනය සඳහා මනා සහයෝගයෙන් සේවකයන් කාර්යක්ෂමව සාර්ථකත්වයට යොමු කිරීම සිදුවේ. මෙහිදී නව ක්‍රමවේදයන් වලට අනුව තොරතුරු සන්නිවේදන තාක්ෂණයෙන් උපරිම ප්‍රයෝජන ගෙන සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීම සහ කෙටිකාලීන හා දිගුකාලීන පිරිවැය ඉතිරි කිරීම් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් තාර්කික ගොඩනැගීම.



3.2.2. කාර්යයභාරයන්

3.2.2.1. සුභසාධන කලමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.

රණවිරුවන් හා ඔවුන්ගේ පවුල් වල ඥාතීන් වෙත ඵලදායී සේවාවක් සැලසීම, ප්‍රතිලාභ නිසි පරිදි බෙදී යාම හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගයෙන් සුභසාධන කලමණාකරන තොරතුරු පද්ධතියක් නිර්මාණ කල ඇති අතර දත්ත ඇතුලත් කර ඇති අතර එහි ඉදිරි යාවත්කාලීන කිරීම් හා සංවර්ධනය කටයුතු සිදු කරමින් පවති. තවද මෙම දත්ත පද්ධතියේ අවස්ථානුකූලව සිදු කරන වෙනස් කම් සිදු කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදා තොරතුරු තාක්ෂණ අංශය වෙතින් සහාය ලබා ගනිමින් පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරනු ලබයි.

ප්‍රතිලාභ නිසි පරිදි බෙදී යාම සිදු කිරීම, අවශ්‍යතා හඳුනා ගනිමින් ඒ සඳහා විවිධ ව්‍යාපෘති සැලසුම් කිරීම වැනි ප්‍රතිලාභ රැසක් මෙම දත්ත පද්ධතිය තුලින් ආයතනය වෙත හිමි වේ.

මෙම දත්ත පද්ධතිය අන්තර්ජාල දත්ත පද්ධතියක් (Web Base Database Application) ලෙස ක්‍රියාත්මක වන අතර මෙය ස්ථාපනය කිරීමට අවශ්‍ය Server Space සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අනුග්‍රාහකත්වය දක්වා ඇත.

3.2.2.2. වෙබ් අඩවිය හා මුහුණු පොත නිර්මාණය කිරීම හා යාවත්කාලීන කිරීම.

ආයතන විසින් සලසන්නා වූ විවිධ වූ සේවාවන් පිළිබඳව හා ආයතනය පිළිබඳ තොරතුරු ඉතා නිවැරදි ලෙස දැන ගැනීම සඳහා වෙබ් අඩවිය හා මුහුණු පොත නිර්මාණය කර පවත්වාගෙන යාම තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරනු ලබයි.

3.2.2.3. ආයතනයේ අවශ්‍යතාව පරිදි සුදුසු මෘදුකාංග හඳුන්වාදීම හා නිර්මාණය කිරීම.

ආයතනයේ අංශයන් හි අවශ්‍යතාවයන් සඳහා සුදුසු මෘදුකාංග හඳුන්වාදීම හා ඒවා පරිගණක තුල ස්ථාපනය (Install) කර දීම තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරනු ලබයි.

3.2.2.4. ආයතනයේ තොරතුරු තාක්ෂණයට අදාල ආයතන සම්බන්ධීකරණය සිදු කිරීම.

තොරතුරු තාක්ෂණයට අදාලව ආයතන වෙතින් ඉල්ලුම් කරන තොරතුරු ලබා දීම හා එම ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සිදු කරනු ලබයි

3.2.2.5. ආයතනයේ පරිගණක අළුත්වැඩියා කටයුතු සිදු කිරීම හා අධීක්ෂණය කිරීම.

රණවිරු සේවා අධිකාරියට අයත් පරිගණක අළුත්වැඩියා කටයුතු ආයතනය තුලම සිදු කිරීම තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරනු ලබයි. මෙහිදී පරිගණක අළුත්වැඩියාවන් කඩිනමින් සිදු කොට ආයතනයේ කටයුතු බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම අරමුණ වේ.

පරිගණක අළුත්වැඩියාවන් සිදු කිරීමේ දී මිල දී ගැනීමට අවශ්‍ය උපාංග ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මිල දී ගැනීම් සිදු කරනු ලබයි.

3.2.2.6. රණවිරු සේවා අධිකාරියේ ජාලකරණ පද්ධතිය පවත්වාගෙන යාම.

ආයතනයේ පවතින සියලුම පරිගණක මේ වන විට ජාලගත කොට ඇති අතර දෛනිකව සිදු වන බිඳ වැටීම් සැකසීමත් ප්‍රධාන Server පද්ධතිය පවත්වාගෙන යාමත් සිදු කරනු ලබයි. තවද ආයතනයේ සියලුම පරිගණක ජාලය වෙත මේ වන විට අන්තර්ජාල පහසුකමද ලබා දී ඇත.

3.2.2.7. ආයතනික කාර්යක්ෂමතාවය හා පිරිවැය අඩුකිරීම සඳහා නවෝත්පාදන තොරතුරු තාක්ෂණ පද්ධති හා ගූගල් පෝරමයන් (Google From)/ පැතුරුම්පත් (Spreadsheet) නිර්මාණය කිරීම.

ආයතනයේ කාර්යක්ෂමතාවය හා පිරිවැය අඩුකිරීම සඳහා අංශයන්ගේ ඉල්ලීම මත සුදුසු තොරතුරු තාක්ෂණ පද්ධති මෙන්ම ගූගල් පෝරමයන් (Google From)/ පැතුරුම්පත් (Spreadsheet) නිර්මාණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශය විසින් සහයෝගය ලබා දීම සිදු කරයි.

3.2.2.8. ආයතනයේ මුද්‍රණ කාර්යයන්ට අදාල නිර්මාණ කටයුතු සිදු කිරීම.

ආයතනයේ විවිධ වූ මුද්‍රණ කාර්යන් සඳහා අවශ්‍ය ග්‍රැෆික් නිර්මාණ සැකසීම අංශය විසින් සිදු කරනු ලබයි. මේ වන විට ආයතනයේ නව හැඳුනුම්පතක් නිර්මාණය කිරීමේ කටයුතු සැලසුම් කොට ඇති අතර ආයතනයේ සම්පත් භාවිතයෙන් මෙම කටයුත්ත සිදු කිරීමට සැලසුම් කොට ඇත.

3.2.2.9. ආයතනයේ නිළධාරින් සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුවත් කිරීම් සිදු කිරීම.

ආයතනයේ නිළධාරින් සඳහා තොරතුරු තාක්ෂණය සම්බන්ධ දැනුම යාවත්කාලීන කිරීම තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරනු ලබයි. මෙහිදී මෘදුකාංග, දෘඩාංග මෙන්ම නව පද්ධති පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරනු ලබයි.

3.2.2.10. ආයතනයේ ප්‍රධාන විද්‍යුත් තැපෑල පරීක්ෂා කිරීම හා බෙදා හැරීම.

ආයතනයේ පවතින ප්‍රධාන විද්‍යුත් තැපෑල පරීක්ෂා කොට රණවිරු සේවා අධිකාරිය වෙත යොමු කරන ලද විද්‍යුත් ලිපි, තැපැල් අංශය වෙත ලබා දීම සිදු කරනු ලබයි.

3.2.2.11. Veteran Relationship Management System (VRMS) පවත්වාගෙන යාම.

මෙය දිස්ත්‍රික්යන් පුරා විසිරි සිටින ඉලක්ක ගත ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් කළමණාකරනය කිරීම සඳහා නිර්මාණය කරන ලද ගූගල් පැතුරුම්පතකි. (Google Spreadsheet)

මෙමඟින් දිස්ත්‍රික්ක පුරා ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම් දිස්ත්‍රික් නිලධාරින් හරහා හඳුනා ගැනීම, එම ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට ගතවූ කාලය ගණනය කිරීම, ප්‍රතිලාභ සඳහා වැය කරන ලද පිරිවැය ගණනය කිරීම හා විශ්ලේෂණ වාර්තා සැකසීමට භාවිතා කරනු ලබයි.

දැනට මෙම පද්ධතිය යාවත්කාලීන කරමින් හා සංවර්ධනය කරමින් පවති.

3.2.2.12. Welfare Management Information System (WIMS) ජංගම දුරකථන යෙදවුම සැකසීම.

ඉලක්කගත රණවිරු ප්‍රජාවගේ තොරතුරු ඔවුන් විසින්ම පද්ධතියට ඇතුළත් කිරීම හා රණවිරු සේවා අධිකාරිය මඟින් ඉල්ලුම් කරන ප්‍රතිලාභ සෘජුවම මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලීම් කිරීමට හැකි පරිදි නිර්මාණය කිරීමට නියමිත මෘදුකාංගයකි.

මෙම මෘදුකාංගය ආරක්ෂක පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙතින් සහයෝගය ලබා ගෙන සිදු කරනු ලබයි.

3.3. සැලසුම් අංශය

රණවිරු සේවා අධිකාරී පනතින් පවරන ලද කර්තව්‍ය ඉටු කිරීමෙහිලා සේවා ලාභීන්ගේ අවශ්‍යතාවයන් හඳුනාගනිමින් ආයතනයේ අනෙකුත් සියළු ම අංශයන්හි සහයෝගය ඇතිව විවිධ මනෝ සාමාජයීය, ආර්ථික කළමනාකරණ සහ සුභසාධන වැඩසටහන් සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම, ව්‍යාපෘති වාර්තා පිළියෙල කිරීම, අදාල අංශ සහ ආයතන වෙතින් අනුමත කරවා ගැනීම, ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මැදිහත්වීම හා සම්බන්ධීකරණය මෙන්ම ප්‍රගති සමාලෝචනය සහ පසුවිපරම් කිරීම මෙම අංශය වෙතින් සිදු කරනු ලබයි.

ඒ යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, ආයතනික සහ සේවා ලාභීන්ගේ අවශ්‍යතාවයක් පදනම් කර ගනිමින් ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීම, ක්‍රියාකාරී සැලැස්මේ මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික සහ වාර්ෂික ප්‍රගති වාර්තා පිළියෙල කර අදාල ආයතන වෙත යොමු කිරීම සිදු කරයි.

තවද වාර්ෂික වාර්තා සකස් කර විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට යොමු කිරීමත් අනතුරුව අනුමත වාර්ෂික වාර්තා මුද්‍රණය කර ආරක්ෂක අමාත්‍යාංශය මගින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කිරීමද සැලසුම් අංශය මගින් සිදු කරයි. මේ වන විට 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර ඇත.

මීට අමතරව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු 2024 වර්ෂයට අදාල අර්ධ වාර්ෂික සහ වාර්ෂික ප්‍රගති වාර්තා , කාර්යසාධන වාර්තා ඇතුළු අනෙකුත් සියළුම වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර ඇත.

එමෙන්ම 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇත.

4. සැපයුම් කාර්යය හා ප්‍රසම්පාදන අංශය

රාජ්‍යය ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, පටිපාටි හා ආයතනික ප්‍රතිපත්ති වලට අනුකූලව සේවා ලාභීන්ගේ අවශ්‍යතාවයන් කාර්යක්ෂම ලෙස ඉටු කරගැනීමට රණවිරු සේවා අධිකාරියේ හා අංශයන් වෙත සහය ලබාදීම ආයතනික අවශ්‍යතාවයන් මත සැපයුම්, ප්‍රවාහන, ප්‍රසම්පාදන හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මැදිහත්ව කටයුතු කිරීම මෙම අංශය මගින් සිදුකරයි.

4.1. 2024 වර්ෂය තුල සිදුකරන ලද මිලදිගැනීම්

අනු අංකය	ප්‍රසම්පාදන කාර්යය	වැය කරන ලද මුදල
1	ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම	803,643.92
2	වාහන අංගනය සැසීම	1,041,689.84
3	ශක්ති ජනක පානයක් මිලදී ගැනීම (බනි II අනිල් ප්‍රසන්න)	46,000.00
4	පරිගණක උපාංග මිලදී ගැනීම	127,926.16
5	සනීපාරක්ෂක ද්‍රව්‍ය මිලදී ගැනීම 2024	304,473.04
6	රණවිරු දියණියක් සඳහා ශක්ති ජනක පානයක් මිලදී ගැනීම	35,500.00
7	KD - 2279 ටොයෝටා ලැන්ඩ් ක්‍රෘෂර් රථය අළුත්වැඩියා කිරීම	49,750.00
8	රණවිරු සේවා අධිකාරියේ යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම	133,249.85
9	සමරු ඵලක මිලදී ගැනීම	18,500.00
10	රෝද පුටු හා කොමඩ් පුටු මිලදී ගැනිම 2024	6,822,750.00
11	අබාධිත රණවිරුවන්හට ලබා දීම සඳහා අත්වාරු 14 ක් සහ රෝදපුටු 03 ක් මිලදී ගැනීම	200,400.00
12	සංග්‍රහ කටයුතු සඳහා පීරිසි කෝප්ප මිලදී ගැනීම	46,000.00
13	රණවිරු කොඩි මුද්‍රණය කිරීම	470,000.00
14	රණවිරු සුහඳ හමුව සඳහා කෙටි ආහාර මිලදී ගැනීම	185,625.00
15	ආරක්ෂක ලේකම් තුමන් සහ රණවිරු නිලධාරීන් සඳහා දිවා අහාරය මිලදී ගැනීම	342,200.00
16	ආරක්ෂක ලේකම් තුමන් සහභාගි වන උත්සවය සඳහා මල් කළඹ මිලදී ගැනීම	22,000.00
17	සමරු ඵලක සකස් කිරීම	48,000.00
18	රණවිරු සේවා අධිකාරිය සඳහා නිල ලාංඡන දෙකක් සැකසීම	212,000.00
19	කාන්තා නිල ඇඳුම් මිලදී ගැනීම	391,950.00
20	සම්පූර්ණ නිල ඇඳුම් මිලදී ගැනීම	700,000.00
21	මුංගඳළුව රණවිරු ගම්මානයට ප්‍රවේශ වන මාර්ගය පිළිසකර කිරීම	145,000.00
22	විද්‍යුත් ආරෝපිත යතුරුපැදි වෙනුවෙන් සංකේතාත්මක යතුරුපැදි පනහක් මිලදී ගැනීම	42,500.00
23	අත්වාරු සහ කිහිලිකරු මිලදී ගැනීම 2024	13,178,750.00
24	ඇස් කණ්ණාඩි මිලදී ගැනීම 2024	3,000,000.00
25	ආරාධනාපත්‍ර මුද්‍රණය කිරීම	116,675.00
26	සාමාන්‍ය නිල ඇඳුම් මිළදී ගැනීම 2024	444,000.00
27	රණවිරු සැමරුම් උත්සවය වෙනුවෙන් විශේෂ ආරාධිත අමුත්තන් සඳහා කෙටි ආහාර මිලදී ගැනීම	379,875.00
28	රණවිරු සැමරුම් උත්සවය සඳහා සහභාගි වන අයවලුන්හට කෙටි ආහාර මිලදී ගැනීම	738,760.00
29	රණවිරු අනුස්මරණ උත්සවය සඳහා අවශ්‍ය වතුර බෝතල් 2000 ක ප්‍රමාණයක් මිලදී ගැනීම - 2024	100,000.00
30	2024 රණවිරු කොඩි දිනය වෙනුවෙන් සමරු ඵලකයක් මිළදී ගැනීම	25,000.00
31	2024 නිල ඇඳුම වෙනුවෙන් ටයිපට් හා සාරිකටු මිළදී ගැනීම	156,150.00
32	රණවිරු අනුස්මරණ උත්සවය සඳහා අනෙකුත් ආරාධිතයන් සහ රණවිරු ඥාතීන් වෙනුවෙන් කෙටි ආහාර මිලදී ගැනීම	264,750.00

33	රණවිරු අනුස්මරණ උත්සවය වෙනුවෙන් විශේෂ ආරාධිත අමුත්තන් සඳහා අවශ්‍ය වතුර බෝතල් 100ක ප්‍රමාණයක් මිලදී ගැනීම	21,691.00
34	රණවිරු සේවා අධිකාරියේ සියළුම කාර්යය මණ්ඩලය සඳහා දිවා සහ රාත්‍රී ආහාරය ලබා ගැනීම	134,350.00
35	ස්තූති කාඩ්පත් මිලදී ගැනීම	9,000.00
36	හසිදි මිළදී ගැනීම - (රණවිරු අනුමස්මරණ දිනය සඳහා කෙටි ආහාර මිලදී ගැනීම 2024)	49,500.00
37	සෙ/403294 සැරයන් නීල් රේමන් යන රණවිරුවා වෙත ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම	78,800.00
38	රණවිරු දිනයට සමගාමීව කෙටි වීඩියෝපටයක් නිර්මාණය කිරීම	625,000.00
39	සුළං මෙට්ටයක් මිළදී ගැනීම	14,000.00
40	මුද්‍රණ යන්ත්‍ර සඳහා කාට්‍රිජ් මිළදී ගැනීම	87,500.00
41	පරිගණක උපාංග මිලදී ගැනීම	11,326.82
42	ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම - (ක්‍රීඩා උපකරණ)	144,150.00
43	පෝෂණ අතිරේක මිලදී ගැනීම	25,000.00
44	2023 වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීම	381,446.80
45	මේස පන්දු පිත්තේ රබර් යුගලය මිලදී ගැනීම	36,000.00
46	2024 වැටුප් පත්‍රිකාවේ දැනුවත් කිරීමේ පණිවිඩය මුද්‍රණයට තින්ත ටියුබ් 03ක් මිලදී ගැනීම	47,436.00
47	රණවිරුවෙකු සඳහා වෝකරයක් මිලදී ගැනීම	9,000.00
48	ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම - (සපත්තු)	18,000.00
49	විදුලි ජනක යන්ත්‍රයේ ආවරණ වහලය අලුත්වැඩියා කටයුතු සිදු කිරීම	53,563.15
50	වතුර වීදුරු (water goblet)මිලදී ගැනීම	11,575.00
51	රණවිරු සේවා අධිකාරිය සඳහා පානීය ජල බෝතල් රඳවන මිලදී ගැනීම (ෆිල්ටර්)	141,600.00
52	ප්‍රමුඛතා ස්ටිකර් මුද්‍රණය කිරීම	360,000.00
53	ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම - (Badminton Racket)	25,000.00
54	ආබාධිත සහයක උපකරණ මිලදී ගැනීම - (වායු මෙට්ට, වළලුකර ආධාරක යුගලයක්, රෝහෝ කුෂන්)	215,155.00
55	තොරතුරු තාක්ෂණ අංශයේ පරිගණකය අලුත් වැඩියා කිරීම සඳහා උපකරණ මිලදී	32,050.00
56	2024 වර්ෂයේ දෙවන වාරය සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම	84,054.90
57	දකුණු පස වාහන අංගනය සඳහා අවශ්‍ය වැහිපීලි සකස් කිරීමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම	478,516.55
		33,686,833.03

5. ගිණුම් අංශය

ගිණුම් අංශය ලෙස ආයතනයේ සියලුම මූල්‍ය කටයුතු ඉතා කාර්යක්ෂමව හා නිවැරදිතාවයකින් යුතුව සිදුකරන අතර, අප අංශයේ කටයුතු පහත සඳහන් පරිදි විෂය පථයන් යටතේ ක්‍රියාත්මක කරනු ලබයි.

ආයතනයේ වාර්ෂික අයවැය සකස්කර මුදල් ප්‍රතිපාදනයන් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සඳහා සහභාගි වීම සහ අදාල අනුමැතිය ලබාගෙන ඊට අදාල වර්ෂයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ආයතනය සතු සියලුම බැංකු ගිණුම් නිවැරදිව හා විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යාම සහ මූල්‍ය

කළමනාකරණය සිදු කිරීම, ආයතනයේ ඇති සියලුම ගෙවීම් මුදල් රෙගුලාසි , චක්‍රලේඛ හා බලය බෙදා දීමට යටත්ව සිදු කිරීම සහ ලිපි ලේඛන නඩත්තුව සිදු කිරීම, සියලුම මූලාශ්‍ර වලින් ආයතනය වෙත ලැබෙන මුදල් නිවැරදි කාල වලදී ලබා ගැනීම හා එම මුදල් විනිවිදභාවයකින් යුතුව කළමනාකරණයේ තීරණයට අනුව යෙදවීමට ක්‍රියාකිරීම, සියලුම ගිණුම් කටයුතු නිවැරදිව හා විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යාම, වාර්ෂික ගිණුම් ප්‍රකාශනය නියමිත ගිණුම් ප්‍රමිත වලට අදාලව පිළියෙල කර නියමිත දිනවකවානුවට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම සහ ආයතනයේ සියලුම අංශ සමග සහයෝගීතාවයෙන් ආයතනයේ දැක්ම කරා යෑමට කටයුතු කිරීම ගිණුම් අංශයෙන් සිදු කෙරේ.

6. හමුදා සම්බන්ධීකරණ අංශය

6.1. හැදින්වීම

රණවිරු සේවා අධිකාරියෙහි මූලික අරමුණ වන දේශයේ සුරක්ෂිත භාවය උදෙසා තම ජීවිත හා ශරීරාංග පූජා කළ රණවිරුවන් හට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය ඉහල නැංවීම උදෙසා ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, පොලිස් විශේෂ කාර්යය බලකාය සහ සිවිල් ආරක්ෂක බලකාය යන ආයතන හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම මෙම අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ.

6.2. 2024 කාර්යය සාධනය - 2024 වර්ෂය තුලදී හමුදා සම්බන්ධීකාරක අංශය වෙතින් ලිපි ඉදිරිපත් කර ඇති විස්තරය

මාසය	**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**	**වැහාලේ අම**	**රජයේ පාසල්**	**ත්‍රිවිධ හමුදා/පොලිසිය හා සිවිල් ආරක්ෂක බලකාය**	**වෙනත් රාජ්‍ය ආයතන**
ජනවාරි	08	28	11	45	37
පෙබරවාරි	10	22	08	43	41
මාර්තු	11	28	05	39	44
අප්‍රේල්	09	34	05	46	37
මැයි	09	25	06	47	34
ජුනි	08	17	04	42	33
ජුලි	09	24	04	69	25
අගෝස්තු	06	18	05	54	38
සැප්තැම්බර්	08	23	05	34	30
ඔක්තෝබර්	04	26	21	45	29
නොවැම්බර්	05	22	14	34	41
දෙසැම්බර්	07	20	06	41	32
එකතුව	**94**	**287**	**94**	**539**	**421**

තවද ඉහත සඳහන් පරිදි ලිපි ඉදිරිපත් කිරීමේදී අදාල රණවිරුවා හෝ එම රණවිරුවාගේ ලගම ඥාතියා වෙත පිටපතක් යොමුකරන අතර, දැනුම්දිය යුතු සෑම ස්ථානයකටම ලිපියේ පිටපතක් තැපැල් මගින් යොමුකරනු ලබයි.

7. අභ්‍යන්තර විගණන අංශය

රණවිරු සේවා අධිකාරියේ කාර්යසාධනය තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය, කාර්යසාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන සිදු කිරීම අරමුණු කර ගනිමින් රණවිරු සේවා අධිකාරියේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය 2024 වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපි අංක DMA01/-2019/1 ප්‍රකාරව සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මක් ඔස්සේ අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ අතර අකාර්යක්ෂම ක්‍රියාපිළිවෙත් පිටුදකිමින්, අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කරමින්, වංචා දූෂණ සිදුවිය හැකි අවස්ථා අවම කරමින් කටයුතු කිරීම සඳහා මෙම අංශය තුලින් පද්ධති විගණන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

7.1.2024 වර්ෂය තුළ අත්පත්කරගත් ප්‍රගතිය

- අභ්‍යන්තර විගණන සැලැස්ම යටතේ වර්ෂය තුළ විගණන වාර්තා 12ක් නිකුත් කිරීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03ක් පැවැත්වීම.
- ආරක්ෂක අමාත්‍යාශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් සඳහා සහභාගිවීම.
- විගණන විමසුම් සඳහා ලබාදුන් පිළිතුරු පසුවිපරම් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම.
- විගණකාධිපති විගණන විමසුම් හා විගණන වාර්තා සඳහා පිළිතුරු කෙටුම්පත් කිරීම.
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ විගණන මාර්ගෝපදේශ 02/2023 ප්‍රකාරව සකස් කරන ලද අභ්‍යන්තර විගණනකගේ කාර්තුමය ඇගයීම් වාර්තාව ආරක්ෂක අමාත්‍යාශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණනක වෙත සෑම කාර්තුවක් අවසානයේදීම යොමු කිරීම.

8. සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රය

8.1.හැඳින්වීම

මව්බිම වෙනුවෙන් අසීමිත කැපකිරීමක් සිදුකරණ ලද වීරෝධාර රණවිරුවන්ගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ගේ ජීවන කුසලතා සංවර්ධනය කරමින් ඔවුන් ස්වාධීන හා ගෞරවනීය පුරවැසියන් ලෙස අන්තර්කරණ සමාජයක් වෙත ප්‍රවිෂ්ඨ වීම සඳහා සමාන අවස්ථා සවිබල ගැන්වීමට පහසුකම් සැලසීම මෙම ආයතනය මගින් සිදුවේ. එහිදී විද්වත් වෘත්තිකයින්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් විසින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා තක්සේරුකරණයක් සිදුකොට ඔවුන්ගේ ඉදිරි ජීවිතයේ වෘර්තීමය අවශ්‍යතාවයන් සඳහා මංපාදා ගැනීමටද දරුවන්ගේ අන්තර්කරණය සඳහාද ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී. දැනට මෙම කේන්ද්‍රය වෙතින් විශේෂ අවශ්‍යතා ඇති දරුවන් 114 දෙනෙකු සඳහා පහත සඳහන් චිකිත්සන හා සේවා පහසුකම් සපයනු ලබයි. ඒ යටතේ

අ. භෞත චිකිත්සනය
ආ. කථන චිකිත්සනය
ඇ. ජල චිකිත්සනය
ඈ. රංග චිකිත්සනය

ඉ. ඔටිසම් කළමනාකරණය

ඊ. දෙමාපිය මනෝ චිකිත්සනය හා සවිබළ ගැන්වීම සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රය වෙතින් සිදු කරනු ලබයි.

8.2.2024 වර්ෂයේදි ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර

අ/අ	**ව්‍යාපෘතිය**	**වැය දරණ ලද මුදල (රු:)**
1	වාර්ෂික ඇගයීම හා දරුවන් බඳවා ගැනීම	22,494.00
2	අධ්‍යාපන කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සෙ.අ.කේ මගින් සංවිධානය කරනු ලබනයි.	45,351.00
3	විශේෂ අධ්‍යාපන රංග චිකිත්සන දේශීය පාඨමාලා	31,665.00
4	රංග චිකිත්සන වැඩසටහන් සෞන්දර්ය කලා ඒකකය.	35,590.00
5	අන්තර්කරණ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් මුහුදු වෙරල.	116,779.00
6	ක්‍රීඩා පුහුණු වැඩසටහන හා වාර්ෂික ක්‍රීඩා උත්සවය හා පැරා තරගාවලිය	21,553.00
7	සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය	279,394.00
8	ආගමික වැඩසටහන් වෙසක්, පොසොන්, දීපවාලි උත්සව)	22,775.00
9	බාල දක්ෂ වැඩසටහන්	319,872.10
10	වෘත්තීය පුහුණු නිෂ්පාදන අමුද්‍රව්‍ය මිලදි ගැනිම සදහා	57,137.00
11	විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සදහා වූ වෘත්තීය පුහුණු වැඩසටහන්	78,915.00
12	ජල චිකිත්සන වැඩසටහන් සහ පිහිණුම් තඨාකයේ නඩත්තු අවශ්‍යතා	9,480.00
13	වෘත්තීය චිකිත්සන හා භෞත චිකිත්සන අංශය	13,473.00
14	සෙඅකේ දෙමාපියන් බල ගැන්වීමේ වැඩසටහන	27,608.00
15	දෙමාපිය හමුව	26,238.00
16	දරුවන්ගේ පහසුව සහ ආරක්ෂාව සදහා වූ නඩත්තු කටයුතු	1,555,636.95
17	ලෝක ළමා දින වැඩසටහන - 2025	422,860.00
18	දෛනික ජීවන නිපුනතා මුළුතැන්ගෙය සඳහා හා දරුවන්ගේ දෛනික ජීවන නිපුනතා සංවර්ධනය සඳහා වන වියදම්	19,155.00
19	සම්පත් දායක දීමනා	2,052,857.14
20	කේන්ද්‍රයේ ලිපි ද්‍රව්‍ය අවශ්‍යතා	377,010.79
21	වාර්ෂික විවිධ ප්‍රසංගය නත්තල් සැමරුම	33,516.00
22	ඉගෙනුම් ආධාරක අමුද්‍රව්‍ය සදහා	24,584.00
23	ප්‍රවාහන අංශයේ නඩත්තු කටයුතු සදහා	5,300.00
24	දක්ෂිණ පක්ෂාංගයේ අළුත්වැඩියා කටයුතු	266,384.00
එකතුව		**5,865,627.98**

අවසන් මූල්‍ය ප්‍රකාශනය

2024

රණවිරු සේවා අධිකාරිය
2024-12- 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2024		2023	
		රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත
වත්කම්					
ජංගම වත්කම්					
මිලදී ගත මුදල් සමාන යු	1		75,101,295.01		66,815,364.85
තැන්පතු	2		938,374.74		721,506.77
කරගත් ගෙවීම්	3		457,150.62		354,927.91
ලැබිය යුතු ණය හා අනෙකුත් අත්‍යවශ්‍ය	4	836,780,161.83		700,237,023.70	
අඩුකළ ණය පෙරාගත් කිරීම		2,933,696.78	833,846,465.05	3,346,230.45	696,890,793.25
පීඩිත දුවිය අනෙකුත්	5		10,509,966.62		2,601,626.70
එකතුව	01		**920,853,252.04**		**767,384,219.48**
ජංගම නොවන වත්කම්					
ස්ථාවර තැන්පතු	6		208,250,000.00		208,250,000.00
දේපල, පොහොසාරිදී හා උපකරණ	7		304,471,588.46		277,405,158.63
එකතුව	02		512,721,588.46		485,655,158.63
මුළු වත්කම් (03=01+02)			**1,433,574,840.50**		**1,253,039,378.11**
බැරකම්					
ජංගම බැරකම්			30,057,474.48		17,361,340.61
එකතුව	04	8	30,057,474.48		17,361,340.61
ජංගම නොවන බැරකම්	9		193,543,263.70		243,520,950.88
එකතුව	05		193,543,263.70		243,520,950.88
මුළු බැරකම් (06=04+05)			223,600,738.18		260,882,291.49
ශුද්ධ වත්කම් (03-06)			**1,209,974,102.32**		**992,157,086.62**
ශුද්ධ වත්කම් / ඉක්මන්වය(03-06)					
රණවිරු දුරට සුවදෙන අරමුදල			56,542.00		56,542.00
ස්ථිර ණය පදනම අරමුදල			12,999,982.04		12,568,686.81
ප්‍රතිසංස්කරණ සංචිතය			160,338,081.06		119,887,134.75
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)			1,036,579,495.93		859,644,722.98
මුළු ශුද්ධ වත්කම් / ඉක්මන්වය(01+02-06)			**1,209,974,102.32**		**992,157,086.62**

අහත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අංක 02 සිට 29 දක්වා සිදුවීම් සඳහන් නිතුමිකරණ ප්‍රතිපත්ති හා සටහන් වල ඇලෙමින් සමග කියවිය යුතුය.

කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි සිදුවෙල කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශනය අදිවසක් කිරීමේ වගකීම් කළමනාකරණ මණ්ඩලය විසින් භාරගන්නා ලදී. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමෙන් හා නිකුත් කිරීමෙන් අධිකාරී බලය සහතික කිරීමෙන්, උප සහතික කිරීමෙන් හා සහතික අධීක්ෂණ මූල්‍ය වෙත 2025.03.10 දින ලබාදෙන ලදී.

ජේ.ඩී.ඩී.ඩී

රණවිරු සේවා අධිකාරිය
2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2024	2023
		රු.ශත	රු.ශත
ආදායම්			
රජයේ දායකය (පුනරාවර්ථන)	10	317,371,864.44	389,781,683.42
ලොතරැයි ආදායම *		244,035,752.00	270,381,736.00
පොළී ආදායම	11	33,477,056.91	56,057,611.80
සේවක ණය පොළී ආදායම		431,295.23	450,735.19
සේවා ගාස්තු	12	18,563,841.83	15,873,635.06
රණවිරු කොඩි අලෙවි ආදායම	13	8,324,827.50	4,396,111.00
පරිත්‍යාග	14	4,930,408.27	6,021,028.28
වෙනත් ලැබීම්	15	412,541.82	105,296.49
මුළු ආදායම (01)		**627,547,587.99**	**743,067,837.24**
වියදම්			
පුද්ගල පඩිනඩි	16	58,039,524.83	52,722,816.47
ගමන් වියදම්	17	1,661,447.56	1,371,848.97
සැපයීම්	18	12,231,050.05	11,120,573.25
නඩත්තු වියදම්	19	5,069,662.77	7,174,347.68
ගිවිසුම්ගත සේවා	20	13,251,996.82	11,840,706.84
වෙනත් පුනරාවර්ථන වියදම්	21	3,263,123.42	3,439,584.18
ව්‍යාපෘති මෙහෙයුම්	22	341,473,228.59	393,484,965.44
ක්ෂය කිරීම		14,887,619.58	14,877,991.54
මූල්‍ය වියදම්	23	557,623.25	1,380,313.38
වත්කම් ඉවත්කිරීමේ අලාභ		118,203.30	
මුළු වියදම් (02)		450,553,480.17	497,413,147.75
කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌණතාවය) (01-02)		**176,994,107.82**	**245,654,689.48**

* 2024 වර්ෂයේ ලොතරැයි ආදායම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන වාර්තාවෙහි අතිරික්තය ඉහළ අගයක් ගෙන ඇති අතර මෙම වර්ෂයට අදාළව ලැබිය යුතු ලොතරැයි ආදායම රු: 244,035,752.00 වේ.

රණවිරු සේවා අධිකාරිය
2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2024 රු.ශත	2023 රු.ශත
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
අතිරික්තය/(ඌණතාවය)		176,994,107.82	245,654,689.48
ක්ෂය කිරීම		14,887,619.58	14,877,991.54
පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම		3,992,744.04	3,244,722.28
පොළී ආදායම		(33,477,056.91)	(56,057,611.80)
අනිවිශේෂ අයිතම/ පෙර වර්ෂයේ ගැලපීම්		4,389,342.62	166,300.66
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(ඌණතාවය)		**166,786,757.16**	**207,886,092.16**
ලිපි ද්‍රව්‍ය තොග (වැඩිවීම)/අඩුවීම		(7,908,339.92)	(1,075,734.80)
නැන්පතු (වැඩිවීම)/අඩුවීම		(216,867.97)	(125,718.64)
කලින් ගෙවීම් (වැඩිවීම)/අඩුවීම		(102,222.71)	68,363.85
ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම)		12,524,445.16	5,975,546.77
ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම		(136,543,138.13)	(231,881,447.59)
අඩමාණ ණය වෙන් කිරීම		(412,533.67)	
පාරිතෝෂික දීමනා ගෙවීම		(1,271,790.18)	(1,756,677.91)
වත්කම් ඉවත්කිරීමේ අලාභ		118,203.30	
මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය වැඩිවීම/(අඩුවීම)		(133,812,244.11)	(228,795,668.32)
මෙහෙයුම් ක්‍රියානාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**32,974,513.05**	**(20,909,576.16)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
ඉඩම් හා ගොඩනැගිලි විකුණුම් /(ගැණුම්)		(1,520,206.39)	(319,254.40)
යන්ත්‍ර උපකරණ විකුණුම්/(ගැණුම්)		-	(39,054.00)
ගෘහභාණ්ඩ විකුණුම්/ (ගැණුම්)		(141,600.00)	-
අබලි භාණ්ඩ විකුණුම් / (ගැණුම්)		40,500.00	141,000.00
ස්ථාවර නැන්පතු		-	(108,000,000.00)
පොළී ආදායම්		33,477,056.91	56,057,611.80
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**31,855,750.52**	**(52,159,696.60)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය			
රජයේ ප්‍රධාන ලැබීම්		(56,791,093.34)	(64,451,684.92)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(56,791,093.34)**	**(64,451,684.92)**
මුදල් හා මුදල් වලට ආසන්න දෑ වල ශුද්ධ වැඩිවීම්/(අඩුවීම)		**8,039,170.20**	**(137,520,957.71)**
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන්		66,815,364.85	204,336,322.46
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල්වලට ආසන්න අයිතමයන්	01	**74,854,535.13**	**66,815,364.83**

රණවිරු සේවා අධිකාරිය
2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

විස්තරය	සටහන්	රණවිරු දුදරු සුවසෙත අරමුදල	සේවක ණය වක්‍රීය අරමුදල	ප්‍රත්‍යාගණන සංචිතය	සමුච්චිත අතිරික්තය/(ඌණතාවය)	මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය
2023.01.01 දිනට ශේෂය		61,960.00	12,117,951.62	119,887,134.75	642,016,741.18	674,779,298.76
ගැලපීම් (a)		(5,418.00)			(310,840.30)	(2,253,338.40)
වත්කම් පරිත්‍යාග (b)					(21,800,000.00)	(16,500,000.00)
වාහන ඉවත්කිරීමේ අලාභ					(112,708.00)	(144,657.53)
සේවක ණය වක්‍රීය අරමුදලට මාරුකිරීම් (c)			450,735.19		(450,735.19)	-
පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගිණුමට මාරු කිරීම (d)					(5,352,423.76)	(3,770,209.68)
කාළපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌණතාවය) (e)					245,654,689.48	121,972,695.08
කාළපරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු අතිරික්තය/(ඌණතාවය) (a+b+c+d+e)		(5,418.00)	450,735.19	-	217,627,982.23	218,073,299.42
2023.12.31 දිනට ශේෂය		56,542.00	12,568,686.81	119,887,134.75	859,644,722.72	992,157,086.28
ගැලපීම් (a)	24	-			4,389,342.62	4,389,342.62
වත්කම් පරිත්‍යාග (b)				40,450,946.31		40,450,946.31
ගෘහ භාණ්ඩ ඉවත්කිරීමේ අලාභ						-
සේවක ණය වක්‍රීය අරමුදලට මාරුකිරීම් (c)			431,295.23		(431,295.23)	-
පාරිතෝෂික සඳහා වෙන්කිරීම් ගිණුමට මාරු කිරීම (d)					(4,017,381.57)	(4,017,381.57)
කාළපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌණතාවය) (e)					176,994,107.82	176,994,107.82
කාළපරිච්ඡේදය සඳහා හඳුනාගත් මුළු අතිරික්තය/(ඌණතාවය) (a+b+c+d+e)		-	431,295.23	40,450,946.31	176,934,773.65	217,817,015.19
2024.12.31 දිනට ශේෂය		56,542.00	12,999,982.04	160,338,081.06	1,036,579,495.93	1,209,974,101.03

රණවිරු සේවා අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.....
2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන හා ගිණුම් ප්‍රතිපත්ති

1) සංස්ථාපිත විස්තරය

1.1) වාර්තා කරන ගිණුම්කරණ ඒකකය සහ පදනම

රණවිරු සේවා අධිකාරිය ,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මඟින් පවරනු ලැබූ වර්ෂ 1999 අංක 54 දරණ රණවිරු සේවා අධිකාරි පනත මඟින් 1999 වසරේ දෙසැම්බර් 23 වන දින ගැසට් නිවේදනයෙන් නිවේදනය කල රාජ්‍ය ආයතනයකි. 1999 අංක 54 දරණ රණවිරු සේවා අධිකාරි පනතේ 3 වන උපවගන්තිය පසුව පිළිවලින් 2009 අංක 7 හා 2012 අංක 20 දරණ රණවිරු සේවා අධිකාරි(සංශෝධන) පනත මඟින් සංශෝධනය විය.

1.2) මූලික අරමුණ,කර්තව්‍යය හා කාර්ය ස්වභාවය

රණවිරු සේවා අධිකාරි පනත මඟින් පවරා ඇති ඉලක්ක ගත කණ්ඩායමේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම මූලික අරමුණ වේ. මෙම අරමුණ පහත දක්වා ඇති සියවිධ කාර්යයන්හි සුභසාධනයට ප්‍රවර්ධනය කිරීම මූලික කොටගෙන සිදුවේ.

- **I.** නිවාස සැපයීම හා එහි ලා සහය වීම.
- **II.** ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ ඔවුන්ගේ පුනරුත්ථාපනය
- **III.** වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහය වීම
- **IV.** අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශ ලබා ගැනීමට අවස්ථා සලසා දීම.
- **V.** ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීම
- **VI.** ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමට කාර්මික ,කෘෂිකාර්මික හෝ වාණිජ්‍ය ව්‍යවසාය පිහිටවීම.

1.3) ඉලක්ක ගත කණ්ඩායම

සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සාමාජිකයන් සහ ක්‍රියාන්විතයේදී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්

1.4) ප්‍රධාන කාර්යාල ලිපිනය

ප්‍රධාන කාර්යාලය. අංක 449, ගාලු පාර , කොළඹ 03 පිහිටා ඇත.

1.5) සේවකයන් ගණන

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/C2/2/44 හා 2012.10.16 දිනැති ලිපිය අනුව අනුමත මුළු සේවක සංඛ්‍යාව 89 (සභාපති, උපසභාපති නොමැතිව) 2024.12.31 දිනට සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව **69** කි. මෙම අනුමත සේවක සංඛ්‍යාවට අමතරව ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ කාර්යමණ්ඩලය පිරිසක් රණවිරු සේවා අධිකාරිය වෙත අනියුක්ත කර ඇත.

ගිණුම් වර්ෂය

අධිකාරියේ ගිණුම් වර්ෂය ලිත් වර්ෂයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන 2024.01.01 දින සිට 2024.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහාය.

1.6) ගිණුම් වාර්ථා අනුමත කළ යුතු දිනය

ගිණුම් වර්ෂය අවසන්වී ලිත් වර්ෂයේ දින 60 ක් ඉක්ම යාමට පෙර අනුමත කල යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශ 2024 මාර්තු 10 වන දින කළමනාකරණ මණ්ඩලය අනුමත කරන ලදී.

රණවිරු සේවා අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.....
2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

2) **පිළියෙල කිරීමේ පදනම හා අනුකූලතාවය**

2.1) **පිළියෙල කිරීමේ පදනම**

අධිකාරියේ ශේෂ පත්‍රයේ දැක්වෙන පහත අයිතම හැර මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ඓතිහාසික පිරිවැයට පිළියෙල කර ඇත.

අයිතමය	පිළියෙල කිරීමේ පදනම
වාහන	ශුද්ධ උපලබ්දි අගය

2.2) **අනුකූලතා ප්‍රකාශය**

මෙම මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය තත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සමඟ සටහන් අන්තර්ගත වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2009 හා 2012 වසර වලදී හඳුන්වාදී ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලටඅනුකූලව; ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 (භාණ්ඩ සහ වැඩ) හා 2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු යන පනත් ආවරණය වන පරිදි රීට අනුගත ලෙස පිළියෙල කර ඇත. යම් ගනුදෙනුවක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලින් ආවරණය නොවන අවස්ථාවක ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත යොදාගන්නා අතර එයිනුත් අවරණය නොවන අවස්ථාවක වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දී ඇති "Sri Lanka Statement of recommended Practise for not-for profit organization" අනුව කටයුතු කරනු ලැබේ.

2.3) **මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි ඡේද අංක 19 අනුකූලව රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධිකාරියේ කළමණාකරණ මණ්ඩලය සතුය.

2.4) **මූලික හා ඉදිරිපත් කරන මුදල් වර්ග**

අධිකාරියේ මූලික මුදල් වර්ගය වනුයේ ශ්‍රී ලංකා රුපියල් වන අතර, එය මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදීත් භාවිත කර ඇත.

රණවිරු සේවා අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.....
2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.) **විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මෙම මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු පරිශීලකයන්ට වඩාත් හොඳින් තේරුම් ගැනීමට අදාළව කළමනාකරණ මණ්ඩලය විසින් යෝග්‍ය යැයි සිතන අමතර තොරතුරු මෙම කොටසින් ඉස්මතු කර පෙන්වයි.

මෙම මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති පහත සඳහන් ප්‍රතිපත්ති නිරන්තරයෙන් සෑම කාලවකවානුවකටම අනුකූල කරගෙන පිළියෙල කර ඇත. වර්ෂය තුල වෙනස්වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුලත්ව අධිකාරියේ මූල්‍ය තත්වයට බලපාන විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම කොටසින් සාරාංශව ඉදිරිපත් කර ඇත.

3.1) රජයෙන් ලැබූ ප්‍රදාන ගිණුම් කැබීම.

පුනරාවර්ථන ප්‍රදාන

රජයෙන් ලැබුණු පුනරාවර්ථන ප්‍රදාන අදායම් වියදම් ගිණුමට ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන ප්‍රදාන

අධිකාරියේ කටයුතු සඳහා ලැබෙන ප්‍රග්ධන ප්‍රදාන රජයේ දායක (ප්‍රාග්ධන) ගිණුමට ගිණුම් ගත කරන අතර වෙනත් ආයතන වෙත මාරුකිරීම සඳහා ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන එම ආයතන නමින් ඇති ගිණුමට ගිණුම්ගත කරනු ලැබේ.

3.2). වත්කම් හා ඒවා අගය කිරීමේ පදනම.

2022 වසරේ සිට මීලඟ ගන්නා වත්කම් වල අගය රුපියල් 10,000 ට අඩු සහ අවුරුද්දට වඩා අඩු ආයුකාලයක් සහිත නම් එය පාරිභෝගික භාණ්ඩ ලෙස ඇතුලත් කර මෙම වර්ෂයේ වියදමක් ලෙස දක්වා ඇත. වත්කමේ පිරිවැය රු.10,000 ට වඩා වැඩිනම් හා ඵලදායී ජීව කාලය වසරකට වඩා වැඩිනම් ස්ථාවර වත්කමක් ලෙස සලකා ගිණුම්ගත කරනු ලැබේ.

පරිත්‍යාග වශයෙන් ලද ස්ථාවර වත්කම් වල පිරිවැය සොයාගැනීම සඳහා වෙළෙඳපොල වටිනාකම් පදනම් කරගෙන ඇත.

3.2.1) ස්පෘශ්‍ය වත්කම් හා ක්ෂයවීම්

ක්ෂයවීම් සරල මාර්ග ක්‍රමයට පිරිවැය අගය මත වාර්ෂිකව පහත සඳහන් අනුපාතයන් අනුව ගණනය කොට ඇත.

ඉඩම්	-
ගොඩනැගිලි හා ඉදිකිරීම්	5%
ගෘහභාණ්ඩ හා උපකරණ	15%
යන්ත්‍ර හා උපකරණ	15%
වාහන	20%

රණවිරු සේවා අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.....
2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

3.3) තොග

වෙළඳ තොග, ලිපි ද්‍රව්‍ය හා පාරිභෝජන ගබඩා ද්‍රව්‍ය තොග පිරිවැයට අගය කර ඇත. පිරිවැය ගණනය කර ඇත්තේ ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු කිරීමේ පදනම මතය.

3.4) ණයගැතියෝ හා වෙනත් අයවිය යුතු වටිනාකම්

උපලබ්ධිවෙයැයි ඇස්තමේන්තු කල වටිනාකම ණයගැතියන් හා වෙනත් අයවිය යුතු වටිනාකම් දක්වා ඇත.

3.5) වගකීම් හා වෙන්කිරීම්

3.5.1) ජංගම වගකීම්

ජංගම වගකීම් යනුවෙන් දක්වා ඇත්තේ නියමිත දිනයන්හි දී ගෙවිය යුතු සහ මූල්‍ය තත්වය ප්‍රකාශන දින සිට වසරක් ඇතුලත ගෙවිය යුතු වටිනාකම් වේ.
ආරක්ෂක අමාත්‍යාංශය මඟින් හඳුන්වාදෙන ලද වීරුසර කාඩ්පත් මෙහෙයුම් වියදම ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ඇතුලුව විවිධ ආයතන වලින් ලද අනුග්‍රාහක මුදලින් දරනු ලැබේ. මෙම අනුග්‍රාක මුදලින් අදාල වියදම් දැරීමෙන් පසුව යම් මුදලක් ඉතිරිවේ නම් එය ත්‍රිවිධ හමුදාව හා පොලීසිය වෙත එම ආයතන දැක්වූ අනුග්‍රාහක මුදල් ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර ඇත.

රණවිරුවන් වෙත නිවාස ඉදිකරදීම් සඳහා ක්‍රියාත්මක වීරුසර නිවාස යෝජනා ක්‍රමය සඳහා විවිධ පාර්ශවයන් විසින් අධිකාරිය වෙත ලබා දෙන ලද මුදලින් අදාල ප්‍රතිලාභීන් වෙත නිවාස ඉදිකරදීම් අධිකාරියේ වගකීමක් බැවින් එම මුදල් ජංගම වගකීම් යටතේ ගිණුම්ගතකර ඇත.

3.5.2) වෙන්කිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව පහත විචල්‍යන් සහ උපකල්පනයන් මත පදනම්ව පාරිතෝෂික දීමනා වෙන්කිරීමේ ගණනය කිරීම් සිදු කරනු ලබයි.

විචල්‍යන් :

- ත්‍රෛයි මාසික සාමාන්‍ය අර්ධ වැටුප
- වර්තමාන සේවා කාලය
- අනාගත සේවා කාලය (සේවයෙන් විශ්‍රාම යෑම දක්වා)
- වර්ෂික වැටුප් වර්ධක අනුපාතය (බදවා ගැනීමේ පටිපටියට අනුව අදාල අනුමත වැටුප් තලය පදනම්ව)
- වට්ටම් අනුපාතිකය

උපකල්පන:

- සේවකයා විශ්‍රාම යන වයස තෙක් සේවයේ හි අනුයුක්ත වීම

රණවිරු සේවා අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.....
2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

- සේවකයා වෙත ඉදිරි සේවා කාලයේදී අනුමත වැටුප් තලයට අදාලව ලබාදෙන වාර්ෂික වැටුප් වැඩිවීම පමණක් හිමි වීම (රාජ්‍ය මහින් ලබාදෙන වැටුප් පරිවර්තන සිදු නොවන බව)
- සේවකයා ඉදිරි සේවා කාලය තුල දී තනතුරෙන් උසස්වීම් හෝ පහතට හෙලීම් සිදු නොවීම
- ශූන්‍ය සේවක පිරිවැටුම අනුපාතය

පාරිතෝෂික වෙන් කිරීමේ මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරන අතර 110 වන කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී ලබා දුන් කළමණාකරණ මණ්ඩල තීරණයට අනුව එම ආයෝජන පොලී ආදායම සේවකයන් වෙත හිමිගන්වා ඇත.

අඩමාන ණය වෙන් කිරීම සඳහා වන ගිණුම් ප්‍රතිපත්තිය වන්නේ ශේෂපත්‍ර දිනට ණයගැතියන්ගෙන් 1% ක් වනසේ ප්‍රතිසාදන වෙන්කිරීමය.

3.5.3) අසම්භාව්‍ය වගකීම්

- 2024-12-31 දින වන විට පහත පාර්ශවය විසින් අධිකාරියට එරෙහිව පහත සඳහන් නඩු ගොනුකර ඇත.

නඩු අංකය	පැමිණිලි පාර්ශවය	කාරණය
SCFR/414/2016	අධිකාරියේ නිලධාරීන් 7 දෙනෙකු	මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත.

ඉහත සඳහන් නඩු මූල්‍ය තත්වය ප්‍රකාශන දින වන විටදී ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින අතර, අසම්භාව්‍ය වගකීමක් ඇතිවේ යැයි නිශ්චය කල නොහැකි හෙයින් ඒ සඳහා වෙන් කිරීමක් නොමැත.

- 2020 සැප්තැම්බර් මස සිට කළමනාකරණ මණ්ඩලය මහින් අත්හිටුවන ලද මාසිය රැකවරණ ගිණුම් 3917න් 2024.12.31 දින වන විට ගිණුම් **59** ක් නිරවුල් නොවී පවතින අතර නිවැරදි දත්ත ලබා ගෙන නිරවුල් වූ පසු එම ගිණුම් **59** සඳහා ගෙවීම් කිරීමට (හිඟ හිටි වටිනාකම් සහිතව) අසම්භව්‍යය බැරකමක් පවතී.

3.6) අසම්භාව්‍ය වත්කම්

අධිකාරියේ පරිගණක සහකාර නිලධාරිනියක් 2009 වර්ෂයේදී වර්ෂ 02 ක කාලයක් සඳහා වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන තිබුණු අතර බැදුම්කරයේ කොන්දේසි කඩකර පසුව සේවයෙන් ඉවත් වීම නිසා එම නිලධාරිනියගෙන් අධිකාරියට අයවිය යුතු මුදල වන රු.530,380/-ක් සම්බන්ධයෙන් අසම්භාව්‍ය වත්කමක් පවතී.

3.7) ආදායම් හා වියදම්

රණවිරු සේවා අධිකාරිය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් හා සම්බන්ධයි.....
2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

පහත සඳහන් ආදායම් හැර අනෙකුත් ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කරනු ලැබේ.

ආදායම් විස්තරය	පදනම
රණවිරු කොඩි අලෙවි ආදායම	සාධාරණ ඇස්තමේන්තුව (Best Estimate)

3.7.1) ලොතරැයි ආදායම

ජාතික ලොතරැයි මණ්ඩලය විසින් හඳහන ලොතරැයි පිරිවැටුමෙන් ප්‍රතිශතයක් රණවිරු සේවා අධිකාරිය වෙනුවෙන් රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකරනු ලබන අතර, එම මුදල් ප්‍රමාණය ලොතරැයි ආදායම වශයෙන් ගිණුම් තබනු ලැබේ. රජයේ ඒකාබද්ධ අරමුදලින් මෙතෙක් අධිකාරිය වෙත නිදහස් නොකල ප්‍රතිපාදනය ලැබිය යුතු ලොතරැයි ආදායම ලෙස ගිණුම් තබනු ලැබේ.
අධිකාරිය මගින් ව්‍යාපෘති වැඩසටහන් සඳහා දැරූ ප්‍රාග්ධන වැය 100% වෙන්කිරීම් කර ආදායම් වියදම් ගිණුමට ලියා හැර ඇති අතර, ඒවා නඩත්තු කිරීමද කරනු ලැබේ.

3.7.2) පරිත්‍යාග

රණවිරු සේවා අධිකාරිය වෙත දේශීය දානපතියන් විසින් මුදල් පරිත්‍යාග කරනු ලබන අතර, එම මුදල් රණවිරු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබාදෙනු ලැබේ. මීට අමතරව දානපතියන් විසින් විශේෂයෙන් නම්කරනු ලබන කාර්යයන් සඳහාද මෙම මුදල් ලබාදෙනු ලැබේ.

3.7.3) ආයෝජන

රණවිරු සේවා අධිකාරිය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ, මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු පවත්වාගෙන යනු ලබන අතර එම පොළී ආදායමෙන් අධිකාරිය පරිපාලන වියදම් දැරීම සිදු කරනු ලැබේ.

අධිකාරියේ ජංගම ගිණුම් වලට අයත් මුදල් ශේෂ කෙටි කාලීනව ලංකා බැංකුවේ අරමුදල් කළමනාකරණ ගිණුමේ ආයෝජනය කරනු ලැබේ.

පාරිතෝෂික දීමනා සඳහා වෙන්කර ඇති මුදල කෙටිකාලීන ලංකා බැංකුවේ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

රක්ෂණ වන්දි ලැබීම් මූලා කාර්ය සාධන ප්‍රකාශයේ වෙනත් අදායම් යටතේ දක්වන අතර අදාල අලුත්වැඩියා වියදම් යටතේ ගිණුම් තබනු ලැබේ.

සටහන 01

මුදල් හා මුදල් සමාන දෑ		2024	2023
		රු.ශත	රු.ශත
බැංකු ශේෂය	26	944,026.14	704,296.63
ඉතිරි කිරීමේ ගිණුම් ශේෂ	27	304,148.31	11,355,136.93
කෙටිකාලීන ආයෝජන	28	73,853,120.56	54,755,931.29
		75,101,295.01	66,815,364.85

සටහන 02

තැන්පතු	2024	2023
	රු.ශත	රු.ශත
තැන්පතු	745,141.38	545,141.38
ඇප තැන්පතු		
ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 011653489663 සහකාර අධ්‍යක්ෂ මූල්‍ය	57,510.00	44,174.75
ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 011653489612 ලක්මාලි	33,930.84	33,047.66
ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 011653489639 පරිපාලන නිළධාරී	33,930.84	33,047.66
ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 011653489647 දිල්හානි	33,930.84	33,047.66
ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 011653489655 අසංග	33,930.84	33,047.66
	938,374.74	721,506.77

සටහන 03

කලින් ගෙවීම්	2024	2023
	රු.ශත	රු.ශත
තැපැල් ගාස්තු	34,140.00	4,350.00
රක්ෂණය	192,454.66	199,963.44
කාර්යාල උපකරණ සේවා කිරීමේ වියදම්	230,555.96	150,614.47
	457,150.62	354,927.91

සටහන 04

ලැබිය යුතු ණය හා පොළී		2024	2023
		රු.ශත	රු.ශත
04-1	ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොළිය	363,283.26	531,601.56
04-2	ලැබිය යුතු ආයෝජන පොලිය		
	ලැබිය යුතු ලංකා බැංකුවේ 90367651 පොළී ගිණුම	1,407,704.79	3,963,836.07
	ලැබිය යුතු ලංකා බැංකුවේ 89798618 පොළී ගිණුම	290,465.75	370,136.61
	ලැබිය යුතු ඉ බැංකුවේ 2-0001-25-80306 පොළී ගිණුම	831,575.35	1,059,665.30
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00003670-7 පොළී ගිණුම	319,652.98	650,456.62
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00004183-5 පොළී ගිණුම	1,270,136.99	2,866,666.67
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00004171-9 පොළී ගිණුම	1,171,602.75	2,516,557.38
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00004795-3 පොළී ගිණුම	79,643.84	106,830.60
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00004003-3 පොළී ගිණුම	13,155.24	23,770.49
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00004206-8 පොළී ගිණුම	2,847,945.21	6,784,836.07
	ලැබිය යුතු මහජන බැංකුවේ 259-60-01-00004248-8 පොළී ගිණුම	9,016.13	17,049.18

04-3	ණය		
	කාර්ය මණ්ඩල		
	ආපදා ණය	10,049,509.85	10,554,147.52
	ප්‍රතිලාභීන්		
	නිවාස ණය -සේවයේ නියුතු	-	40,000.11
	නිවාස ණය -සංසද හා ගම්මාන	196,880,264.11	235,294,575.42
	වෛද්‍ය ණය	708,753.21	1,039,752.85
	ස්වයංරැකියා ණය	86,135,000.12	85,743,338.86
	කුසලතා ප්‍රවර්ධන ණය	11,783,135.91	12,571,933.44
04-4	**සේවා ගාස්තු**		
	නිවාස ණය -සේවයේ නියුතු	-	6,000.00
	නිවාස ණය -සංසද හා ගම්මාන	771,536.54	568,492.48
	ස්වයංරැකියා ණය	218,875.79	178,276.01
	කුසලතා ප්‍රවර්ධන ණය	43,554.73	36,498.18
04-5	හදහන ලොතරැයි ආදායම්	519,749,140.00	333,473,888.00
04-6	අත්තිකාරම්	1,835,451.04	1,835,451.04
04-7	ලැබිය යුතු ජනශක්ති රක්ෂණ ගිණුම්	-	2,505.00
04-8	ලැබිය යුතු ආපදා ණය පොළී ගිණුම්	758.25	758.25
		836,780,161.83	700,237,023.70

සටහන 05

	2024	**2023**
	රු.ශත	රු.ශත
කොග	10,509,966.62	2,601,626.70
	10,509,966.62	2,601,626.70

සටහන 06	**2024**	**2023**
	රු.ශත	රු.ශත
ස්ථාවර තැන්පතු		
ස්ථාවර තැන්පතු ගිණුම් - 89798618 ලංකා බැංකුව	20,000,000.00	20,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම් - 90367651 ලංකා බැංකුව	21,000,000.00	21,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම් - 2-0001-25-80306 ජාතික ඉතිරිකිරීමේ බැංකුව	25,000,000.00	25,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම් - 259-60-01-00003670-7 මහජන බැංකුව	40,000,000.00	40,000,000.00

ස්ථාවර තැන්පතු ගිණුම - 259-60-01-00004183-5 මහජන බැංකුව	20,000,000.00	20,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම - 259-60-01-00004171-9 මහජන බැංකුව	17,000,000.00	17,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම - 210-60-01-00004795-3 මහජන බැංකුව	5,000,000.00	5,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම - 259-60-01-00004003-3 මහජන බැංකුව	7,250,000.00	7,250,000.00
ස්ථාවර තැන්පතු ගිණුම - 259-60-01-00004206-8 මහජන බැංකුව	50,000,000.00	50,000,000.00
ස්ථාවර තැන්පතු ගිණුම - 259-60-01-00004248-8 මහජන බැංකුව	3,000,000.00	3,000,000.00
	208,250,000.00	208,250,000.00

සටහන 07

දේපල, පිරියත හා උපකරණ
පිරිවැය

විස්තරය	ඉඩම් රු.ශත	ගොඩනැගිලි රු.ශත	ගෘහභාණ්ඩ හා උපකරණ රු.ශත	යන්ත්‍ර උපකරණ රු.ශත	වාහන රු.ශත	එකතුව රු.ශත
2024.01.01 දිනට ශේෂය	190,650,640.00	78,135,367.12	7,747,163.35	16,347,359.00	36,856,230.00	329,736,759.47
එකතු කිරීම්	-	1,520,206.39	141,600.00	-	-	1,661,806.39
ප්‍රත්‍යාගණනය ගැලපීම්	-	-	-	-	48,550,000.00	48,550,000.00
ඉවත් කිරීම්			4,555.00	222,164.00	36,856,230.00	37,082,949.00
2024.12.31 දිනට ශේෂය	**190,650,640.00**	**79,655,573.51**	**7,884,208.35**	**16,125,195.00**	**48,550,000.00**	**342,865,616.86**
ක්ෂය කිරීම						
2024.01.01 දිනට ශේෂය	-	23,809,133.14	2,306,760.18	4,829,777.20	21,385,930.31	52,331,600.83
ආදායම් වියදම් ගිණුම්		3,933,817.22	1,163,777.11	2,418,779.25	7,371,246.00	14,887,619.58
ඉවත් කිරීම්			1,366.50	66,649.20	28,757,176.31	28,825,192.01
2024.12.31 දිනට ශේෂය	-	27,742,950.36	3,469,170.79	7,181,907.25	-	38,394,028.40
2024.12.31 දිනට ශුද්ධ පොත් අගය	**190,650,640.00**	**51,912,623.15**	**4,415,037.56**	**8,943,287.75**	**48,550,000.00**	**304,471,588.46**

වාහන 2024.12.31 දිනට තක්සේරු කර ඇති අතර වෙළඳපල වටිනාකම් සහ ශුද්ධ උපලබ්ධි අලය යන දෙකෙන් වඩා වැඩි අගය මත පොත්වල සටහන් කර ඇත.

සටහන 8

ජංගම වගකීම්		2024	2023
08-1	**පුද්ගල පඩි නඩි**	රු.ශත	රු.ශත
	ගෙවිය යුතු වැටුප් සහ වේතන	840,000.00	-
	ගෙවිය යුතු මුද්දර බදු	9,625.00	9,525.00
	ගෙවිය යුතු අතිකාල දීමනා	17,957.00	60,617.37
	ගෙවිය පාරිතෝෂික දීමනා	1,855,105.26	1,683,416.56
08-2	**සැපයීම්**		
	ගෙවිය යුතු ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	248,823.00	86,763.00
	ගෙවිය යුතු ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා ගිණුම	313,077.00	-
08-3	**නඩත්තු වියදම්**		
	ගෙවිය යුතු වාහන නඩත්තු වියදම්	459,232.11	28,890.00
	ගෙවිය යුතු යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම්	199,125.00	-
	ගෙවිය යුතු ගොඩනැගිලි නඩත්තු	37,861.48	-
08-4	**ගිවිසුම්ගත සේවා**		
	ගෙවිය යුතු දුරකථන ගාස්තු	95,287.65	93,748.89
	ගෙවිය යුතු විදුලිය ගාස්තු	373,265.22	402,589.82
	ගෙවිය යුතු ජල ගාස්තු	74,382.08	108,259.99
	ගෙවිය යුතු විගණන ගාස්තු	665,095.20	674,157.60
	ගෙවිය යුතු මුද්‍රණ ගාස්තු	18,500.00	21,105.00
	ගෙවිය යුතු කාර්යය මණ්ඩල පුහුණු	80,000.00	-
	ගෙවිය යුතු තැන්පතු	128,361.00	104,361.00

	ගෙවීය යුතු ගොඩනැගිලි හා ඉදිකිරීම්	224,063.48	224,063.48
	ගෙවීය යුතු ඇප තැන්පතු	193,233.36	176,365.39
	ගෙවීය යුතු පුවත්පත් ගිණුම	-	4,000.00
	ගෙවීය යුතු තැපැල් ගාස්තු ගිණුම	4,209.06	78,280.79
	ගෙවීය යුතු ජනගක්ති රක්ෂණ ගිණුම	6,066.45	1,503.00
	ගෙවීය යුතු දේශීය ගමන් වියදම් ගිණුම	352,800.11	259,950.00
	ගෙවීය යුතු සනීපාරක්ෂක සේවා සැපයීමේ ගිණුම	204,275.00	-
	ඉදිරියට ලද පරිත්‍යාග ගිණුම	1,280,500.00	1,221,150.60
	ගෙවීය යුතු මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ප්‍රසම්පාදිත වාහන වෙනුවෙන් කල්බදු කුලී ගෙවීම් ගිණුම	575,847.81	-
	ගෙවීය යුතු දෘඩාංග නඩත්තු	195,880.00	-
	ගෙවීය යුතු කාර්යාල උපකරණ සේවා කිරීමේ වියදම්	472,059.00	-
08-5	**ක්‍රියාන්විතයේදී ආබාධිත තත්වයට පත්ව සිටින සාමාජිකයින් පුනරුත්ථාපනය කිරීම**		
	ගෙවීය යුතු ආබාධිත උපකරණ මිලදී ගැනීමේ ගිණුම	2,297,450.00	-
	ගෙවීය යුතු හදිසි ආපදා ගිණුම	-	300,000.00
	ගෙවීය යුතු සනීපාරක්ෂක ආධාර ගිණුම	200,000.00	500,000.00
	ගෙවීය යුතු වෛද්‍ය ආධාර ගිණුම	-	1,114,561.00
08-6	**ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම**		
	ගෙවීය යුතු මයිලපිටිය උද්‍යානය නඩත්තු වියදම්	19,172.57	42,000.00
	ගෙවීය යුතු රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන් ගිණුම	13,198.00	-
	ගෙවීය යුතු ශිෂ්‍යාධාර ගිණුම	7,684,000.00	-
08-7	**නිවාස සැපයීම සහ එහි ලා සහය වීම**		
	ගෙවීය යුතු වීරුසර කාඩ්පත් පරිත්‍යාග වියදම	1,412,321.24	2,597,121.24
	ගෙවීය යුතු රණවිරු ගම්මාන වල යටිතල පහසුකම් ගිණුම	-	404,162.00
08-8	**නැවත ගෙවීය යුතු අරමුදල්**	22,395.84	37,239.50
	ණයකම්කරුවෝ	21,805.56	33,759.38
08-9	**ගෙවීය යුතු ණය**		
	වීරු සහන නිවාස ණය	5,375,000.00	4,400,000.00
	රණවිරු දිරිය ණය	3,887,500.00	2,693,750.00
	ගෙවීය යුතු අධ්‍යාපන ණය	200,000.00	
		30,057,474.48	17,361,340.61

සටහන 9

ජංගම නොවන වගකීම්	**2024**	**2023**
	රු.ශත	රු.ශත

1 පාරිතෝෂික සඳහා වෙන්කිරීම්

කාලපරිච්ඡේදය ආරම්භයේ ශේෂය	**31,344,956.25**	**25,710,763.72**
එකතුකලා	**3,992,744.04**	**3,244,722.28**
කාලපරිච්ඡේදය සඳහා වෙන්කිරීම	3,992,744.04	3,244,722.28
එකතුකලා	**4,264,141.69**	**5,829,564.72**
ආයෝජන පොළිය	4,017,381.57	5,352,423.76
පෙර වර්ෂයේ ගැලපීම්	246,760.12	477,140.96
අඩුකලා		
පාරිතෝෂික සඳහා ගෙවීම්	**1,443,478.88**	**3,440,094.47**
පාරිතෝෂිකයා	861,555.00	1,166,167.50
ආයෝජන පොළිය	410,235.18	590,510.41
පාරිතෝෂික ගෙවීම් සඳහා වෙන්කිරීම	171,688.70	1,683,416.56
කාලපරිච්ඡේදය අවසානයේ ශේෂය	38,158,362.41	31,344,956.25
2 රජයේ ආයකය (ප්‍රාග්ධන)	17,673,468.55	15,239,205.77
3 භාණ්ඩාගාරය වෙත ප්‍රතිපූර්ණය කළයුතු ආදායකය	137,711,432.74	196,936,788.86
එකතුව (1+2)	193,543,263.70	243,520,950.88

ඇමතුම 10

රජයේ ආයකය (පුනරාවර්ථන)	**2024**	**2023**
	රු.ශත	රු.ශත
පරිපාලන	62,040,000.00	63,670,000.00
වර්ෂයට අදාළ ප්‍රාග්ධන ආයකය	615,736.46	711,725.42
ව්‍යාපෘති	254,716,127.98	325,399,958.00
	317,371,864.44	389,781,683.42

ඇමතුම 11		**2024**	**2023**
		රු.ශත	රු.ශත
පොළී ආදායම			
11-1	භාණ්ඩාගාර බිල්පත් පොළී ආදායම	3,485,783.10	6,141,149.60
11-2	ස්ථාවර තැන්පතු පොළී ආදායම්		
	ලංකා බැංකුවේ 85156597 පොළී ගිණුම	-	500,547.95
	ලංකා බැංකුවේ 90367651 පොළී ගිණුම	2,356,465.97	4,172,459.02
	ලංකා බැංකුවේ 82614284 පොළී ගිණුම	-	3,731,506.85
	ලංකා බැංකුවේ 89798618 පොළී ගිණුම	2,221,369.86	5,370,439.41
	ලංකා බැංකුවේ 83287697 පොළී ගිණුම	-	705,616.44
	ලංකා බැංකුවේ 86047442 පොළී ගිණුම	-	953,424.66
	ලංකා බැංකුවේ 90852374 පොළී ගිණුම	-	3,208,767.12
	ජා ඉ බැංකුවේ 2-0001-13-67480 පොළී ගිණුම	-	163,726.03
	ජා ඉ බැංකුවේ 2-0001-15-53810 පොළී ගිණුම	-	1,800,403.25
	ජා ඉ බැංකුවේ 2-0001-25-80306 පොළී ගිණුම	2,631,849.32	1,115,437.16
	මහජන බැංකුවේ 259-60-01-00003670-7 පොළී ගිණුම	5,185,863.02	7,931,780.84
	මහජන බැංකුවේ 259-60-01-00004183-5 පොළී ගිණුම	2,707,397.26	2,866,666.67
	මහජන බැංකුවේ 259-60-01-00004171-9 පොළී ගිණුම	2,227,931.51	2,516,557.38
	මහජන බැංකුවේ 259-60-01-00004795-3 පොළී ගිණුම	553,287.67	1,235,837.45

මහජන බැංකුවේ 259-60-01-00004003-3 පොළී ගිණුම	859,384.75	1,733,727.72
මහජන බැංකුවේ 259-60-01-00004206-8 පොළී ගිණුම	6,823,972.60	6,784,836.07
මහජන බැංකුවේ 259-60-01-00004248-8 පොළී ගිණුම	360,920.24	257,049.18

11-3 ඉතිරි කිරීමේ ගිණුම් පොළී ආදායම්

අරමුදල් කළමණාකරණ ගිණුම	3,096,209.41	4,617,738.78
ඉතිරි කිරීමේ ගිණුම - 1-0901-01-06429	3,152.90	6,408.15
ඉතිරි කිරීමේ ගිණුම - 1-0001-08-85550	171,019.29	199,421.10
ඉතිරි කිරීමේ ගිණුම - 259-2-001-6-0007849	180,767.06	43,129.80
SDB පොළී ගිණුම - 000003135339	1,011.89	981.19
සත් දින ඇමතුම් නැමීපතු පොළී ආදායම්	610,671.06	-
	33,477,056.91	56,057,611.80

සටහන 12	**2024**	**2023**
	රු.ශත	රු.ශත
සේවා ගාස්තු		
නිවාස ණය -සංසද හා ගම්මාන	13,376,898.86	11,742,544.80
ස්වයංරැකියා ණය	4,528,411.35	3,672,088.00
කුසලතා ප්‍රවර්ධන ණය	658,531.62	459,002.26
	18,563,841.83	15,873,635.06

සටහන 13	**2024**	**2023**
	රු.ශත	රු.ශත
රණවිරු කොඩි අලෙවි ආදායම	8,324,827.50	4,396,111.00
	-	-
	8,324,827.50	4,396,111.00

සටහන 14	**2024**	**2023**
	රු.ශත	රු.ශත
පරිත්‍යාග	4,930,408.27	4,842,428.28
භාණ්ඩ පරිත්‍යාග	-	1,178,600.00
	4,930,408.27	6,021,028.28

සටහන 15		2024	2023
		රු.ශත	රු.ශත
වෙනත් ලැබීම්		412,541.82	105,296.49
		412,541.82	105,296.49

සටහන 16		2024	2023
		රු.ශත	රු.ශත
පුද්ගල පඩි නඩි			
වැටුප් හා වේතන	29	46,268,862.74	41,393,333.45
සේවක අර්ථසාධක අරමුදල්	30	5,419,687.51	4,940,828.29
සේවානියුක්තිකයින්ගේ භාර අරමුදල්	31	1,354,921.89	1,235,207.07
පාරිතෝෂික දීමනා	32	3,992,744.04	3,244,722.28
අතිකාල හා නිවාඩු දින දීමනා	33	514,324.77	869,725.38
වෙනත් දීමනා	34	488,983.88	1,039,000.00
		58,039,524.83	52,722,816.47

සටහන 17		2024	2023
		රු.ශත	රු.ශත
ගමන් වියදම්			
දේශීය	35	1,661,447.56	1,371,848.97
		1,661,447.56	1,371,848.97

සටහන 18		2024	2023
		රු.ශත	රු.ශත
සැපයීම්			
ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	36	2,731,183.76	2,403,571.62
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	37	7,190,417.06	7,241,868.33
සංග්‍රහ වියදම්	38	617,349.23	748,261.80
නිළ ඇඳුම්	39	1,692,100.00	726,871.50
		12,231,050.05	11,120,573.25

සටහන 19		2024	2023
		රු.ශත	රු.ශත
නඩත්තු වියදම්			
වාහන නඩත්තු වියදම්	40	3,451,709.98	5,637,678.02
යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ නඩත්තු	41	1,046,059.91	799,673.00
ගොඩනැගිලි නඩත්තු වියදම්	42	571,892.88	736,996.66
		5,069,662.77	7,174,347.68

සටහන 20		2024	2023
		රු.ශත	රු.ශත
ගිවිසුම්ගත සේවා			
ප්‍රවාහන (වාහන කුලී)	43	17,833.22	635,670.66
දුරකථන	44	1,155,495.57	1,242,081.42
තැපැල්	45	868,278.53	870,691.60
විදුලිය	46	4,449,701.12	4,680,591.81
ජලය	47	646,180.22	516,208.79
පුවත්පත්	48	8,180.00	20,240.00
ආදායම් බලපත්‍ර හා රක්ෂණ	49	345,393.25	400,972.07
සනීපාරක්ෂක සේවය	50	713,613.04	364,976.75
දෘඩාංග නඩත්තු	51	431,482.98	335,376.22
බදුකුලී හා පළාත් පාලන ආයතන බදු	52	331,531.20	338,256.48
මෙහෙයුම් කල්බදු කුලී ගෙවීම්	53	4,284,307.68	2,435,641.04
		13,251,996.82	11,840,706.84

සටහන 21		2024	2023
		රු.ශත	රු.ශත
වෙනත් පුනරාවර්ථන වියදම්			
විගණන ගාස්තු	54	665,095.20	674,157.60
කාර්යාල උපකරණ සේවා පහසුකම්	55	1,059,093.92	542,125.58
මුද්‍රණ හා ප්‍රචාරණ වියදම්	56	532,146.80	623,995.00
පරිවර්තන ගාස්තු	57	116,742.50	190,790.00
පුහුණු වියදම්	58	367,150.00	854,550.00
සුභසාධක වියදම්	59	480,830.00	418,706.00
වෙනත් සේවා වියදම්	60	34,805.00	59,040.00
නීති ගාස්තු	61	7,260.00	76,220.00
		3,263,123.42	3,439,584.18

සටහන 22		2024	2023
		රු.ශත	රු.ශත
ව්‍යාපෘති මෙහෙයුම් වියදම්			
ක්‍රියාත්විතයේදී ආබාධිතයට පත්ව සිටින සාමාජිකයින් පුනරුත්තාපනය කිරීම	62	43,544,072.59	17,082,963.94
නිවාස සැපයීම සහ එහිලා සහාය වීම	63	2,373,167.72	2,490,282.00
වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහය වීම	64	4,104,277.34	6,641,750.10
අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබාගැනීමට අවස්ථාව ලබාදීම	65	39,098,500.00	33,606,000.00
ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කිරීම	66	349,215.00	116,225.25
ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය නගා සිටුවීම	67	246,138,367.96	331,391,251.40
සෙනෙහස අධ්‍යාපන හා සම්පත් තොරතුරු කේන්ද්‍රය	68	5,865,627.98	4,763,000.00
		341,473,228.59	396,091,472.69

සටහන 23		2024	2023
		රු.ශත	රු.ශත
මූල්‍ය වියදම්			
23-1	අඩමාණ ණය ඌණ වෙන්කිරීම	-	51,019.55
23-2	රඳවා ගැනීමේ බදු	543,045.36	1,327,343.83
23-3	මූල්‍ය වියදම්	14,577.89	1,950.00
		557,623.25	1,380,313.38

සටහන 24	2024	2023
	රු.ශත	රු.ශත
ගැලපීම්		
පෙර වර්ෂයේ ගැලපීම්	4,389,342.62	(310,840.30)
	4,389,342.62	(310,840.30)

සටහන 25	2024	2023
	රු.ශත	රු.ශත
භාණ්ඩ පරිත්‍යාග කිරීම්	-	1,178,600.00
	-	**1,178,600.00**

සටහන 26	2024	2023
	රු.ශත	රු.ශත
බැංකු ශේෂය		
පොදු ගිණුම	24,315.72	153.43
අධ්‍යාපන ව්‍යාපෘති ගිණුම	1,000.00	1,000.00
සහන ණය ගිණුම	918,710.42	703,143.20
	944,026.14	704,296.63

සටහන 27	2024	2023
	රු.ශත	රු.ශත
ඉතිරි කිරීමේ ගිණුම් ශේෂ		
ඉතිරිකිරීමේ ගිණුම - 109010106429	242,608.60	101,081.72
ඉතිරිකිරීමේ ගිණුම - 100010885550	16,270.44	7,530,151.11
ඉතිරිකිරීමේ ගිණුම - 259200160007849(මහජන බැංකුව)	4,555.47	3,684,147.44
ඉතිරි කිරීමේ ගිණුම - 3135339 (සණස සංවර්ධන බැංකුව)	40,713.80	39,756.66
	304,148.31	11,355,136.93

සටහන 28		2024	2023
		රු.ශත	රු.ශත
කෙටිකාලීන ආයෝජන			
28-1	භාණ්ඩාගාර බිල්පත්	42,075,298.97	38,421,197.57
28-2	අරමුදල් කළමනාකරණ ගිණුම	30,277,821.59	14,834,733.72
28-3	**ස්ථාවර තැන්පතු**		
	ස්ථාවර තැන්පතු ගිණුම- 93928692 ලංකා බැංකුව	1,500,000.00	-
	7 day caller deposit -1399676 ලංකා බැංකුව	-	1,500,000.00
		73,853,120.56	54,755,931.29

සටහන 29	2024	2023
	රු.ශත	රු.ශත
වැටුප් හා වේතන	46,268,862.74	41,393,333.45
	46,268,862.74	41,393,333.45

සටහන 30	2024	2023
	රු.ශත	රු.ශත
සේවක අර්ථසාධක අරමුදල්	5,419,687.51	4,940,828.29
	5,419,687.51	4,940,828.29

සටහන 31	2024	2023
	රු.ශත	රු.ශත
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල්	1,354,921.89	1,235,207.07
	1,354,921.89	1,235,207.07

සටහන 32	2024	2023
	රු.ශත	රු.ශත
පාරිතෝෂික දීමනා	3,992,744.04	3,244,722.28
	3,992,744.04	3,244,722.28

සටහන 33	2024	2023
	රු.ශත	රු.ශත
අතිකාල දීමනා	514,324.77	869,725.38
	514,324.77	869,725.38

සටහන 34	2024	2023
	රු.ශත	රු.ශත
දීමනා		
උප සභාපති දීමනා	126,733.88	720,000.00
සභාපති දීමනා	85,000.00	-
කළමනාකරණ මණ්ඩල දීමනා	174,000.00	216,000.00
විගණන කමිටු දීමනා	72,000.00	98,500.00
වෙනත් දීමනා	31,250.00	4,500.00
	488,983.88	1,039,000.00

සටහන 35	2024	2023
	රු.ශත	රු.ශත
ගමන් වියදම්		
දේශීය ගමන් වියදම්	1,661,447.56	1,371,848.97
	1,661,447.56	1,371,848.97

සටහන 36	2024	2023
	රු.ශත	රු.ශත
ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ	2,731,183.76	2,403,571.62
	2,731,183.76	2,403,571.62

සටහන 37	2024	2023
	රු.ශත	රු.ශත
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	7,190,417.06	7,241,868.33
	7,190,417.06	7,241,868.33

සටහන 38	2024	2023
	රු.ශත	රු.ශත
සංග්‍රහ වියදම්	617,349.23	748,261.80
	617,349.23	748,261.80

සටහන 39	2024	2023
	රු.ශත	රු.ශත
නිළ ඇඳුම්	1,692,100.00	726,871.50
	1,692,100.00	726,871.50

සටහන 40

	2024	2023
	රු.ශත	රු.ශත
වාහන නඩත්තු වියදම්	3,451,709.98	5,637,678.02
	3,451,709.98	5,637,678.02

සටහන 41

	2024	2023
	රු.ශත	රු.ශත
යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ නඩත්තු වියදම්	1,046,059.91	799,673.00
	1,046,059.91	799,673.00

සටහන 42

	2024	2023
	රු.ශත	රු.ශත
ගොඩනැගිලි නඩත්තු වියදම්	571,892.88	736,996.66
	571,892.88	736,996.66

සටහන 43

	2024	2023
	රු.ශත	රු.ශත
ප්‍රවාහන (වාහන කුලී)	17,833.22	635,670.66
	17,833.22	635,670.66

සටහන 44

	2024	2023
	රු.ශත	රු.ශත
දුරකථන ගාස්තු	1,155,495.57	1,242,081.42
	1,155,495.57	1,242,081.42

සටහන 45

	2024	2023
	රු.ශත	රු.ශත
තැපැල් ගාස්තු	868,278.53	870,691.60
	868,278.53	870,691.60

සටහන 46

	2024	2023
	රු.ශත	රු.ශත
විදුලිය	4,449,701.12	4,680,591.81
	4,449,701.12	4,680,591.81

සටහන 47

	2024	2023
	රු.ශත	රු.ශත
ජලය	646,180.22	516,208.79
	646,180.22	516,208.79

සටහන 48

	2024	2023
	රු.ශත	රු.ශත
පුවත්පත්	8,180.00	20,240.00
	8,180.00	20,240.00

ඝටනය 49	2024	2023
	රු.ශත	රු.ශත
ආදායම් බලපත්‍ර හා රක්ෂණ	345,393.25	400,972.07
	345,393.25	400,972.07

ඝටනය 50	2024	2023
	රු.ශත	රු.ශත
සනීපාරක්ෂන සේවය	713,613.04	364,976.75
	713,613.04	364,976.75

ඝටනය 51	2024	2023
	රු.ශත	රු.ශත
දෘඩාංග නඩත්තු	431,482.98	335,376.22
	431,482.98	335,376.22

ඝටනය 52	2024	2023
	රු.ශත	රු.ශත
බදුකුලී හා පළාත් පාලන ආයතන බදු	331,531.20	338,256.48
	331,531.20	338,256.48

ඝටනය 53	2024	2023
	රු.ශත	රු.ශත
මෙහෙයුම් කල්බදු කුලී ගෙවීම්	4,284,307.68	2,435,641.04
	4,284,307.68	2,435,641.04

ඝටනය 54	2024	2023
	රු.ශත	රු.ශත
වීගණන ගාස්තු	665,095.20	674,157.60
	665,095.20	674,157.60

ඝටනය 55	2024	2023
	රු.ශත	රු.ශත
කාර්යාල උපකරණ සේවා පහසුකම්	1,059,093.92	542,125.58
	1,059,093.92	542,125.58

ඝටනය 56	2024	2023
	රු.ශත	රු.ශත
මුද්‍රණ හා ප්‍රචාරණ වියදම්	532,146.80	623,995.00
	532,146.80	623,995.00

ඝටනය 57	2024	2023
	රු.ශත	රු.ශත
පරිවර්ථන ගාස්තු	116,742.50	190,790.00
	116,742.50	190,790.00

සටහන 58	2024	2023
	රු.ශත	රු.ශත
පුහුණු වියදම්	367,150.00	854,550.00
	367,150.00	854,550.00

සටහන 59	2024	2023
	රු.ශත	රු.ශත
සුභසාධක වියදම්	480,830.00	418,706.00
	480,830.00	418,706.00

සටහන 60	2024	2023
	රු.ශත	රු.ශත
වෙනත් සේවා වියදම්	34,805.00	59,040.00
	34,805.00	59,040.00

සටහන 61	2024	2023
	රු.ශත	රු.ශත
නීති ගාස්තු	7,260.00	76,220.00
	7,260.00	76,220.00

සටහන 62	2024	2023
	රු.ශත	රු.ශත
ක්‍රියාන්විතයේදී ආබාධිත තත්වයට පත්ව සිටින සාමාජිකයින් පුනරුත්ථාපනය කිරීම		
ආබාධිත රණවිරුවන් සඳහා උපකරණ ලබාදීම	32,198,682.59	7,092,633.94
සනීපාරක්ෂක පහසුකම් සලසාදීම	10,771,000.00	9,990,330.00
ක්‍රීඩා සංවර්ධන වැඩසටහන්	574,390.00	690,480.00
	43,544,072.59	17,082,963.94

සටහන 63	2022	2022
	රු.ශත	රු.ශත
නිවාස සැපයීම සහ එහි ලා සහයවීම		
රණවිරු ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනය	145,000.00	494,162.00
හදිසි ආපදා ආධාර	2,228,167.72	1,996,120.00
	2,373,167.72	2,490,282.00

සටහන 64	2024	2023
	රු.ශත	රු.ශත
වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහයවීම		
වෛද්‍ය ආධාර	4,104,277.34	6,641,750.10
	4,104,277.34	6,641,750.10

සටහන 65	2024	2023
	රු.ශත	රු.ශත
අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව ලබාදීම		
මාපිය කැපකරු ශිෂ්‍යත්ව	2,705,000.00	2,746,500.00
ශිෂ්‍යාධාර ලබාදීම්	36,393,500.00	30,859,500.00
	39,098,500.00	33,606,000.00

ඝටනය 66

ඵලදායී සේවා නියුක්තියක් සුරක්ෂිත කරලීම		
වාණිජ ව්‍යාවසාය සංවර්ධනය	349,215.00	116,225.25
	349,215.00	116,225.25

ඝටනය 67

	2024	2023
	රු.ශත	රු.ශත
ප්‍රතිලාභීන්ගේ ජීවන තත්වය නඟා සිටුවීම		
මාසිය රැකවරණ දීමනා	227,507,433.34	306,860,279.61
මාසිය සුරැකුම්	11,037,000.00	14,304,750.00
රණවිරු ප්‍රජා සංවර්ධන වැඩසටහන	3,244,751.16	1,916,423.39
රණවිරු දිනය වියදම්	3,795,926.38	3,841,555.51
මයිලපිටිය උද්‍යාන නඩත්තු	514,447.08	353,538.26
වාණිජ ව්‍යාවසාය සංවර්ධනය	-	116,225.25
ස්මාරක නඩත්තු	38,810.00	99,550.00
	246,138,367.96	331,391,251.40

ඝටනය 68

	2024	2023
	රු.ශත	රු.ශත
සෙනෙහස අධ්‍යාපන හා සමීපත් තොරතුරු කේන්ද්‍රය	5,865,627.98	4,763,000.00
	5,865,627.98	4,763,000.00

සටහන 69

රණවිරු සේවා අධිකාරිය
2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඇස්තමේන්තු හා සත්‍ය අගයන් අතර සංසංදනාත්මක ප්‍රකාශය

		2024 මුල් ඇස්තමේන්තුව	2024 සංශෝධිත අවසන් ඇස්තමේන්තුව	2024 සත්‍ය අගයන්	වෙනස(අවසන් ඇස්තමේන්තුව හා සත්‍ය අගයන්)
		රු: ශත	රු: ශත	රු: ශත	රු: ශත
ආදායම්					
රජයේ දායකය (පුනරාවර්ථන)		449,164,000.00	405,536,000.00	317,371,864.44	(88,164,135.56)
සුසිරි වාසනා ලොතරැයි ආදායම්		267,600,000.00	267,600,000.00	244,035,752.00	(23,564,248.00)
පොළී ආදායම්		25,080,000.00	25,080,000.00	33,477,056.91	8,397,056.91
සේවක ණය පොළී ආදායම්		500,000.00	500,000.00	431,295.23	(68,704.77)
සේවා ගාස්තු		13,830,000.00	13,830,000.00	18,563,841.83	4,733,841.83
රණවිරු කොඩි අලෙවි ආදායම්		12,000,000.00	12,000,000.00	8,324,827.50	(3,675,172.50)
පරිත්‍යාග		4,175,000.00	4,175,000.00	4,930,408.27	755,408.27
වෙනත් ලැබීම්		-	-	412,541.82	412,541.82
මුළු ආදායම්	01	**772,349,000.00**	**728,721,000.00**	**627,547,587.99**	**(101,173,412.01)**
වියදම්					
පුද්ගල පඩි නඩි		60,329,000.00	61,625,000.00	58,039,524.83	3,585,475.17
ගමන් වියදම්		3,207,000.00	3,207,000.00	1,661,447.56	1,545,552.44
සැපයීම්		14,325,000.00	14,725,000.00	12,231,050.05	2,493,949.95
නඩත්තු වියදම්		11,210,000.00	12,210,000.00	5,069,662.77	7,140,337.23
ගිවිසුම්ගත සේවා		17,320,000.00	17,320,000.00	13,251,996.82	4,068,003.18
වෙනත් පුනරාවර්ථන වියදම්		7,133,000.00	8,033,000.00	3,263,123.42	4,769,876.58
ව්‍යාපෘති මෙහෙයුම් වියදම්		490,088,000.00	451,892,000.00	341,473,228.59	110,418,771.41
ක්ෂය කිරීම්				14,887,619.58	(14,887,619.58)
මූල්‍ය වියදම්				557,623.25	(557,623.25)
වත්කම් ඉවත්කිරීමේ අලාභ				118,203.30	
මුළු වියදම්	02	**603,612,000.00**	**569,012,000.00**	**450,553,480.17**	**118,576,723.13**
කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌනතාවය) (01-02)		**168,737,000.00**	**159,709,000.00**	**176,994,107.82**	**(219,750,135.14)**

විගණකාධිපති වාර්තාව

2024

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩී.ඊ.එන්/ඩී/ආර්එස්ඒ/එන්ඒ/2024 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2025 ජූලි 18 දින

සභාපති
රණවිරු සේවා අධිකාරිය

රණවිරු සේවා අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රණවිරු සේවා අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 30 ඡේදය ප්‍රකාරව වක්‍ර ක්‍රමය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී, මූල්‍ය නොවන වෙනස් වීම් මෙහෙයුම් අතිරික්තයට/ (ඌණතාවයට) ගැළපීම් කළ යුතු වුවත්, අධිකාරිය විසින් රු. 412,533 ක අඩමාණ ණය වෙන් කිරීම් හා රු.118,203 ක් වූ වත්කම් ඉවත් කිරීමේ අලාභ කාරක ප්‍රාග්ධනය වෙනස් වීම් යටතේ ගැළපීම් කර නිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මාපිය රැකවරණ වියදම් ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ රු.316,091,613 ක රජයේ දායකය, මූල්‍ය ප්‍රකාශන තුල රු. 317,371,864 ක් ලෙස දැක්වීම නිසා අධිකාරියේ ආදායම හා මාපිය රැකවරණ වියදම රු. 1,280,251 කින් අධිගණනය වී තිබුණි.

(ඇ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ව්‍යාපෘති මෙහෙයුම් වියදම් යටතේ, සෙනෙහස අධ්‍යාපන හා සම්පත් තොරතුරු කේන්ද්‍රය සඳහා රු. 5,865,627 ක් වැය කර තිබුණද, එම වියදම සනාථ කර ගැනීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූයෙන් අදාළ වියදමෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවීය.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂයේ ආරම්භක සහ අවසාන ලැබිය යුතු පොළී ආදායම් ශේෂ අතර වෙනස වූ රු.10,287,224 ක අඩුවීම් කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් යටතේ අඩුවීමක් ලෙස ගැලපිය යුතු වුවත්, වැඩි වීමක් ලෙස ගලපා තිබුණු අතර, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදලින් ලැබුණු පොළී ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ප්‍රවර්ථන වර්ෂයේ ලොතරැයි ආදායම රු.244,035,752 ක් ලෙස හඳුනාගෙන ඇති අතර ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එම ආදායම භාණ්ඩාගාරය හරහා අධිකාරියට ප්‍රේෂණය කිරීම කරනු ලබයි. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඉහත ලොතරැයි ආදායමෙන් රු. 57,760,500ක මුදලක් පමණක් ප්‍රවර්ථන වර්ෂය සඳහා අධිකාරියට ප්‍රේෂණය කර තිබිය දී, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලබා නොගෙන ඉහත සමස්ථ ආදායම අධිකාරියේ ආදායම් ලෙස හඳුනා ගැනීම නිසා වර්ෂයේ අතිරික්තය රු. 186,475,252 කින් අධිගණනය වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති යොමුව	අනුකූල නොවීම
(අ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතෙහි (Operational Manual) 6.6 වගන්තිය	මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 55 ක් ප්‍රමාද වී 2025 අප්‍රේල් 25 දින ඉදිරිපත් කරන ලදී.
(ආ)	2018 දෙසැම්බර් 31 දිනැති, අංක 04/2018 දරණ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලීය මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශය	සෑම වර්ෂ 5 කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කර, ප්‍රත්‍යාගණන වටිනාකම් ගිණුම්ගත කල යුතු වුවද, 2018 වර්ෂයෙන් පසු අධිකාරියට අයත් ඉඩම් අක්කර 3 යි රූඩ් 1 යි පර්චස් 32ක් හා ගොඩනැගිලි තුනක් තක්සේරු කර නොතිබුණි.
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
	(i) 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 අංක දරණ චක්‍රලේඛයේ 3.1 ඡේදය	අධිකාරිය සතු වාහන 8 ක ඉන්ධන දහන පරීක්ෂාව මාස 14 ක කාල ප්‍රමාදයක් සහිතව 2025 වර්ෂයේ කර තිබුණු අතර , 2023 වර්ෂයේ ඉන්ධන දහන පරීක්ෂණ වාර්තා පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේ ඉන්ධන තුලනය කර තිබුණි.
	(ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ චක්‍රලේඛයේ	
	- 04 ඡේදය	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.
	- 6.1 ඡේදය	සමාලෝචිත වර්ෂයේ දී සේවකයන් 30 දෙනෙකුට කිසිදු පුහුණුවක් ලබා දී නොතිබුණු අතර සේවක පුහුණුව සඳහා රු.1,500,000ක ප්‍රතිපාදන සලසා තිබුණද රු.367,150ක් පමණක් වැයකර ඇති බැවින් වර්ෂය අවසානයට රු. 1,132,850ක් හෙවත් සියයට 75.5 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරිව තිබුණි.

(ඇ)	2022 ඔක්තෝම්බර් 22 දිනැති 07/2022 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ	
	(i) 2.2 ඡේදය	2016 වර්ෂයට පසු වර්ෂවල නිෂ්පාදිත ඉතා හොඳ ධාවන තත්ත්වයේ වාහනයක් මෙහෙයුම් කල් බදු පදනම යටතේ ලබාගත යුතු වුවත් අධිකාරිය විසින් මසකට රු.295,000 ක් සහ කිලෝ මීටර 3000 ඉක්මවන සෑම කිලෝ මීටරයක් සඳහා රු.125 ක් ගෙවීමේ පදනම මත 2015 වර්ෂයේ ලියාපදිංචි කළ අංක WPNC 3497 දරණ වෑන් රථය මෙහෙයුම් කල් බදු පදනම යටතේ ලබා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මේ සඳහා රු 4,284,308 ක කල්බදු මුදලක් ගෙවා තිබුණි.
	(ii) 2.5 ඡේදය	ඉහත වෑන් රථය ධාවනය කළ මුළු කිලෝමීටර් ගණන 35,288 ක් වන අතර, මේ සඳහා ගෙවා තිබූ කල්බදු මුදල රු. 7,915,492ක් විය. එම වටිනාකම තුළ මාසිකව කිලෝ මීටර් 3,000 ට අඩුවෙන් ධාවනය කළ මාස 20 ක් පැවතුණි.
(ඉ)	2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ	
	(i) 2.14.1 වගන්තිය	මිල ගණන් තුනකට අඩුවෙන් ලබා ගෙන, අවස්ථා 09 කදී එකතුව රු.8,642,015 ක ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.
	(ii) 8.9.3 වගන්තිය	අවස්ථා 05 ක දී එකතුව රු.23,796,976 ක ප්‍රසම්පාදනයන් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් ඇතිකර ගැනීමෙන් තොරව සිදු කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) අවස්ථා 15 සිදු කරන ලද එකතුව රු.25,116,030 ක ප්‍රසම්පාදනයන් වලදී සැපයුම්කරු වෙත නිකුත් කළ භාණ්ඩ ඇණවුමෙහි භාණ්ඩ සැපයිය යුතු නිශ්චිත දිනයක් සඳහන් කර නොතිබූ බැවින් ඉහත අවස්ථා 15 වෙනුවෙන් භාණ්ඩ ඇණවුම් කළ දින සිට දින 01 ත් 81 ත් දක්වා කාල ප්‍රමාදයක් සහිතව භාණ්ඩ භාර දී තිබුණි.

(ආ) විදයුත් යතුරුපැදි 50 ක් මිලදීගැනීමේදී, ආඛාධිත සහයක උපකරණ මිලදී ගැනීමේදි සහ 2023 වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීමේදී පිළිවෙලින් දින 49 ක්, දින 79 ක් සහ දින 81 ක් ප්‍රමාද වී සැපයුම් ලබා දී තිබුණු අතර අය කර ගත යුතු එකතුව රු. 1,705,946 ක ප්‍රමාද ගාස්තු අය කර නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2017 වර්ෂයේ සිදුව තිබූ රු. 4,978,500 ක මුල්‍ය වංචාවෙන් වූ අලාභය ඊට වගකිව යුතු පාර්ශව වෙතින් 2025 ජූලි 11 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) 2011 සිට 2017 වර්ෂය දක්වා අධිකාරිය ලබා දී තිබූ අත්තිකාරම් ආපසු නොගෙවීම, මාපිය රැකවරණ මුදල් ගෙවීමේ අක්‍රමිකතාවය හා ඉවත්ව ගිය සේවිකාවකගෙන් අය විය යුතු ශේෂයන්ගේ එකතුව රු. 7,339,410 ක් විය. එම මුදල තුළ ඇතුලත් රු. 1,830,450 ක අත්තිකාරම් මුදල, අදාල නිලධාරින් විසින් 2023 වර්ෂයේදි ආපසු ගෙවීමට එකඟ වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඇ) 2001 වර්ෂයේදී අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලද තක්සේරු වටිනාකම රු. මිලියන 1.5 ක් වූ අක්කර 01 රූඩ් 01 පර්චස් 29 ක කුඹුර, වී වගා කටයුතු සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට 2023 නොවැම්බර් 15 දින කළමණාකරන මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණ ද අදාළ පැවරීමේ කටයුතු සිදු නොවීම නිසා කුඹුර උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2009 වර්ෂයේ දී අධිකාරිය වෙත පරිත්‍යාග ලෙස ලද තක්සේරු වටිනාකම රු. 26,703,250 ක් වූ යාකබැද්දෙහි පිහිටි අක්කර 01 රූඩ් 03 පර්චස් 22 ක ඉඩම හා ගොඩනැගිල්ල 2024 ජුනි 26 දින කළමනාකරණ මණ්ඩල තීරණයක් මගින් අධිකාරියේ ව්‍යාපෘතියක් වන "සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍රයේ - දක්ෂිණ පක්ෂාංගය" පිහිටුවීමට තීරණය කර තිබුණ ද, අදාළ තීරණය ක්‍රියාත්මක නොවීම මත ඉඩම හා ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) ඡා-ඇල විරුසල රණවිරු එකමුතුව සඳහා කවුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි 'විරුසල' නමින් අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනාගාර වෙළඳ කුටියක් පවත්වා ගෙන යාමට විවිධ වූ මූල්‍ය හා මූල්‍ය නොවන කොන්දේසි සඳහා අදාල ගුවන් සේවා සමාගම සමග අධිකාරිය ලිඛිත එකඟතාවයට පැමිණ තිබුණි. එහෙත් අධිකාරිය හා විරුසල රණවිරු එකමුතුව අදාල කරුණු සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එලඹ නොතිබුණි.

(ඊ) අධිකාරියෙහි බඳවා ගැනීමේ පරිපාටිය 2013 අගෝස්තු 19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමතකර තිබුණු නමුත් එම බඳවා ගැනීම් පරිපාටියෙහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරියෙහි සේවය කරනු ලබන කළමනාකරණ සහකාර සේවා නිලධාරීන් දෙදෙනෙකු සහ රියදුරන් තිදෙනෙකු වසර 10 කට අධික කාල ප්‍රමාදයකින් පසුව 2023 අගෝස්තු 28 දිනැති ලිපිය මගින් අදාල තනතුරුවලට අන්තර්ග්‍රහනය කර තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් ඇතැම් නිලධාරීන්ට අධිකාරිය විසින් පවත්වන ලද කාර්යක්ෂමතා ක්ඩයිම් විභාග සඳහා නියමිත දිනට පෙනී සිටීමේ අවස්ථාව අහිමිවී තිබුණි.

(උ) අධිකාරිය පිහිටුවා වසර 25 කට අධික කාලයක් ගතවුවද අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා විනය පරිපාටියක් පිළියෙල කර නොතිබුණි.

(ඌ) අධිකාරිය විසින් ගෙවනු ලබන ශිෂ්‍යාධාර වලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබීමට නම් ඒවා අදාල කාලච්ඡේදය තුල එම දරුවන් වෙත ලබා දිය යුතු වුවත්, දරුවන් 2,294 ක් වෙනුවෙන් 2024 වර්ෂයට අදාලව රු. 7,684,000 ක් වටිනා ශිෂ්‍යාධාර වර්ෂය අවසන් වන තෙක් ගෙවා නොතිබුණි.

(ඔ) ආයතනයේ සංවිධාන ව්‍යුහය තුල ඇතුලත් නොවූ සහාපති ලේකම් නම් තනතුරක් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව ඇති කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ එම තනතුර හිමි නිලධාරියාට වැටුප් හා දීමනා ගෙවීම් කර නොතිබූ අතර අධිකාරිය සතු සංචිත වාහන වලින් නිවස සහ සේවා ස්ථානය අතර ප්‍රවාහන පහසුකම් සපයා දීම සඳහා ඉන්ධන වෙනුවෙන් රු.318,294 ක් වැය කර තිබුණි.

(ඕ) අධිකාරිය විසින් රණවිරුවන් වෙත ආපසු ගෙවීම් අවුරුදු 03, 04 හා 05 යන කාලයන් සඳහා ලබා දී තිබුණු ණය මුදල් වලින් 2024 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු ණය ශේෂය වූ රු.295,507,153ක් වූ අතර එම ණය ශේෂය තුළ ණය අයකර ගැනීමේ කාලය ඉක්මවා තිබුණු ණය මුදල් ශේෂ වල එකතුව රු.453,612 ක් විය.

ජී.ඒ.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)



රණවිරු සේවා අධිකාරිය
අංක 449, ගාල්ල පාර, කොළඹ 03.

ரணவிரு சேவா அதிகாரசபை
449, காலி வீதி, கொழும்பு 03.

Ranaviru Seva Authority
No 449, Galle Road, Colombo 03.

දුරකථන தொலைப்பேசி **Telephone**
011 2055673 / 76

ෆැක්ස් தொலைநகல் Fax
011 2055671

වෙබ් இணையதைத்தளம் **Web**
www.ranaviruseva.gov.lk

විද්‍යුත් තැපෑල மின்னஞ்சல் **E- Mail**
ranaviruseva@gmail.com